# දෙසතිය

පුවත් සඟරාව

2025 මැයි

## මාධ්‍ය නිදහසේ

# ඩිජිටල් භූමිකාව



# ඔබ කවුද?

"වැදගත් වන්නේ ඔබ සතු දේ නොවේ. ඔබ කවුද? යන්න සහ ඔබ අන් අය වෙනුවෙන් කරන දේ කුමක්ද යන්නයි."

එසේ දෙසූ උන්වහන්සේ සරල ව ජීවත් වීම යනු වෙනස් ආකාරයකින් රජ කිරීම බව විශ්වාස කළ, ඇඳහිල්ල සමග පමණක් දැඩි ව බැඳී ජීවත් වූ මිනිසෙක්.


ශුද්ධෝත්තම පළමු වැනි ප්‍රැන්සිස් පාප් වහන්සේ පාස්කු ඉරිදා දේව මෙහෙයට පැමිණි බැතිමතුන්ට ද ආශීර්වාද කොට සිය නිවහනට වැඩම කර සඳුදා උදෑසනයි, ස්වර්ගස්ථ වූයේ.

උන්වහන්සේගේ ඉල්ලීම පරිදි දේහය වතිකානයේ ශාන්ත පීතර බැසිලිකා දේවස්ථානයේ තැන්පත් නොකර රෝමයේ ශාන්ත මේරි බැසිලිකා දේවස්ථානයේ තැන්පත් කරවීමෙන් සිදු වූයේ පාප් වහන්සේ නමකගේ අවසන් කටයුතු කිරීම සම්බන්ධයෙන් මෙතෙක් පැවැති සාම්ප්‍රදාය බිඳීමක්. එය විශේෂත්වයක්.

**කටු**







# දෙසතිය

පුවත් සඟරාව

වෙළුම 47, කලාපය 05,
2025 මැයි



**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කරණ මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759



උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**

47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව






17



12
**තීරුබද්දේ සද්දේ**



03
**මිත්‍රත්වයේ සුරක්ෂාව**




34
**මාධ්‍යකරුවා සිනෙ ඇසින්**



10
**ලොවක උතුමන් කලණ මිතුරන්**



40
**යොවුන් ක්‍රීඩා ශූරයෝ**

# මගහැරුණු මැතිවරණයක් අත ළඟ

2025 අංක 01 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කරමින් 17 වැනි පළාත් පාලන ඡන්ද විමසීම මැයි මස 06 දින පැවැත්වීමට නියමිත ව තිබෙනවා. ඒ, පළාත් පාලන ආයතන 339ක් සඳහා සභිකයන් 8,287ක් තෝරා පත්කර ගැනීමට. ඒ අනුව ඡන්ද විමසීම දිවයින පුරා මධ්‍යස්ථාන 13,759ක සිදු කෙරෙනු ඇති. මේ සඳහා දේශපාලන පක්ෂ 49ක්, ස්වවාධීන කණ්ඩායම් 257ක් නියෝජනය කරමින් අපේක්ෂකයන් 75,589ක් තරග වදිනවා.

මෙවර මැතිවරණයෙන් මහ නගර සභා 28ක්, නගර සභා 36ක්, ප්‍රාදේශීය සභා 275ක් සඳහා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, නියෝජ්‍ය සභාපති ඇතුළු සභිකයන් තෝරා පත් කර ගැනීමට නියමිත ව තිබෙනවා.

මැතිවරණ කොමිසම සඳහන් කරන ආකාරයට මෙවර පළාත් පාලන මැතිවරණයේදී ඡන්දය භාවිත කිරීමට සුදුසුකම් ලබා ඇති ඡන්ද දායකයන් සංඛ්‍යාව 17,156,338ක්.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම අවසන් වරට පවත්වා ඇත්තේ 2018 වසරේදී. වසර 4කට වරක් එය පැවැත්වෙන බැවින් පළාත් පාලන ආයතනවල ධුර කාලය අවසන් වීමට නියමිත ව තිබුණේ 2022 වසරේදී. එහෙත් ඒ වන විට රට මුහුණදෙමින් තිබූ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම එම වසරේ පැවැත්වීම අසීරු වූ බැවින් පළාත් පාලන ආයතනවල නිල කාලය තවත් වසරක් සඳහා 2023 මාර්තු 19 තෙක් දීර්ඝ කෙරුණා. ඒ අනුව 2023 ජනවාරි 30 දින නිවේදනය කෙරුණේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම මාර්තු 9 වන දින පවත්වන බවට. එහෙත් එය නැවතත් 2023 අප්‍රේල් 25 දිනට කල් දැමුණ ද මතු වූ ගැටලු හේතුවෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම දින නියමයක් නොමැති ව කල් ගියේ ඒ පිළිබඳ මතවාදාත්මක කතාබහකට ඉඩ විවර වෙමින්.

2024 වසරේ ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමෙන් පසු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම මෙසේ පැවැත්වෙන්නේ දිගින් දිගට ම එය කල් දැමුණු පසුබිමක. එය ජනතා පරමාධිපත්‍ය බලය කිසියම්දුරකට නොසලකා හැරීමක් ලෙසයි ඇතැම් පිරිස් අවධාරණය කර තිබුණේ. පොදු ජනතාව සෘජු ව සම්බන්ධ වන දේශපාලන ආයතනය වන්නේ පළාත් පාලන ආයතනය වන නිසා ජනතාවට සක්‍රීය ව ප්‍රාදේශීය පරිපාලනයට බලපෑම් කිරීමට හැකියාව තිබෙනවා. විශේෂයෙන් පරිපාලන හා නියාමන සේවා, මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාව ප්‍රවර්ධනය, පාරිසරික ආරක්ෂාව, පොදු මංමාවත් සහ පොදු සැපයුම්සේවා පවත්වාගෙන යාම පළාත් පාලන ආයතනවල කාර්යභාරයට අයත්. නිසි කලට එම ආයතන සක්‍රිය නොවුණහොත් බිඳ වැටෙන්නේ ජනතා අභිලාෂ. එමෙන් ම රටේ ඉහළ දේශපාලන ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාමේදී බාධා මතු වන්නේ ප්‍රාදේශීය සංවර්ධන අරමුණු සෘජු ව ම එම දේශපාලන ස්ථරය සමග බැඳී පවතින නිසා.

එබැවින් රටේ සමස්ත දේශපාලන ස්ථාවරභාවය තහවුරු වීමට නම් ජනතා පරමාධිපත්‍ය බලයේ පිළිබිඹුව යථාවත් ලෙස එහි නිරූපණය විය යුතුයි. සමස්ත මැතිවරණ ක්‍රියාවලිය තුළ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වැදගත් වන්නේ එම නිසා.

- සංස්කාරක -


**දෙසතිය** පුවත් සඟරාව

**දෙසතිය** සඟරා දායකත්වය

වාර්ෂික දායකත්වය රු. 1500.00

අර්ධ වාර්ෂික දායකත්වය රු. 750.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරපත හා සඟරා දායකත්ව කූපන්පත 071-9303111 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

**දෙසතිය**

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..........

Address ..........

..........

..........

..........

ID Number .......... Tel / Mobile ..........

Signature .......... Date..........



# මිත්‍රත්වයේ සුරක්ෂාව

දීප්ත කුමාර බටගොඩ

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පවතින්නේ දිගුකාලීන මිත්‍රශීලී සබඳතාවක්. එය ආර්ථික, සාමාජ, සාංස්කෘතික හා දේශපාලන කාරණා විෂයෙහි ප්‍රමුඛ වන අතර දෙරටේ සමානතා හා විශේෂතාහි අන්‍යෝන්‍ය බැඳියාව මත තහවුරු වී තිබෙනවා. දෙරටේ භූගෝලීය පිහිටීම ද ඒ සඳහා ඉතා වැදගත්. ශ්‍රී ලංකාව හා ඉන්දියාව වෙන් වන්නේ පෝක් සමුද්‍ර සන්ධිය නමැති කුඩා වෙරළ තීරයෙන්. දෙරට ම භූගෝලීය වශයෙන් දකුණු ආසියාවේ වැදගත් ස්ථානවල පිහිටීම නිසා ඉන්දියන් සාගරයේ පොදු ආරක්ෂක ආවරණයක් (Common Security Umbrella) නිර්මාණය කිරීමට දෙරටේ ම අවධානය යොමු ව තිබෙනවා. සංවර්ධන ක්‍රියාවලියේදී ද අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගයෙන් යුතු ව ක්‍රියා කිරීමයි දෙරටේ ම අපේක්ෂාව. විශේෂයෙන් ඉන්දියාව ලෝකයේ නැගී එන එක් ආර්ථික ප්‍රබලයෙක්. දකුණු ආසියාවේ විශාලතම ආර්ථිකයට ද ඔවුන් හිමිකම් කියනවා. මේ නිසා ශ්‍රී ලංකාව වැනි රටකට ඉන්දියාවේ මිත්‍රත්වය පවත්වා ගැනීම වැදගත් වනු ඇති බවයි බොහෝ විචාරකයන්ගේ අදහස.

ඉන්දීය අග්‍රාමාත්‍යවරයා මෙවර ශ්‍රී ලංකා සංචාරයේ නිරත වූයේ, 'පළමු ව අසල්වැසියා' සහ ඉන්දු-පැසිෆික් කලාපයේ දැක්ම කෙරෙහි ඇති සිය කැපවීම නැවත තහවුරු කරන ඉන්දියාවේ 'Act East' සහ 'මහාසාගර්' යන ප්‍රතිපත්තිවලට අනුකූල ව. මෙය ඔහුගේ සිව් වැනි ශ්‍රී ලංකා සංචාරය. ඉන්දීය අග්‍රාමාත්‍යවරයා පළමු වරට ශ්‍රී ලංකාවේ සංචාරය කර තිබුණේ 2008 වසරේදී. ඉන්පසුව 2017 සහ 2019 යන වර්ෂවලදී ඔහු ශ්‍රී ලංකාවේ සංචාරය කළා. 2015 වර්ෂයේ සිදු කළ ශ්‍රී ලංකා සංචාරයේදී ඉන්දීය අග්‍රාමාත්‍යවරයා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය කිරීම විශේෂත්වයක්.



ඉන්දීය අග්‍රාමාත්‍යවරයා පිළිගනිමින්

විශේෂයෙන් ඉන්දියාව ලෝකයේ නැගී එන එක් ආර්ථික ප්‍රබලයෙක්. දකුණු ආසියාවේ විශාලතම ආර්ථිකයට ද ඔවුන් හිමිකම් කියනවා. මේ නිසා ශ්‍රී ලංකාව වැනි රටකට ඉන්දියාවේ මිත්‍රත්වය පවත්වා ගැනීම වැදගත්.

අනුර කුමාර දිසානායක ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු ඔහුගේ පළමු නිල සංචාරය සිදු වූයේ ඉන්දියාවට. එහිදී ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ඉන්දියානු අගමැති නරේන්ද්‍ර මෝදිට ශ්‍රී ලංකාවේ සංචාරයකට ආරාධනා කර තිබුණා. ඒ අනුවයි ඉන්දීය අගමැතිවරයා 2025 අප්‍රේල් මස 04 දින ශ්‍රී ලංකාවේ සංචාරයකට පැමිණියේ. ඉන්දීය විදේශ අමාත්‍ය ජයශංකර්, ජාතික ආරක්ෂක උපදේශක අජිත් දුවාල් හා ලේකම් වික්‍රම් මිශ්‍රී ඇතුළු කණ්ඩායමක් අග්‍රාමාත්‍යවරයා සමග මේ සංචාරයට එක් වුණා. අප්‍රේල් මස 06 දින තෙක් කළ එම සංචාරයේදී ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුම් 07ක් අත්සන් කෙරුණා. දෙරට අතර සංචාරක ක්ෂේත්‍රය, ඩිජිටල්කරණය, දේශපාලන සබඳතා, බලශක්තිය, කෘෂිකර්මාන්තය, ශ්‍රී ලංකාවේ ඉන්දියානු ආයෝජන, ප්‍රවාහනය ආදී ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් එහිදී සාකච්ඡා කෙරුණා. ඉන්දීය අගමැතිවරයා නිල

උත්සව කිහිපයකට සහභාගි වීමත් විවෘත කිරීම් කිහිපයක් සිදු කිරීමත් ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳ පුදා ගැනීමත් ශ්‍රී ලාංකික ජනතාවගේ දැඩි ආදර ප්‍රසාදයට හේතු වූ සිදුවීම් අතර කැපී පෙනුණා.

මේ සංචාරයේදී ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි කොළඹ සිට සාම්පූර් සූර්ය විදුලි බලාගාරය ඇතුළු ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කිරීම සංකේතාත්මක ව සිදු කළා. සාම්පූර්හි ඉදිකෙරෙන සූර්ය විදුලි බලාගාරයේ ඉදිකිරීම් සංකේතාත්මක ව ආරම්භ කළ අතර එය සාම්පූර්හි අක්කර 500ක් පුරා පැතිරෙන මෙගාවොට් 50ක විදුලි බලය නිෂ්පාදනය කෙරෙන ව්‍යාපෘතියක්. දඹුල්ල උෂ්ණත්ව පාලිත 'ප්‍රභාෂ්වර' කෘෂිකර්ම ගබඩාව විවෘත කිරීම ද නරේන්ද්‍ර මෝදි අගමැතිවරයා විසින් සිදු කරනු ලැබූ අතර එය පශ්චාත් අස්වනු නාස්තිය අවම කිරීමේ අරමුණින් ඉදිකරන ලද්දක්. ශ්‍රී ලංකාවේ ආගමික ස්ථාන 5000කට වහල මත සවි කරන සූර්ය බල පද්ධති ඉන්දියාව විසින් ප්‍රදානය කරනු ලැබීම ද මෙහිදී සංකේතාත්මක ව සිදු කෙරුණා. ඇමරිකානු ඩොලර් මිලියන 17ක ප්‍රදානයෙන් දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි ආගමික ස්ථාන 5000ක් මෙ මගින් ආවරණය කිරීමටයි නියමිත. මන්නාරම රෝහල නවීකරණය සහ මහව අනුරාධපුර දුම්රිය සංඥා පද්ධතිය සඳහා රුපියල් කෝටි 450ක පමණ ලබා දී තිබූ ණය මුදල ප්‍රදානයක් බවට පත් කිරීම මේ සංචාරයේ සුවිශේෂ සිදුවීමක්. ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ

ශ්‍රී මහා බෝධීන් වහන්සේ
වැඳ පුදා ගනිමින්





ඉන්දීය අග්‍රාමාත්‍යවරයා ගුවන්තොටුපොළ විශේෂ අමුත්තන්ගේ පොතේ සමරු සටහන් තබමින්

ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ ඉන්දියානු ණය සඳහා අයකරන ලද පොලී ප්‍රතිශතය අඩු කිරීමටත් එම ණය සේවාකරණය සඳහා වන කාලය දීර්ඝ කිරීමටත් අර්බුද සමයේ ශ්‍රී ලංකාව විසින් ඉන්දියාවෙන් ලබාගත් ඇමරිකානු ඩොලර් මිලියන 100ක මුදලක් ප්‍රදානයක් වශයෙන් සැලකීමටත් ඉන්දීය අග්‍රාමාත්‍යවරයා එකඟත්වය පළ කළා.

ඉන්දියානු ණය සඳහා අයකරන ලද පොලී ප්‍රතිශතය අඩු කිරීමටත් එම ණය සේවාකරණය සඳහා වන කාලය දීර්ඝ කිරීමටත් අර්බුද සමයේ ශ්‍රී ලංකාව විසින් ඉන්දියාවෙන් ලබාගත් ඇමරිකානු ඩොලර් මිලියන 100ක මුදලක් ප්‍රදානයක් වශයෙන් සැලකීමටත් ඉන්දීය අග්‍රාමාත්‍යවරයා එකඟත්වය පළ කළා.

ඉන්දීය අගමැතිවරයාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර සුවිශේෂ කතාබහට ලක් වූ කරුණක් වූයේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුම් 07ක් අත්සන් කිරීම. ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ගිවිසුම්වලට එළැඹීම 1950ස් ගණන් දක්වා දිව යනවා. නේරු කොතලාවල ගිවිසුම (1954), කච්චතිව් ගිවිසුම (1974), ඉන්දු ලංකා සම්මුතිය නොහොත් සිරිමා ශාස්ත්‍රී ගිවිසුම (1964), ඉන්දු-ලංකා ගිවිසුම (1987) දෙරට අතර ඇතිකර ගත් සුප්‍රසිද්ධ ගිවිසුම් කිහිපයක්.

මෙවර ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ පැමිණීමේදී ඇති කරගත් ගිවිසුම් පිළිබඳ ව විදේශ කටයුතු අමාත්‍ය විජිත හේරත් 2025 අප්‍රේල් 08 දින පාර්ලිමේන්තුවේ විශේෂ පැහැදිලි කිරීමක් කළා. එයට අනුව මේ ගිවිසුම්ගත වීමේ ප්‍රමුඛ අරමුණ වන්නේ දෙරට අතර නීතිමය බැඳීමකට වඩා දෙරට අතර අන්‍යෝන්‍ය අවබෝධය, විශ්වාසය සහ ඒ සඳහා පුළුල් බැඳියාවක් ඇති කර ගැනීම. ඕනෑ ම මොහොතක එක් රටකට මේ ගිවිසුම්වලින් ඉවත් වීමේ හැකියාව තිබෙන බවත් ඒ සඳහා මාස 03කට පෙර අනෙක් රටට දැනුම් දීම පමණක් ප්‍රමාණවත් බවත් ඇතැම් අවබෝධතා ගිවිසුම් වසර 03කට, වසර 05කට බලපැවැත්වෙන පරිදි අත්සන් කර තිබෙන බවත් පැවසූ අමාත්‍යවරයා එහිදී අවධාරණය කළේ මේ ගිවිසුම් සියල්ල නීතිපතිවරයාටත් කැබිනට් මණ්ඩලයටත් අදාළ අමාත්‍යාංශවලටත් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව අත්සන් කළ බව.

ඉන්දියාව සමග ශ්‍රී ලංකාව ඇති කරගත් බලශක්තිය පිළිබඳ වූ ගිවිසුම් 02න් පළමුවැන්න මන්නාරම සිට ඉන්දියාවේ මදුරෙයි දක්වා විදුලි බල පද්ධතිය (Grid connection) පුළුල් කිරීම. මේ

> ත්‍රිකුණාමලය බලශක්ති මධ්‍යස්ථානය සම්බන්ධයෙන් ද ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමකට එළැඹ තිබෙනවා ශ්‍රී ලංකාව, ඉන්දියාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර. මේ ගිවිසුමේ ශ්‍රී ලංකාවේ අපේක්ෂාව වන්නේ ඉන්ධන ආනයනය කර ගබඩා කර රට අභ්‍යන්තරයේ බෙදා හැරීම සහ නැව් සඳහා ඉන්ධන ලබා දීමේ බංකරින් සේවාව ක්‍රියාත්මක කිරීම.

මහව-අනුරාධපුර දුම්රිය සංඥා පද්ධතිය සහ නවීකරණය කරන ලද මහව- ඕමන්ත දුම්රිය මාර්ගය නිල වශයෙන් විවෘත කරමින්






ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් ඉන්දියානු අගමැතිවරයාට 'මිත්‍ර විභූෂණ සම්මානය' පිළිගැන් වූ මොහොත



මෙරටට පැමිණි ඉන්දීය අග්‍රාමාත්‍යවරයා ඉන්දීය ප්‍රජාව විසින් පිළි ගනු ලැබූ මොහොත

යටතේ අනාගතයේදී දෙරටට ම විදුලිය ආනයනය හා අපනයන කිරීමට හැකි වන අතර මෙරට විදුලිය බිම්ස්ටෙක් දක්වා අපනයනය කිරීමේ හැකියාව ශ්‍රී ලංකාවට ලැබෙනු ඇති. මේ ගිවිසුම තවමත් ප්‍රතිපත්තිමය එකඟතාවක් පමණක් බවත් ඉදිරියේදී තාක්ෂණික කමිටු ආදිය පිහිටුවීමෙන් ඒ සඳහා වන සැලසුම තීරණය වනු ඇති බවත් විජිත හේරත් අමාත්‍යවරයා පෙන්වා දෙනවා.

ත්‍රිකුණාමලය බලශක්ති මධ්‍යස්ථානය සම්බන්ධයෙන් ද ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමකට එළැඹ තිබෙනවා ශ්‍රී ලංකාව, ඉන්දියාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර. මේ ගිවිසුමේ ශ්‍රී ලංකාවේ අපේක්ෂාව වන්නේ ඉන්ධන ආනයනය කර ගබඩා කර රට අභ්‍යන්තරයේ බෙදා හැරීම සහ නැව් සඳහා ඉන්ධන ලබා දීමේ බංකරින් සේවාව ක්‍රියාත්මක කිරීම. එහිදී ත්‍රිකුණාමලයේ ඉන්ධන ටැංකි 85ක් ප්‍රතිසංස්කරණය වනු ඇති.

ඩිජිටල් සහයෝගිතා ගිවිසුමේදී දියුණු ඩිජිටල්කරණ භාවිතයක් සහිත ඉන්දියානු තාක්ෂණය ශ්‍රී ලංකාවට ලබා ගැනීම අපේක්ෂා කෙරෙනවා.

දෙරට අතර හමුදා නිලධාරින් හුවමාරුව, පුහුණු කිරීම, හමුදාව අතර කාර්ය මණ්ඩල සාකච්ඡා, තොරතුරු හුවමාරුව, බුද්ධිමය දේපළ අයිතිය, ආරක්ෂක තාක්ෂණ පර්යේෂණ ක්ෂේත්‍රයේ සහයෝගිතාව ආදිය ආරක්ෂාව පිළිබඳ ඇතිකරගත් ගිවිසුමේ අරමුණු. මේ ගිවිසුමෙන් ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට කිසිදු තර්ජනයක් ඇති නොවන බවත් මේ ගිවිසුමේ ඇත්තේ දැනටමත් දෙපාර්ශ්වයේ ක්‍රියාත්මක වීම බවත් ඔහු පෙන්වා දෙනවා. ශ්‍රී ලංකාවේ භූමිය ඉන්දියාවේ ආරක්ෂාවට අහිතකර ලෙස බලපාන ආකාරයෙන් භාවිත කිරීමට ඉඩ නොදෙන බව ද එම ගිවිසුමේ සඳහන් ව ඇති බව ඔහු ප්‍රකාශ කළා.

සෞඛ්‍ය හා ඖෂධ නියාමනය පිළිබඳ ගිවිසුම් ද්විත්වයෙන් දෙරට අතර සේවකයන් පුහුණු කිරීම, විවිධ පර්යේෂණවල නවීන අංග හුවමාරු කර ගැනීම සහ අඩු මිලට ගුණාත්මකභාවයෙන් ඉහළ ඖෂධ ආනයනය සඳහා ඉන්දියාවේ ෆාමකෝපියා කොමිසම (Indian Pharmacopoeia Commission) ශ්‍රී ලංකාව තුළ පිළිගැනීම සඳහා එකඟතාවට එළැඹ තිබෙනවා.

බොහෝ පිරිස් ජනාධිපති අනුර කුමාර දිසානායක සහ අගමැති නරේන්ද්‍ර මෝදි අතර ඇති ව තිබූ මිත්‍රශීලී සබඳතාව පිළිබඳ දක්වා තිබුණේ ධනාත්මක අදහස්. ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් ඉන්දියානු අගමැතිවරයාට 'මිත්‍ර විභූෂණ සම්මානය' පිළිගැන්වූ අතර එය ඉන්දියානු අගමැතිවරයාගේ දැඩි ප්‍රීතියට හේතු වූ බවයි පෙනී ගියේ. තමන් එම සම්මානයෙන් පිදුම් ලැබීම මහත් ගෞරවයට හේතුවක් බවත් එය තමාට පමණක් නොව කෝටි 104ක්වූ ඉන්දියානු ජනතාවට ලැබුණු මිත්‍රත්වයේ සලකුණක් බවත් ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ප්‍රමුඛ ශ්‍රී ලංකා ජනතාවට ස්තූතිවන්ත වන බවත් ඉන්දියානු අග්‍රාමාත්‍යවරයා පැවසුවා. සත්‍ය මිතුරකු සහ ඔහුගේ මිත්‍රත්වයට වඩා වෙනත් සුරක්ෂාවක් නොමැති බව ඉන්දීය අගමැති ශ්‍රී නරේන්ද්‍ර මෝදි පෙන්වා දුන්නේ 'තිරුවලුවර්' නම් කවියාගේ වදනක් උපුටා දක්වමින්.

---




# රජ වුණු රජ ලුණු

රංගිකා අබේසේකර

අලිමංකඩ ලුණු ලේවාය පරිශ්‍රයේදී නොබෝද (මාර්තු මස 29) මේස ලුණු (පිරිසිදු කරන ලද ලුණු) නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් විවෘත කෙරුණේ 'රජ ලුණු' නමින්. මෙහි අරමුණ වන්නේ අඩුම මිලට ඉහළ ගුණාත්මක බවින් යුත් මේස ලුණු පරිභෝජනයට මෙරට ජනතාවට අවස්ථාව සලසා දීම.

නවීන අංගෝපාංග සහ පහසුකම්වලින් සමන්විත මේ කර්මාන්ත ශාලාවේ පැයක ලුණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5ක්. එම ලුණු කිලෝග්‍රෑමක සහ ග්‍රෑම් 400 මේස ලුණු පැකට් ලෙස වෙළෙඳපොළට නිකුත් කිරීමටයි නියමිත. මේ කර්මාන්තශාලාව නිසා සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 450-500ත් අතර සංඛ්‍යාවක් ජනිත වනවා.

අලිමංකඩ ලුණු ලේවායේ නිෂ්පාදිත ලුණු ඉතා ඉහළ ගුණාත්මක බවින් යුක්ත වන අතර එය දේශීය ව හා විදේශීය වශයෙන් ද ජනප්‍රිය වී තිබෙනවා. අලිමංකඩ ලුණු ලේවාය 2001 වර්ෂයේදී ලුණු සමාගම යටතට පත් වුවත් ශ්‍රී ලංකාවේ පැවැති යුද්ධය හේතුවෙන් එහි නිෂ්පාදන සිදු කිරීමට නොහැකි වුණා. එය ක්‍රමයෙන් ඉදිරියට ගෙනෙමින් මේස ලුණු නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම දක්වා දියුණු කිරීම මෙරට ලුණු නිෂ්පාදන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන කරුණක්.

අලිමංකඩ ලුණු ලේවායේ මෙතෙක් ලුණු නිෂ්පාදනය කළත් අවසන් නිෂ්පාදනයක් ලෙස පරිභෝජනය සඳහා මේස ලුණු නිකුත් කර නැහැ. අවසාන පරිභෝජනය සඳහා ලුණු නැවත සකස් කර තිබෙන්නේ පෞද්ගලික අංශයේ දායකත්වයෙන්. විවිධ වෙළෙඳ නාම යටතේ මේස ලුණු බෙදා හැර තිබෙනවා. එහෙත් රජයේ නව වැඩපිළිවෙළ යටතේ නිෂ්පාදන ආර්ථිකය දියුණු කිරීමේ පියවරක් ලෙස ලුණු සකස් කිරීම මෙන් ම අලිමංකඩ 'රජ ලුණු' ලෙස නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා. මේ සඳහා වැයවන මුදල රුපියල් මිලියන 250ක්.

1938 වර්ෂයේ ආරම්භ කළ ජාතික ලුණු සමාගම සන්ධිස්ථාන කිහිපයක් පසු කර වර්තමානයේ ඉතා සුවිශේෂ ස්ථානයකට පැමිණ තිබෙනවා. අදහස් දක්වන ජාතික ලුණු සමාගමේ සභාපති ගයාන් වෙල්ලාල; "ශ්‍රී ලංකාව ම ආවරණය වන පරිදි අප බෙදාහැරීම් ජාලයක් භාවිත කරමින් සුපර්මාකට්, සතොස ඔස්සේ 'රජ ලුණු' වෙළෙඳ නාමයෙන් නිෂ්පාදිත මේස ලුණු පාරිභෝගික ජනතාවට නිකුත් කරනවා. අප සහතික වෙනවා ගුණාත්මක ව මේස ලුණු අඩු ම මිලට ජනතාවට ලබා දීමට. මේ කර්මාන්ත ශාලාවේ දැනට ඇති ඇසුරුම්කරණය හා බෙදාහැරීම වැනි ක්‍රියාවලි කිහිපයක් ම ස්වයංක්‍රීය කිරීමටත් බලාපොරොත්තු වෙනවා. මෙට්‍රික් ටොන් 5ක ධාරිතාවෙන් ලුණු නිෂ්පාදනය ආරම්භ කළත් අපේ සැලැස්ම ඉදිරියේදී මෙහි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමෙන් මීට වඩා ධාරිතාව ඉහළ නැංවීමට. ඒ ඔස්සේ විශ්වාස කරනවා ඉතිහාසයේ ඉහළ ම ආදායම හා ලාභය ලබාගැනීමට අපට හැකි වේවි කියා."

අක්කර 75ක භූමි ප්‍රමාණයක් නවීකරණය කර ජාතික ලුණු නිෂ්පාදනයට එක් කිරීමටත් අලිමංකඩ ලේවාය ආශ්‍රිත ව තවත් ලේවාය හඳුනාගෙන උතුරු පළාතේ ලුණු නිෂ්පාදනය වර්ධනය කිරීමත් ජාතික ලුණු සමාගමේ දැක්ම සහ මෙහෙවර බව සභාපතිවරයා අවධාරණය කරන්නක්.

රටේ ලුණු හිඟයක් ඇති වීම, මිල ඉහළ යාම, ලුණු ආනයනය කිරීමට සිදුවීම මේ කර්මාන්තය ආශ්‍රිත ව පැන නගින ගැටලු. රට වටේ ම මුහුද තිබියදීත් ලුණු ආනයනය කරන්නේ ඇයි? යන කාරණය පිළිබඳ සාධාරණ පැනයක් කෙනෙකුට නැගෙන්න පුළුවන්. එහෙත් අවශ්‍ය තොග පවත්වා නොගැනීම නිසාත් එළිපන්ට්පාස්වල විශාල ලුණු ලේවාය තිබියදීත් ඒවා සංවර්ධනය කිරීමට කෙරෙහි අවධානය යොමු නොවීමත් මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබෙනවා.

අලිමංකඩ ලුණු ලේවාය අක්කර 750ක භූමි ප්‍රමාණයකින් යුක්ත වූවක්. මෙහි මෙට්‍රික් ටොන් 25,000ක ධාරිතාවකින් ලුණු නිෂ්පාදනය කිරීමට අවකාශ තිබෙනවා. ඊට අමතර ව අක්කර 50-75ක භූමියක් නවීකරණය කිරීමටයි රජය බලාපොරොත්තු වන්නේ. එවිට තවත් මෙට්‍රික් ටොන් 5ක ලුණු ධාරිතාවක් නිෂ්පාදනයට බලාපොරොත්තු වන බව පවසන ජාතික ලුණු සමාගමේ සභාපති ගයාන් වෙල්ලාල සඳහන් කළේ අලිමංකඩ කලපුවට අනෙක් පසින් තිබෙන ජාතික

ලුණු සමාගමට අයත් අක්කර 1169ක ලුණු ලේවායේ ද ලුණු මෙට්‍රික් ටොන් 30,000ක ධාරිතාවක් නිෂ්පාදනය කළ හැකි බව.

සියලු අවශ්‍යතා සඳහා ශ්‍රී ලංකාවට වාර්ෂික ව අවශ්‍ය වන ලුණු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 180,000ක්. පරිභෝජනයට අවශ්‍ය මේස ලුණු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 120,000-130,000ත් අතර ප්‍රමාණයක්. කර්මාන්තශාලා සඳහා අවශ්‍ය වන්නේ ලුණු මෙට්‍රික් ටොන් 40,000-50,000ක්. කෙසේ වෙතත් ලුණු මෙට්‍රික් ටොන් 180,000ක් මෙරට නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබෙනවා. ජාතික ලුණු සමාගමේ සභාපති ගයාන් වෙල්ලාල සඳහන් කරන ආකාරයට ලුණු නිෂ්පාදනය සක්‍රීය වූයේ 2020-2021 වසරවලින් පසුව. ඒ සඳහා කාලගුණික හා දේශගුණික තත්ත්ව බලපා තිබෙනවා.

ලුණු යනු කාලගුණයට දේශගුණයට වඩාත් සංවේදී කර්මාන්තයක්. විශේෂයෙන් මේ වසරේ යල කන්නයේ සඳහා මෙට්‍රික් ටොන් 30,000-35,000ක ලුණු අස්වැන්නක් බලාපොරොත්තු වුවත් මාර්තු මස පළමු සති දෙකේ මිලිමීටර 300ක ඇද වැටුණු වර්ෂාපතනය හේතුවෙන් හම්බන්තොට, ත්‍රිකුණාමලය, පුත්තලම හා අලිමංකඩ ලේවායවල ලුණු අස්වැන්න සීමා වී තිබෙන්නේ මෙට්‍රික් ටොන් 6,000-8,000 දක්වා. වසර 3-4ක සිට පැවති මේ තත්ත්වය නිසා අපේක්ෂිත ලුණු නිෂ්පාදනයට බාධා එල්ල වී තිබෙනවා. ලුණු නිෂ්පාදනයේදී එය දින 45ක් වැනි කාලයක් ආරක්ෂාකාරී ව වර්ෂාවෙන් බාධාවක් නොවන ආකාරයට තැබිය යුතු වනවා. එය ලුණු අස්වැන්න සඳහා බලපාන ප්‍රබල සාධකයක්.

ලුණු නිෂ්පාදනයේදී බලපාන ආපදා අවම කිරීම සඳහා රටවල් විවිධ ක්‍රියාමාර්ග ගන්නවා. එහිදී ලුණු අස්වනු නෙළන තටාකවලට පොලිතින් ශීට් ආවරණය යෙදීම, ටියුබ් බෙල්ස් භාවිත කිරීම වැනි මිල අධික ක්‍රම තිබෙනවා. මේ සියලු ම තාක්ෂණ මිල අධික වනවා. එහෙත් ලේවාය ආශ්‍රිත ව ඉදිරියේදී ටියුබ් බෙල්ස් ක්‍රමය භාවිත කර පවතින ගැටලු සඳහා යම්තාක්දුරකට පිළියම් ලබා ගැනීමට උත්සාහ දරන බවයි ජාතික ලුණු සමාගමේ සභාපති ගයාන් වෙල්ලාල සඳහන් කරන්නේ.

2024 වර්ෂයේදී ලුණු මෙට්‍රික් ටොන් 13,800ක් නිෂ්පාදනය කර ඇති මේ ලේවායෙන් 2025 වර්ෂයේදී ලුණු මෙට්‍රික් ටොන් 20,000ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරනවා. ඒ සඳහා අලිමංකඩ ලුණු ලේවායේ කාර්ය ප්‍රවර්ධනය කිරීමත් ඉතා වැදගත්. මේ ඔස්සේ එහි ආර්ථික ප්‍රතිලාභ උතුරු පළාතේ ජනතාවට මෙන් ම රටේ සමස්ත ජනතාවට ලැබෙනු ඇති. එය රටේ ආර්ථික සංවර්ධනයටත් බෙහෙවින් ඉවහල් වනු ඇත්තේ නිරතුරුව ම.






# ආර්ථික ගමනේ IMF සහය



මහාචාර්ය
**සුරංග සිල්වා**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ ඇතිවූ දරුණු ආර්ථික අර්බුදයත් සමග ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් විස්තීර්ණ ණය පහසුකම් ලබා ගැනීමට ශ්‍රී ලංකාව එකඟතාවක් ඇති කර ගත්තේ 2023 වර්ෂයේදී. වසර හතරක කාලයක් මේ එකඟතාව ක්‍රියාත්මක වීමට නියමිත ව තිබෙනවා. 2023 මාර්තු 20 දින SDR (විදේශ ගැනුම් හිමිකම්) බිලියන 2.3ක (ඇමරිකානු ඩොලර් බිලියන 2.9ක් පමණ) විස්තීර්ණ ණය පහසුකමක් ලබා දීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එකඟ වුණා. අත්කරගන්නා ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයකින් පසුව එය කොටස් කිහිපයකින් ලබා දීමටයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එකඟතාව පළ කර තිබුණේ. ඒ අනුව නොබෝද කාර්ය මණ්ඩල එකඟතාව ලැබුණේ ශ්‍රී ලංකාවට ඇමරිකානු ඩොලර් මිලියන 344ක් වන විස්තීර්ණ ණය මුදලේ සිව් වැනි වාරිකය සඳහා ප්‍රවේශ වීමට.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල බිහි වන්නේ දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ලෝක ආර්ථික සහයෝගිතාව සහ මූල්‍ය ස්ථාවරත්වය අරමුණු කරගෙන 1944 වර්ෂයේ බ්‍රෙටන් වුඩ්ස්හිදී. 1945 වර්ෂයේදී සාමාජික රටවල් 29ක් සමග එය නිල වශයෙන් ක්‍රියාත්මක වුණා. 1947 වර්ෂයේදී මෙහෙයුම් ආරම්භ කළ මෙහි ආරම්භක අරමුණු වුණේ මූල්‍ය සහයෝගිතාව, විනිමය අනුපාත ස්ථාවර කිරීම, ජාත්‍යන්තර වෙළෙඳාම පුළුල් කිරීම සහ ගෙවුම් ශේෂ ගැටලු සඳහා ආධාර සැපයීම. මුල් කාලයේදී එය ඇමරිකානු ඩොලරය පදනම් කරගත් ස්ථාවර විනිමය ක්‍රමයක් යටතේ ක්‍රියාත්මක වුණා. 1970 දශකයේ බ්‍රෙටන් වුඩ්ස් ක්‍රමය බිඳ වැටීමෙන් පසු IMFහි කාර්යභාරය වෙනස් වූ අතර ගෙවුම් ශේෂ අර්බුදවලට මුහුණදෙන රටවලට සහය වීම සහ ගෝලීය මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු ව තිබෙනවා. වර්තමානයේ සාමාජික රටවල් 190කින් සමන්විත IMF නියැළී සිටින්නේ ගෝලීය ආර්ථික අධීක්ෂණය, මූල්‍ය ආධාර සහ තාක්ෂණික සහය ලබා දීම යන ප්‍රධාන කාර්යවල.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකත්වය ලබා ගන්නේ 1950 වර්ෂයේ. එතැන් සිට මේ දක්වා අවස්ථා 16කදී (ක්‍රියාත්මක වැඩසටහන ද ඇතුළු ව) විවිධ අරමුණු සඳහා IMF සහයෝගය ලබාගෙන තිබෙනවා. මූල්‍ය පහසුකම්වලට අමතර ව සාර්ව ආර්ථික කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ඇතුළු ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ උපදෙස් ලබා දීම, ආර්ථික කළමනාකරණය සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිලධාරින්ට පුහුණුව සහ තාක්ෂණික සහාය ලබා දීම, ණය ප්‍රතිව්‍යුහගතකරණයට සහ ණය සහන ලබා ගැනීමට සහය වීම, ආර්ථික ස්ථාවරත්වය සහ ජාත්‍යන්තර විශ්වාසය ගොඩනැගීමට දායක වීමට සහය වීම ශ්‍රී ලංකාව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර ඇති කරගත් එකඟතාවෙන් මෙතෙක් ලැබුණු පහසුකම්.

මෑත ඉතිහාසයේ මුහුණදුන් දරුණුතම ආර්ථික අර්බුදයෙන් පසුව ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය අපේක්ෂා කිරීම හැර වෙනත් විකල්ප අවස්ථාවකට ඉඩක් තිබුණේ නැහැ. මා දකින ආකාරයට වර්තමාන ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගත් එකඟතා අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීමට තෝරා ගැනීම දේශපාලන අධිකාරිය තම ආර්ථික ප්‍රතිපත්ති පවතින තොරතුරු අනුව යාවත්කාලීන කර ගැනීමක්. එය අගය කළ යුත්තක්. චීනයේ මා ඕ සේතුං තම ආර්ථික ප්‍රතිසංස්කරණ කාලීන තොරතුරු අනුව වෙනස් කිරීම නිසා අද වන විට චීනය ලෝකයේ ආර්ථිකමය වශයෙන් බලවත් රාජ්‍යක් බවට පත් ව තිබෙනවා. රුසියාව හා කියුබාව එය නිවැරදි ව සිදු නොකිරීම නිසා ඔවුන්ට එවැනි සාර්ථකත්වයක් අත්පත් කර ගැනීමට හැකි වූයේ නැහැ.

ශ්‍රී ලංකාව මෙවර IMF සහයෝගිතාව අපේක්ෂා කරන ලද්දේ 17 වැනි වතාවට. සාර්ව ආර්ථික ස්ථායිතාව සහ ණය තිරසරභාවය යථා තත්ත්වයට පත් කිරීම, දුප්පත් හා අවදානමට ලක්විය හැකි ජනතාව ආරක්ෂා කිරීම, බාහිර සංචිත ගොඩනැගීම සහ වර්ධනය-නැඹුරු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැඩිදියුණු කිරීම මෙවර IMF සහයෝගිතා වැඩසටහනේ ප්‍රධාන අරමුණු. ඒ අනුව 2024 වර්ෂයේදී ආර්ථික වර්ධනය 5%ක් දක්වාත් 2022 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් 8.2%වූ රාජ්‍ය ආදායම 2024 වර්ෂයේදී 13.5% දක්වාත් ඉහළ මට්ටමකට ළඟා කර ගැනීමට ශ්‍රී ලංකාව සමත් ව තිබෙනවා. 2025 මාර්තු වන විට දළ නිල සංචිත ඇමරිකානු ඩොලර් බිලියන 6.5 දක්වා වර්ධනය වී ඇති අතර රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කර තිබෙනවා. ණය ප්‍රතිව්‍යුහගතකරණය ආසන්න වශයෙන් සම්පූර්ණ වෙමින් පවතිනවා. 2025 අප්‍රේල් 25 වන විට IMF කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා බලධාරින් සිව් වැනි සමාලෝචනය සඳහා එළඹුණු කාර්ය මට්ටමේ එකඟතාවේදී ස්වයංක්‍රීය මිල ගැලපුම් යාන්ත්‍රණය ක්‍රියාත්මක කරමින්, විදුලි ගාස්තු තීරණය කිරීමේදී පිරිවැය පදනම් කරගත් මිල ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සහ බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික සහතික කිරීම් සමාලෝචනය කිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අවධාරණය කරනු ලැබ තිබුණා. විධායක

මණ්ඩලයේ අනුමැතියෙන් පසු ශ්‍රී ලංකාවට හිමි වන ඇමරිකානු ඩොලර් මිලියන 344ක මූල්‍ය පහසුකම් සමගින් මේ වන විට IMF සපයා ඇති මුළු ආධාර මුදල ඇමරිකානු ඩොලර් බිලියන 1.722 දක්වා ඉහළ යනු ඇති. IMF සහ ශ්‍රී ලංකාව අතර ඇති කර ගත් එකඟතා අනුව ශ්‍රී ලංකාව ක්‍රියාත්මක වීමේදී මූලික වශයෙන් ගෝලීය වෙළෙඳ ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අඛණ්ඩ ව සිදු කිරීම අභියෝග ලෙස පවතිනවා. එසේ ම ඇමරිකාවේ තීරු බදු ප්‍රතිපත්තිය, වර්ධනය වෙමින් පවතින ඉන්දු පාකිස්තානු ගැටුම් සහ අනාගතයේ ඇතිවිය හැකි තත්ත්ව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බලපෑම් කරනු ඇති.

ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තවදුරටත් සාර්ථක ව ඉදිරියට ගියහොත් ආර්ථිකය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි වනවා මෙන් ම ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ මට්ටමක රඳවා ගැනීමට හැකියාව ලැබෙනු ඇති. 2026 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 3.3%ක් වැනි අඩු බාහිර ණය සේවාකරණයක් පවත්වා ගැනීමට ද මේ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කර ගැනීම කළ යුතුයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන අනුව 2024 වර්ෂය අවසන් කාර්තුවේ පැවති ආර්ථිකයේ වර්ධනය (5.4%) 2026 වර්ෂය වන විටත් පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුවට අනුව එය පිළිවෙළින් 3.1%ක් හා 4.5%ක් වනු ඇති. ගෝලීය ආර්ථිකයේ ඇති විය හැකි අවිනිශ්චිතභාවය නොමැතිනම් ආර්ථිකයේ ධනාත්මක වර්ධනයක් අපේක්ෂා කළ හැකි බව පෙනී යන කරුණක්. උද්ධමනය පාලනය කිරීම හා රාජ්‍ය අයවැය හිඟය අවම මට්ටමක පවත්වා ගැනීම ද රජයේ ප්‍රධාන අපේක්ෂාවක්. මූලික අයවැය අතිරික්තය 2025 වර්ෂයේ සිට 2.3%ක අතිරික්තයක් පවත්වා ගැනීමත් 2025 වර්ෂයේදී සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 15.%ක මට්ටමට ගෙන ඒමත් 2026 වර්ෂයේදී එය 5% දක්වා අඩු කිරීමත් ශ්‍රී ලංකාවේ අපේක්ෂාවක්.

IMF වැඩසටහන සමග ඒකාබද්ධ වෙමින් ශ්‍රී ලංකාව ඇති කරගෙන තිබෙන මේ ඉලක්ක සපුරා ගැනීම සඳහා පවතින ප්‍රධානතම අභියෝගය ලෙසින් ගෝලීය ආර්ථිකයේ ඇති අවිනිශ්චිත ස්වභාවය පෙන්වා දෙන්න පුළුවන්. ගෝලීය ආර්ථිකයේ මන්දගාමිත්වය හෝ වෙළෙඳ ප්‍රතිපත්තිවල ඇති විය හැකි වෙනස්කම් ශ්‍රී ලංකාවේ අපනයන හා ආනයන කෙරෙහි බලපෑම් ඇති කිරීමේ හැකියාවක් පවතිනවා. මේ තත්ත්වයට මුහුණදීම සඳහා අපනයන වෙළෙඳපොළ විවිධාංගීකරණය, දේශීය නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ආනයන මත යැපීම අඩු කිරීම. නව වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීම සහ පවතින ඒවා ශක්තිමත් කිරීම කළ හැකියි. රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමට සහ වියදම් අවම කර ගැනීමට බදු ප්‍රතිසංස්කරණ අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීම රාජ්‍ය මූල්‍ය තිරසරභාවය පවත්වා ගැනීම සඳහා භාවිත කළ හැකි උපායමාර්ග ලෙසින් දක්වන්න පුළුවන්. ඉල්ලුම ඉහළ යාමෙන් පිරිවැය පදනම් කරගත් මිල ක්‍රමය මගින් ඉහළ යා හැකි උද්ධමනය පාලනය සඳහා මධ්‍යම බැංකුවේ ස්වාධීනත්වය සහතික කිරීම සහ උද්ධමනය ඉලක්ක කරගත් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, සැපයුම් අංශයේ බාධා අවම කිරීම සහ තරගකාරිත්වය ඉහළ නැංවීම ආදී උපායමාර්ගික ක්‍රමවලට අවතීර්ණ වීම වැදගත්. ආර්ථිකයේ ව්‍යුහාත්මක දුර්වලතා අවම කිරීම සඳහාත් වෙළෙඳාම, ආයෝජන සහ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහාත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ප්‍රමාද වීමේ හැකියාවක් පවතිනවා. මෙහිදී ව්‍යාපාර කිරීමේ පහසුව වැඩිදියුණු කිරීම, නීතිමය හා නියාමන රාමුව ශක්තිමත් කිරීම, තාක්ෂණික නවෝත්පාදන සහ ඩිජිටල් ආර්ථිකය ප්‍රවර්ධනය, කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය වැඩි කිරීම සිදු කළ හැකියි. ගෙවුම් ශේෂ අර්බුදයක් නැවත ඇතිවීමේ අවදානම අවම කිරීම සඳහා විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය, විදේශ ප්‍රේෂණ වැඩි කිරීම සහ ප්‍රමාණවත් විදේශ විනිමය සංචිත පවත්වා ගැනීම කළ යුත්තක්. එසේ ම ආර්ථික ප්‍රතිසංස්කරණවලින් දුප්පත් සහ අවදානමට ලක්විය හැකි ජනතාවට ඇතිවන බලපෑම අවම කිරීම සඳහා ඉලක්කගත සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් කළ හැකි අතර රැකියා උත්පාදනයට සහය වීම සහ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීම වැනි දෑ සඳහා අවධානය යොමු කිරීමත් වැදගත්.

මේ අභියෝගවලට සාර්ථක ව මුහුණදීම සඳහා ශ්‍රී ලංකාව අඛණ්ඩ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් පවත්වා ගත යුතු වනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර ආයතන සමග සහයෝගයෙන් ක්‍රියා කළ යුතු වනවා. එසේ ම විනිවිදභාවයෙන් හා වගවීමෙන් යුත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ආර්ථිකයේ තිරසර වර්ධනයට අත්‍යවශ්‍ය සාධකයක්.

**දීප්ත කුමාර බටගොඩ**

ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආර්ථික ප්‍රතිපත්ති වෙනස්කම් හා [illegible]

| දර්ශකය | 2019 – 2023 | 2024 – 2025 |
|---|---|---|
| වෙළෙඳ ශේෂය | 2021දී ඇ.ඩො. බිලියන16.55ක හිඟයක්. (ආනයන ඉහළ යාමෙන්) | 2024දී ඇ.ඩො. බිලියන 6.07ක හිඟයක්. 2025 මාර්තු මාසයේදී ඇ.ඩො. මිලියන 395.6ක හිඟයක්. |
| | | |
| අයවැය හිඟය | දළ දේ.නිෂ්පාදිතයෙන් 6.8% (2019) සිට 11.6% (2021) දක්වා ඉහළ ගියේය. ([illegible]) | 2025දී දළ දේ. නිෂ්පාදිතයෙන් 6.7% දක්වා අඩු කිරීමේ උත්සාහයක්. ප්‍රාථමික ශේෂය 2.3%ක අතිරික්තයක්. |
| | | |
| රජයේ ණය බර | 2022දී විදේශ ණය ගෙවීම අත්හිටුවීම (default). 2023දී ඇ.ඩො. බිලියන 2.58ක ණය [illegible]. ([illegible]) | 2025දී දළ දේ. නිෂ්පාදිතයෙන් 8.8%ක් පොලී ගෙවීමට යයි. ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්පූර්ණ කරගත යුතු ව ඇත. |
| GDP වර්ධනය | 2023දී -2.3% අඩුවීම. 2023 අවසන් කාර්තුවේ +4.5% වර්ධනයක්. | 2024 අවසන් කාර්තුවේදී 5.4%ක වර්ධනයක්. 2025 මුලදී වර්ධන ලකුණු පෙන්වයි. [illegible] |
| දිළිඳුකම | 2019දී 11.3% සිට 2023 දී 25.9% දක්වා ඉහළ ගියේ. ([illegible]) | [illegible] |
| උද්ධමනය | 2022දී 70% දක්වා ඉහළ ගිය අතර 2024 පෙබරවාරියේදී 5.5% දක්වා අඩු විය. | 2025 [illegible] -2.0% අඩුවීමක්. [illegible] |
| ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති | බදු අඩුකිරීම, [illegible] IMF [illegible] | IMF සමග [illegible] |

# ලෝවක උතුමන් කලණ මිතුරන්

නිශාන්ත පීරිස්



සම්බුදු තෙමගුල ලෝකවාසී බෞද්ධ ජනතාවගේ උතුම් ම බොදු උත්සවය මෙන් ම ආධ්‍යාත්මික ව ඉතා සුවිශේෂ පුණ්‍ය සමයක්. ශ්‍රී ලංකාවේ රාජ්‍ය වෙසක් උත්සවය මෙවර නුවරඑළිය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වනවා. ඒ, 'හජේථ මිත්තෙ කල්‍යාණෙ' යන උතුම් බුදුවදන තේමා කරගෙන. බෞද්ධ ප්‍රතිපදාව තුළ විවර ව පවතින ඉතා විශිෂ්ට සදහම් මාර්ග අතරින් කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ද උතුම් දායාදයක්. රටක, සමාජයක, සංස්කෘතියක උසස් පැවැත්මට ඉන් ලැබෙන පිටුබලය ද සුවිශේෂයි. මේ විද්වත් කතාබහ ඒ පිළිබඳ ව.



සේවාර්පිත මහාචාර්ය
**අසංග තිලකරත්න**
බෞද්ධ අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

බෞද්ධ දර්ශනය පුද්ගලයාගේ අභ්‍යන්තර විමුක්තිය මෙන් ම බාහිර පැවැත්ම පිළිබඳ ව ද බොහෝ ධර්ම කරුණු ගෙනහැර දක්වනවා. ඒ මග යන පුද්ගලයා ඔහු ජීවත්වන පවුල මෙන් ම සමාජය ද සුමගට පමුණුවනවා. 'හජේථ මිත්තෙ කල්‍යාණේ - හජේථ පුරිසුත්තමෙ' යන දහම් ඔවදනෙහි ගැබ් වනුයේත් එවැන්නක්. පුද්ගලයාගේ සියලු අභිලාෂ යහමගට යොමු කරවන කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීම ම ආධ්‍යාත්මික මඟ සුපහන් කරවීමක්. එමෙන් ම 'නභජේ පාපකේ මිත්තෙ' යන්නෙන් ගම්‍යකරවන පව්ටු මිතුරන් ඇසුරු නොකිරීම ද එම අරමුණ ම ඉටු කරවන ඒ ගැන පවසන ධර්ම මාර්ගයක්. බුදුරජාණන් වහන්සේ ඉතා ක්‍රමවත් ව විධිමත් ව මෙන් ම සංවිධිත ගලායාමක් සහිත ව මේ කරුණු විග්‍රහ කර තිබීමත් වැදගත්. ගිහි පැවිදි දෙපිරිසට ම අතිශය වටිනා උපදේශයක් ඉන් සපයන්නේ. එක් අවස්ථාවකදී බුදුන් වහන්සේ මේ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය පිළිබඳ ව ආනන්ද හිමියන් සමග කළ ධර්ම සාකච්ඡාවකදී මතු වූ කරුණක් වූයේ සම්බුද්ධ ශාසනයෙන් සියයට සියයක් ම වර්ධනය වන්නේ කලණ මිතුරු ඇසුර නිසා බව. එහි පරාර්ථ ධර්ම සංග්‍රහයක් ද ඇතුළත්. ආත්මාර්ථයට වඩා පරාර්ථ හැඟීමෙන් ක්‍රියා කළ ශාසනික බුද්ධාංකුර චරිත රැසක් අප ශාසනයේ වැඩ හිඳ තිබෙනවා. ඒ යතිවර ආලෝකය කෙරම් ප්‍රබල ද යන්නත් පසක් කර ගැනීමට පුළුවන්.

අපට සිටින ශ්‍රේෂ්ඨතම කල්‍යාණ මිත්‍රරත්නය බුදුන් වහන්සේ. උන්වහන්සේ ලෝකයට ම සුවිශිෂ්ට වූ කල්‍යාණ මිත්‍ර රත්නයක්. අපට සිටින මිත්‍රයන් විවිධ අය වුවත් උන්වහන්සේට සියල්ලන් ම කල්‍යාණ මිත්‍රයන් වීමයි විශේෂත්වය. බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් ව ඒ දහම අන් අයට දේශනා කරන විට එදා ඉන්දියාවේ සිටියේ අබෞද්ධ ජනතාවක්. ඔවුන්ට බුදු මඟ පෙන්වා දුන්නේ බුදුන් වහන්සේ.

ශාසනික වශයෙන් බැලූ විට ඒ ඒ භික්ෂූන් වහන්සේලාට ස්වකීය ආචාර්යවරුන් වහන්සේලා හොඳ ම කල්‍යාණ මිත්‍රයන්. එයයි සඟ සසුන ලෝකය පුරා වර්ධනය වීමට පවා පිටුබලය වූයේ. සංයුක්ත නිකායේ දැක්වෙන පරිදි ව්‍යග්ඝපජ්ජ සූත්‍ර විග්‍රහය මේ පිළිබඳ හොඳ විචාර මාර්ගයක්. එහි දැක්වෙන අන්දමට බුදුන් වහන්සේ මෙකී සම්බන්ධතාව කෙතරම් බලවත් ද යන්න පැහැදිලි කරනවා. ගිහි සමාජ පද්ධතිය ඉදිරියට ගමන්

කරවීමටත් කලයාණ මිත්‍ර සම්බන්ධය ඉහළ දායකත්වයක් සපයන බවයි උන්වහන්සේගේ පෙන්වා දීම.

ඉතා යහපත් ජීවිත ගත කිරීමේදී උත්සාහය, උනන්දුව, බුද්ධිමත් ම ක්‍රියා කිරීම මෙන් ම ඉතා යහපත් මිතුරන් ඇසුරු කිරීමත් ඒ ජීවිතවලට ශක්තියක්. මිත්‍රත්වය යහමග මෙන් ම අයහපත් මඟට ද හේතු කරවන පුද්ගල චරිත අපට හමුවනවා. වචී පරම හෙවත් වචනයෙන් පමණක් මිතුදම පෙන්වන අය, අඤ්ඤදත්තු හර හෙවත් තම පෞද්ගලික වාසියට පමණක් සිටින මිතුරන් වැනි අය යහපත් මිතුරන් වන්නේ නැහැ. අපාය සහායක මිතුරන් කිසිදා ඇසුරු කළ යුතු නොවන්නේ ඔවුන් සංසාර ගමන පවා අවුල් කළ හැකි අය වන නිසා,

සමාජ ජීවිතයේදී අප තේරුම්ගත යුතු වැදගත් ම කරුණ වන්නේ අපගේ ඥාතීත්ව සම්බන්ධතා, මිත්‍ර සම්බන්ධතා යන මේ සියල්ලක් ම ඵලදායි ව පවතිනුයේ එහි සිටින පුද්ගල චරිතවල කලණ මිතුරු ගති ස්වභාව මත බවයි.

පුද්ගලයා පවුල, සමාජය එකිනෙක සාමයෙන් යුතු ව රඳවා තබන්නේ මේ ගුණධර්මවලින්. සමාජය පමණක් නොවේ ලෝකය ම අවුල් කළ හැකි තරම් පවිටු ස්වභාවයක් මිත්‍රත්වය වියැකුණු තැන පවතිනවා. ඒ නිසා ඕනෑ ම සමාජ සංස්ථාවක් බිඳ වැටිය හැකි ආකාරයේ විස්තීර්ණ බවක් එහි තිබෙන්නේ. මිත්‍රත්වය ඇති කර ගැනීම මෙන් ම එය අකලංක ව පවත්වා ගැනීම සඳහාත් ක්‍රියා කළ යුතු බවයි ඉන් ගම්‍ය වනුයේ. නමුත් මෙහි තේරුම් ගත යුතු ම සංසිද්ධිය නම් කලයාණ මිතුරන් කිසි විටෙක ගැටුම්කාරී හෝ ව්‍යසනකාරී තත්වයන්ට ලෙහෙසියෙන් පත් නොවන අය වීම. ඒ නිසයි එය සම්පත්තියක් වනුයේ. අප ජීවිතවලට සැබෑ ආලෝකයක් වනුයේ. බුද්ධ දේශනාව ඉතා සාවධාන ව විමසා බැලූ විට මෙහි ඇති විශ්වීය සත්‍යතාව මනාව ප්‍රක්ෂේපණය වනවා.

රටේ සෑම සමාජ ආයතනයක් ම ප්‍රබුද්ධ ගති ගුණ තිබෙන මානව සම්පතින් පුරවා

මිත්‍රත්වය යහමග මෙන් ම අයහපත් මඟට ද හේතු කරවන පුද්ගල චරිත අපට හමුවනවා. වචී පරම හෙවත් වචනයෙන් පමණක් මිතුදම පෙන්වන අය, අඤ්ඤදත්තු හර හෙවත් තම පෞද්ගලික වාසියට පමණක් සිටින මිතුරන් වැනි අය යහපත් මිතුරන් වන්නේ නැහැ. අපාය සහායක මිතුරන් කිසිදා ඇසුරු කළ යුතු නොවන්නේ ඔවුන් සංසාර ගමන පවා අවුල් කළ හැකි අය වන නිසා,

ගැනීමත් අවශ්‍යතාවක්. රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, ප්‍රජා ආයතන, විශ්වවිද්‍යාල, පාසල් ඇතුළු සියලු සමාජ බල ගැන්වීම් ආයතන යහපත් ගති ගුණවලින් පෝෂණය නොවීම නිසයි ගැටලු මතු වන්නේ. ආයතනයක ඉහළ සිට පහළටත් පහළ සිට ඉහළටත් මේ ගුණධර්ම ගලනය විය යුතුයි. ආයතනයක ප්‍රධානීන් පවා ක්‍රියා කළ යුත්තේ තම සේවක පිරිස හා සුහද ව, මිත්‍රශීලී ව හා හෘදයාංගම ව. බුදුන් වහන්සේ සිඟාලෝවාද සූත්‍ර දේශනාවෙන් මේ ගැන බොහෝ කරුණු දේශනා කර තිබෙනවා.

එහෙත් ලෝකය ගලා යන්නේ කුමන දිශාවට ද යන්න විමසා නොබැලීමයි කාලීන ගැටලුව. මෙතරම් වටිනා ධර්ම මාර්ගයක් අප නිසි පරිදි, මනෝගෝචර ව තේරුම් නොගැනීම ම අප, භාග්‍යය අභාග්‍ය කර ගැනීමක්. වර්තමානයේ බොහෝ සමාජ මාධ්‍ය ජාලා ඉතා සක්‍රීය ව ලොව ව්‍යාප්ත ව තිබෙනවා. වැඩි දෙනකු ඒවාහි නිමග්න ව කාලය කා දැමීම සුලබ දසුනක්. මෙය නිවැරදි මිත්‍ර සන්ධාන පැවැත්මකට අහිතකර තත්ත්වයක්.

පටිටු අදහස් හා සංකල්ප බැහැර හැරීමෙන් ම කලයාණ මිත්‍රත්වය අපට ළඟා වනවා. මිනිසා, ගහකොළ පරිසරය සේ ම සතා සීපාවා කෙරෙහි ද කලයාණ මිත්‍රත්වය ඇති කර ගැනීමයි දහම අපට පෙන්වා දෙන්නේ. එය නුවණින් විමසා බලා සකස් කර ගත යුත්තක්. බුදු දම් මඟ සත්‍යවාදී ව පිය නැඟීමයි ඒ සඳහා පිටුබලය වන්නේ.





# තීරුබද්දේ සද්දේ

නිහාල් පීරිස්

ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පසුගිය ජනවාරි මාසයේ එම ධුරයට පත් වූයේ ජනාධිපතිවරණයෙන් විශිෂ්ට ජයක් ලබමින්. ඔහු ජනාධිපති ලෙස පත් වී වැඩි කාලයක් නැතත් ඔහුගේ ජනප්‍රියත්වය අඩු වීමට පටන්ගෙන ඇති බවක් පසුගිය දිනවල මාධ්‍යවල වූයේ ඔහු විසින් ක්‍රියාත්මක කරන ලද ඇතැම් මතභේදාත්මක ප්‍රතිපත්තිවලට ජනතා ප්‍රසාදයක් නොමැතිවීමෙන්.

ට්‍රම්ප් ජනාධිපතිවරයා විසින් ගන්නා ලද එක් තීරණයක් වූයේ වෙනත් රටවලින් ඇමරිකාවට ගෙන්වනු ලබන භාණ්ඩ සඳහා වන තීරුබදු ඉහළ දැමීම. මේ ආකාරයෙන් ඇමරිකාවට ආනයනය කරනු ලබන සියලු ම භාණ්ඩ සඳහා සියයට 10ක තීරුබදු අය කිරීමට තීරණය කරන ලද අතර ඇතැම් රටවලින් ගෙන්වන භාණ්ඩ වෙනුවෙන් ඊට වැඩි තීරුබදු පැනවුණා. ශ්‍රී ලංකාවෙන් ආනයනය කරන භාණ්ඩ සඳහා අය කිරීමට නියමිත වූ බද්ද වූයේ සියයට 44ක්. වැඩියෙන් ම තීරුබදු පැනවූ රටවල් 10 අතරට ශ්‍රී ලංකාව ද අයත් වුණා.

ට්‍රම්ප් පරිපාලනය තීරුබදු පනවන ලද රටවල් අතර ඉහළින් ම සිටියේ චීනය. චීනයෙන් ඇමරිකාවට ගෙන්වන භාණ්ඩ සඳහා සමස්තයක් ලෙස සියයට 145ක තීරුබදු පනවා තිබෙනවා. තම රටවලට පැනවූ තීරුබදු අඩු කර ගැනීමට බොහෝ රටවල් ඇමරිකාව සමග සාකච්ඡා කිරීමට පියවර ගත්තත් චීනය එවැනි පියවරක් ගෙන නැහැ. ඔවුන් අනුගමනය කළේ එකට එක කිරීමේ ප්‍රතිපත්තියක්. ඇමරිකාව සහ චීනය යනු එකිනෙකාට දෙවැනි වීමට අකැමැති, බොහෝ ක්ෂේත්‍රවල තරගයක යෙදී සිටින රටවල් දෙකක් බව නොරහසක්.

ට්‍රම්ප්ගේ තීරුබදු පැනවීම ඉදිරියේ චීනය කළේ ඇමරිකාවෙන් චීනයට ගෙන්වන භාණ්ඩ සඳහා අය කරන තීරුබදු ද ඉහළ දැමීම. ඇමරිකානු භාණ්ඩ සඳහා අය කරන තීරුබදු සියයට 125ක් දක්වා ඉහළ දැමීමට චීනය පියවර ගත්තා. ඇමරිකාවෙන් ඇණවුම් කර තිබූ බොයිං වර්ගයේ ගුවන් යානා රැසක් ආපසු ඇමරිකාවට එවීමට ද චීනය පියවර ගෙන තිබුණා.

ජනාධිපති ට්‍රම්ප් මේ ආකාරයෙන් තීරුබදු ඉහළ දැමීමට තීරණය කළේ හේතු කිහිපයක් නිසා. ඇමරිකානු ජනතාව විසින් වැඩි වැඩියෙන් ඇමරිකානු භාණ්ඩ මිල දී ගනු දැකීමයි ඔහුගේ බලාපොරොත්තුව. තීරුබදු ඉහළ දැමූ විට ආනයනික භාණ්ඩවල මිල ඉහළ යාමක් සිදු වන අතර ජනතාව ඒවා මිල දී ගැනීම අඩුවීමෙන් ඇමරිකානු නිෂ්පාදන සඳහා ඉල්ලුම වැඩි වී නිෂ්පාදන ක්ෂේත්‍රයේ වර්ධනයක් සිදුවනු ඇතැයි ද එහි ආයෝජන ඉහළ යනු ඇතැයි ද ට්‍රම්ප් අපේක්ෂාව කරනවා.

ට්‍රම්ප්ගේ තීරුබදු ප්‍රතිපත්තියට බල පෑ තවත් හේතුවක් වන්නේ ඇමරිකාව සහ වෙනත් රටවල් අතර වෙළෙඳාමෙහි පවතින අවාසිදායක පරතරය අඩුකර ගැනීම. බොහෝ රටවල් ඇමරිකාවට විශාල වශයෙන් භාණ්ඩ විකුණුවත් ඇමරිකාවෙන් මිල දී ගන්නේ අඩුවෙන්. මේ නිසා ඇමරිකාව යම් අවාසිදායක තත්ත්වයකට මුහුණ දී සිටිනවා.

ඇමරිකාව පසුගිය වසරේ චීනයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 440ක භාණ්ඩ මිල දී ගෙන තිබුණත් චීනය ඇමරිකාවෙන් මිල දී ගෙන ඇත්තේ ඇමරිකානු ඩොලර් බිලියන 145ක භාණ්ඩ ප්‍රමාණයක් පමණයි. ට්‍රම්ප් පවසන්නේ ඇමරිකාව රවටා ඇති බව සහ සොරා කා ඇති බව. තීරුබදු ඉහළ දැමූ විට අනෙක් රටවලින් ඇමරිකාවට එන භාණ්ඩ ප්‍රමාණය අඩු වන විට ඉහත කී අවාසිදායක පරතරය අඩු වනවා.

මේ තීරු බදු නිසා ඇමරිකානු භාණ්ඩාගාරයට ලැබෙන අමතර මුදල් යොදා ගනිමින් ජනතාවට සහන සැලසීමට ද රජයේ අලුත් ව්‍යාපෘති දියත් කිරීමට ද බලාපොරොත්තු වන බව ට්‍රම්ප් පවසනවා. කැනඩාව, මෙක්සිකෝව, චීනය යන රටවලට එරෙහි ව ට්‍රම්ප් පැනවූ ඇතැම් බදුවලට හේතු වූයේ එම රටවලින් නීති විරෝධී ආකාරයෙන් ඇමරිකාවට මත්ද්‍රව්‍ය විශාල වශයෙන් ඇතුළු වීම. මෙය වැළැක්වීම සඳහා එම

රටවල් මත පීඩනයක් එල්ල කිරීම එම බදු පැනවීමෙහි අරමුණ වුණා. කැනඩාව සහ මෙක්සිකෝව මේ සම්බන්ධයෙන් පියවර ගැනීමට එකඟ වී තිබෙනවා.

ට්‍රම්ප් විසින් පනවන ලද බදු වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වීමට නියමිත ව තිබුණේ අප්‍රේල් 9 දින සිට. එහෙත් සියයට 10යේ මූලික තීරු බදු ප්‍රමාණය හැර සෙසු බදු අය කිරීම මාස තුනකින් කල් දැමීමට ට්‍රම්ප් පරිපාලනය පියවර ගත්තා. මේ නව බදු ප්‍රතිපත්තියට එරෙහි ව දේශීය වශයෙන් මෙන් ම ජාත්‍යන්තරයෙන් ද යම් විරෝධයක්, අප්‍රසාදයක් පළ වීම ද ඊට හේතුවක්. චීනයට එරෙහි බදු අඩු කිරීමක් සිදු වී නැහැ.

ට්‍රම්ප්ගේ ඉහළ තීරු බදු නිසා රටේ භාණ්ඩ මිල ඉහළ යාමක් සිදු වනු ඇති බව ආර්ථික විශේෂඥයන් පෙන්වා දුන්නා. රටට ආනයනය කරන නිමි භාණ්ඩවල මිල පමණක් නොව රටේ නිෂ්පාදනය කරන ඇතැම් භාණ්ඩවල මිල පවා ඉහළ යාමට නියමිත ව තිබුණා. ඒ, මේ භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය බොහෝ විට ගෙන්වන්නේ වෙනත් රටවලින් බැවින්.

මෙවැනි තත්ත්වයක ජනතාවගේ ජීවන වියදම විශාල වශයෙන් ඉහළ යාමේ අවදානමක් තිබුණා. ජීවන වියදම ඉහළ යාම කාලයක සිට ඇමරිකානුවන් මුහුණ දී සිටින ගැටලුවක්. පසුගිය වසරේ පැවති ජනාධිපතිවරණයේදී හිටපු ජනාධිපති ජෝ බයිඩන් පරාජය වීමට මෙය ද හේතුවක්.


මේ තීරුබදු නිසා ලෝක ආර්ථිකයේ මෙන් ම ඇමරිකානු ආර්ථිකයේ ද පසුබෑමක් සිදුවිය හැකි බවට අනාවැකි පළවන්නට වුණා. 2025 වසරේ ඇමරිකානු ආර්ථිකය සියයට 2.7කින් වර්ධනය වනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පසුගිය ජනවාරි මාසයේ සඳහන් කර තිබුණත් ඔවුන්ගේ අලුත් ම පුරෝකථනවලින් පැවසුණේ එය සියයට 1.3 දක්වා පහත වැටෙනු ඇති බව.

ලෝක ආර්ථිකය සියයට 3.3කින් වර්ධනය වනු ඇතැයි මූල්‍ය අරමුදල කලින් පුරෝකථනය කර තිබුණත් දැන් ඔවුන් පවසන්නේ එය සියයට 2.8ක් පමණක් වනු ඇති බව. ට්‍රම්ප්ගේ තීරුබදු ප්‍රතිපත්තියට විවිධ පාර්ශ්ව වෙතින් විරෝධයක් එල්ල වුයේ මෙවැනි තත්ත්වයක. ට්‍රම්ප්ගේ පක්ෂය වන රිපබ්ලිකන් පක්ෂයේ ම ඇතැමුන් පවා මේ බදු ප්‍රතිපත්තියට සියයට සියයක් එකඟ වූයේ නැහැ.

**තීරුබදු ක්‍රියාත්මක කිරීම මාස තුනකින් කල් දමා තිබෙන පසුබිමක බදු සම්බන්ධයෙන් ඇමරිකාව සමග සාකච්ඡා කර යම් පියවර ගැනීමට අදාළ රටවලට හැකියාව පවතිනවා. ඒ අනුව මාස තුනෙන් පසු මුලින් පැනවූ බදුවල යම් අඩු වීමක් සිදු වනු ඇතැයි යන්න අපේක්ෂාවක්.**

ට්‍රම්ප්ගේ ඇතැම් ප්‍රතිපත්තිවලට එරෙහි ව රටේ විවිධ නගරවල ජනතාව දස දහස් ගණනින් වීදි බසිමින් විරෝධතා දක්වන ආකාරය ද දැක ගන්නට ලැබුණා. අලුත් තීරු බදු ප්‍රතිපත්තිය ද ජනතා විරෝධයට බඳුන් වූ කාරණයක්. ඊට අමතර ව සංක්‍රමණිකයන්ට අදාළ ඇතැම් ප්‍රතිපත්ති ද රාජ්‍ය සේවකයන් ඊකියාවලින් ඉවත් කිරීමේ ප්‍රතිපත්ති ද විරෝධයට ලක් වුණා. රජයේ සේවකයන් ඉවත් කිරීමට ට්‍රම්ප් පරිපාලනය ක්‍රියා කළේ රාජ්‍ය සේවය වඩාත් කාර්යක්ෂම කිරීමේ වැඩපිළිවෙළක් යටතේ.

තීරුබදු ක්‍රියාත්මක කිරීම මාස තුනකින් කල් දමා තිබෙන පසුබිමක බදු සම්බන්ධයෙන් ඇමරිකාව සමග සාකච්ඡා කර යම් පියවර ගැනීමට අදාළ රටවලට හැකියාව පවතිනවා. ඒ අනුව මාස තුනෙන් පසු මුලින් පැනවූ බදුවල යම් අඩු වීමක් සිදු වනු ඇතැයි යන්න අපේක්ෂාවක්.





සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි



## කොරියානු ආණ්ඩු පෙරැළිය

දකුණු කොරියාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය හිටපු ජනාධිපති යුන් සුක් යෙඕල්ට එරෙහි දෝෂාභියෝගයක් 8-0 ඡන්දයකින් ඒකමතික ව තහවුරු කරමින් ඔහු ධුරයෙන් ඉවත් කළා. දකුණු කොරියාවේ ප්‍රධාන විපක්ෂ පක්ෂ නායක ලී ජේ-මියුන්ග් සිය පක්ෂ නායකත්වයෙන් ඉවත් ව ජනාධිපති ධුරය සඳහා ඉදිරිපත් වන බව ප්‍රකාශ කළ අතර දකුණු කොරියාවේ කම්කරු අමාත්‍ය කිම් මූන්-සූ ද තම අපේක්ෂකත්වය ප්‍රකාශ කර තිබෙනවා. ඒ අනුව ජූනි 03 දින දකුණු කොරියාව හදිසි ජනාධිපතිවරණයක් පවත්වන්නටයි නියමිත.



## ගාසා භීෂණය ඉහළට

මැදපෙරදිග සටන් නව වටයකින් ඇරැඹුණේ 2025 සටන් විරාමය බිඳවැටී ගාසා තීරයේ යුද්ධය නැවත ආරම්භ වීමත් සමග. අප්‍රේල් මාසය වන විට ගාසා තීරයේ යුද්ධයෙන් 52,000කට වැඩි පිරිසක් මිය ගොස් ඇති බව වාර්තා වනවා. නව ඊශ්‍රායෙල හමුදා ප්‍රහාරයකින් ළමයින් 332කට වැඩි පිරිසක් මිය ගොස් 609 දෙනකු තුවාල ලබා ඇති බව යුනිසෙෆ් වාර්තා කළා. එක්සත් ජාතීන්ගේ පලස්තීන සරණාගත සහන ඒජන්සිය (UNRWA) වාර්තා කර තිබුණේ මාස දෙකක ඊශ්‍රායෙල ආධාර අවහිර කිරීම් සහ අඛණ්ඩ බෝම්බ හෙළීම් මධ්‍යයේ පලස්තීන ජාතිකයන් මිලියන 2ක් සිර වී ඇති අතර දරුවන් 'කුසගින්නෙන් නින්දට යන' බව. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය මැදපෙරදිග සම්බන්ධයෙන් වන සාකච්ඡාවට අප්‍රේල් මස රැස්වූ අවස්ථාවේ මහලේකම් ඇන්ටෝනියෝ ගුටරෙස් පැවසුවේ ඊශ්‍රායෙලය සහ පලස්තීනය සඳහා අවසානයේ ඇත්තේ රාජ්‍ය දෙකක විසඳුමක් බව.



## යුක්රේන සටන

2025 අප්‍රේල් මාසය වන විට රුසියානු හමුදා යුක්රේනයේ 20%ක් පමණ අත්පත් කරගෙන තිබුණා. එහිදී සිවිල් වැසියන් 43,610 දෙනකු මිය ගොස් ඇති අතර එරට මිලියන 41ක් වූ ජනගහනයෙන් මිලියන 8ක් පමණ අභ්‍යන්තර ව අවතැන් වී සිටියා. රටින් පළා ගොස් තිබුණා මිලියන 8.2කට වැඩි පිරිසක්. එය දෙවැනි ලෝක යුද්ධයෙන් පසු යුරෝපයේ විශාලතම සරණාගත අර්බුදය නිර්මාණය කර තිබුණා.

මේ සටන හේතුවෙන් අවම වශයෙන් රුසියානු සොල්දාදුවන් 728,000ක් තුවාල ලබා හෝ මිය ගොස් හෝ ඇති බවත් යුක්රේන වැසියන් 70,000ක් මිය ගොස් 120,000ක් තුවාල ලබා ඇති බවත් ඇතැම් ඇස්තමේන්තු පෙන්වා දෙනවා.




## කාශ්මීර් ප්‍රහාරය

ඉන්දියාවේ ජම්මු කාශ්මීර් ප්‍රාන්තයේ වඩාත් ම දර්ශනීය ස්ථානයක් වන ශ්‍රීනගර් නුවර සිට කිලෝමීටර් 50ක් දුරින් පිහිටි පහල්ගම් ප්‍රදේශයේ මිටියාවතකදී පුද්ගලයන් 26 දෙනකු 2025 අප්‍රේල් 22 දින ඝාතනය කෙරුණා. සටන්කාමීන් පස්දෙනකු සිදු කළ මේ කුරිරු ප්‍රහාරය කලාපයේ සාපේක්ෂ සන්සුන්භාවය බිඳ දමා, ජනප්‍රිය සංචාරක ගමනාන්තයක් භීතියේ මර්මස්ථානයක් බවට පත් කෙරුණා. මේ කුරිරු ප්‍රහාරය හේතු වුණේ න්‍යෂ්ටික බලයෙන් සන්නද්ධ ප්‍රතිවාදීන් වන ඉන්දියාව සහ පාකිස්තානය අතර ඉපැරැණි විරෝධය නව වටයකින් ඇරැඹීමට.

ඝන පයින් වනාන්තරවලින් පිටතට පැමිණි තුවක්කුකරුවන් විනෝද චාරිකාවේ යෙදෙමින් සිටි සහ අශ්වයන් පිට නැගී ගමනට සැරසී සිටි පවුල්වලට වෙඩි තබා තිබුණා. ඒ ප්‍රහාරයෙන් පසු ඉන්දීය අගමැති මෝදි හමුදා ප්‍රධානීන්ට නිදහස ලබා දුන්නේ පහල්ගම් ප්‍රහාරයට රිසි ලෙස ප්‍රතිචාර දැක්වීමට. ඒ අනුව පාකිස්තාන මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක, නාවික සහ ගුවන් උපදේශකයන් ඉන්දියාව විසින් නෙරපා හරිනු ලැබුණු අතර තීරණාත්මක දේශසීමා වෙළෙඳ ස්ථානයක් ඇතුළු කාශ්මීරයේ සංචාරක ගමනාන්ත 87න් 48ක් වසා දැමුණා.

ඉන් නොනැවතී ඉන්දු-පාකිස්තාන ගැටුම් ඉතිහාසයේ පළමු වරට තීරණාත්මක ඉන්දු-ජල ගිවිසුම අත්හිටුවීම ද නිවේදනය කළා. මේ ගිවිසුම රටවල් දෙකෙහි ම මිලියන ගණනකගේ ජීවිතවලට බලපාන ලොව විශාලතම ගංගා පද්ධතිවලින් එක් ගඟක ජලය බෙදාගැනීම නිසි ලෙස පාලනය කළ අතර විවෘත ගැටුම් ඇති අවස්ථාවලදී පවා ඉන්දියාව මීට පෙර

කිසි විටෙකත් මේ ගනුදෙනුව 'අත්හිටුවා' තිබුණේ නැහැ. මෙය අත්සන් තැබුණේ 1960 වසරේ.

1947 වසරේදී බෙදී වෙන්වුණු දින සිට ප්‍රධාන යුද්ධ තුනක් කර ඇති දෙරට කිහිපවතාවක් ම දරුණු ගැටුම්වලට ආසන්න වුණා. අප්‍රේල් 30 දින පාකිස්තානය සිරුවෙන් සිටියේ ඉන්දියානු ප්‍රහාරයක් ගැන සූදානමින්.

## සියවස සපුරන ක්වොන්ටම් විද්‍යාව


වත්මන් ලෝකය මුළුමනින් ම උඩුයටිකුරු කරන, විස්මිත විද්‍යා තාක්ෂණ දියුණුවකට මඟ පෙන්වන එක්සත් ජාතීන්ගේ 'ලෝක ක්වොන්ටම් දිනය' අප්‍රේල් 14 දිනයට යෙදී තිබුණා. එදිනට ක්වොන්ටම් යාන්ත්‍ර විද්‍යාවේ 100 වැනි සංවත්සරය ද යෙදී තිබුණු අතර 'ජාත්‍යන්තර ක්වොන්ටම් විද්‍යා හා තාක්ෂණ වර්ෂය' සමරන්නට ද යෙදුණා.

දැනට ලොව ඇති වේගවත් ම ක්වොන්ටම් පරිගණකය Zuchongzhi - 3 නමින් පසුගියදා චීනය නිපදවා තිබුණා. මේ වනවිට ලොව විශාලතම ක්වොන්ටම් පරිගණකය තිබෙන්නේ IBM ළඟ. වඩාත් නිරවද්‍ය පරිගණකය ලෙස කැපී පෙනෙන්නේ ගූගල්හි විලෝ පරිගණකය. සුබ ආරංචිය නම් දැන් අතේ ගෙන යා හැකි අධ්‍යාපනයට උපකාරී වන ක්වොන්ටම් පරිගණක ද නිපදවා ඇති බව.




## උඩු ගුවනට කාන්තාවන් පමණයි

2025 අප්‍රේල් 14 දින බ්ලූ ඔරිජින් ආයතනයට අයත් උප කක්ෂීය අභ්‍යවකාශ පියාසැරිය NS-31 එදා 1963 වසරේදී වැලන්ටිනා ටෙරෙෂ්කෝවාගේ වොස්ටොක්-6 ඒකල මෙහෙයුමෙන් පසු සිදු කළ පළමු කාන්තා අභ්‍යවකාශ පියාසැරිය සම්පූර්ණ කළා. NS-31 උඩු ගුවන් සවාරියට ලෝරන් සැන්චෙස්, අයිෂා බෝව්, කෙරියැන් ෆ්ලින්, ගේල් කිං, අමන්ඩා න්ගුයෙන් සහ කේටි පෙරී ඇතුළු ජනකාන්ත කාන්තාවන් හය දෙනකු සහභාගි වුණා.




## සිංහ රාශියෙන් පිටසක්වල ජීවය

ජේම්ස් වෙබ් අභ්‍යවකාශ දුරේක්ෂය භාවිත කරන විද්‍යාඥයන් K2-18 b නම් බාහිර ග්‍රහලෝකයක ජීවය පැවැතිය හැකි බව බොහෝදුරට සනාථ වන සලකුණු ප්‍රථම වරට හඳුනා ගත්තා. මේ ග්‍රහලෝකය වෙතින් පෘථිවියේදී ජීවීන් විසින් නිපදවන ඩයිමීතයිල් සල්ෆයිඩ් (DMS) සහ ඩයිමීතයිල් ඩයිසල්ෆයිඩ් (DMD) යන වායු දෙකක අංශු සොයා ගැනීමට ඔවුන් සමත් ව තිබෙනවා.

සිංහ රාශිය හෙවත් ලියෝ තාරකා මණ්ඩලයේ ආලෝක වර්ෂ 124ක් දුරින් පිහිටා ඇති K2-18 b ග්‍රහලෝකය, පෘථිවිය මෙන් 8.6 ගුණයක ස්කන්ධයක් දරන්නක්. එය සිය තාරකාවේ සිට 'ජීවීන්ට වාසයට සුදුසු කලාපයේ' කක්ෂගතවයි ඇත්තේ. සොයාගත් මේ වායු නිසා පෘථිවියේ සාගරවලට සමාන ක්ෂුද්‍රජීවී ජීවයෙන් පොහොසත් ග්‍රහලෝකයක් ලෙස පෙන්නුම් කළ හැකි බව පර්යේෂකයන් යෝජනා කරනවා.

## සියවසකට පසු ආ යෝධ දැල්ලා

වසර 100කට පසු පළමුවරට දකුණු අත්ලාන්තික් සාගරයේදී දැවැන්ත දැල්ලකු රූගත කරගන්නට විද්‍යාඥයන්ට හැකිවුණා. ඒ අනුව සෙන්ටිමීටර 30 (අඟල් 12)ක් දිග තරුණ දැල්ලකු දකුණු සැන්ඩ්විච් දූපත් අසළ එසෙක්ස් විශ්වවිද්‍යාලයේ නායකත්වයෙන් යුත් විද්‍යාඥයන් කණ්ඩායමක් විසින් මීටර් 600ක (අඩි 2,000ක) ගැඹුරකදී රූගත කර තිබුණා. මේ විශේෂය මුලින් ම සොයා ගැනුණේ 1925 වසරේදී.

## නැවත උපන් දරුණු වෘකයා



වඳවී ගිය සතුන් නැවත බිහි කරන ඇමරිකාවේ කොලොසල් ජෛව විද්‍යා ආයතනය ඔවුන් ජානමය වශයෙන් වෙනස් කරන ලද රොමුලස්, රෙමස් සහ කලීසි යන දරුණු වෘක Dire wolf පැටවුන් තිදෙනකු බෝ කර ඇති බව නිවේදනය කළා. වඳ වී ගිය දරුණු වෘකයන් ප්ලයිස්ටොසීන් යුගයේ අග සහ හොලොසීන් යුගයේ මුල් අවධියේදී ඇමරිකාවට ආවේණික වූ අතර පළමු නිදර්ශකය සොයා ගැනීමෙන් වසර හතරකට පසු 1858 වසරේදී මේ විශේෂය නම් කර තිබුණා.



## බද්ධ කළ ගර්භාෂයකින් දරුවෙක්

බද්ධ කළ ගර්භාෂයක් ඇති කාන්තාවක් පළමුවරට බිළිඳකුට උපත දුන්නා. දරුවාගේ මව වන 36 හැවිරිදි ග්‍රේස් ඩේවිඩ්සන් ක්‍රියාකාරී ගර්භාෂයක් නොමැති ව උපත ලැබූ අතර 2023 වසරේදී ඇගේ සහෝදරියගේ ගර්භාෂය ලබා ගත්තා.

මෙය එවකට එක්සත් රාජධානියේ එක ම සාර්ථක ගර්භාෂ බද්ධ කිරීම ලෙස වාර්තා වුණා.

එම පුරෝගාමී සැත්කමෙන් ග්‍රේස් ඇගේ පළමු දරුවා බිහි කළේ වසර දෙකකට පසු. ඇය සහ ඇගේ සැමියා වන 37 හැවිරිදි ඇන්ගස් තම දියණියට ග්‍රේස්ගේ සහෝදරියගේ ඒමී යන නම තබා ඇත්තේ ඇය සිය ගර්භාෂය පරිත්‍යාග කළ නිසා.



## නව විශ්වීය උරුම ලේඛන

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) අප්‍රේල් 17 දින එහි විශ්වීය වටිනාකමක් ඇති ලේඛනමය උරුම ලැයිස්තුවට අලුතින් එකතු වූ ලේඛන 74ක් ගැන තතු ප්‍රකාශයට පත් කළා.

මෙයට ඇතුළත් ව තිබුණේ පරිණාමය පිළිබඳ න්‍යාය ඉදිරිපත් කළ බ්‍රිතාන්‍ය ස්වභාව විද්‍යාඥ චාල්ස් ඩාවින්ගේ ලේඛන, රොන්ට්ජන්ගේ මුල් ම එක්ස්රේ සටහන, ආරාබි තාරකා විද්‍යාඥයන්ගේ පුරාණ තරු සටහන් ඇතුළු ව රටවල් 72ක් සහ ජාත්‍යන්තර සංවිධාන 04ක් විසින් ඉදිරිපත් කරන ලද අගනා කෞතුක ලේඛන එකතුවක්. මෙයට ශ්‍රී ලංකාවෙන් එක් කළ 'පානදුරා වාදය' ඇතුළු ලේඛන කිහිපයක් ද ඇතුළත් ව තිබුණා. එක්සත් ජාතීන්ගේ ලේඛනමය උරුමයට පොත්, අත්පිටපත්, සිතියම්, ඡායාරූප සහ ශබ්ද හෝ වීඩියෝ හෝ පටිගත කිරීම් ඇතුළු වාර්තාමය එකතු කිරීම් ඇතුළත්.

බීජිංහි පැවති අර්ධ මැරතන් තරගයකට ලොව පළමුවරට මානව ධාවකයන් සමග හියුමනොයිඩ් රොබෝවරු දුසිම් ගණනක් ද එක් වුණා. චීනයේ රාජ්‍ය අනුග්‍රහයලත් ඊ-ටවුන් නමැති අධි තාක්ෂණික කලාපයක පැවති මේ තරගය සැබෑ ලෝක තත්ත්වය තුළ නවතම ද්විපාද මානවරූපී රොබෝවරුන්ගේ හැකියාව ලොවට පෙන්වූවා.




## රොබෝ මැරතන් කෙළිබිමට

බීජිංහි පැවති අර්ධ මැරතන් තරගයකට ලොව පළමුවරට මානව ධාවකයන් සමග හියුමනොයිඩ් රොබෝවරු දුසිම් ගණනක් ද එක් වුණා. චීනයේ රාජ්‍ය අනුග්‍රහයලත් ඊ-ටවුන් නමැති අධි තාක්ෂණික කලාපයක පැවති මේ තරගය සැබෑ ලෝක තත්ත්වය තුළ නවතම ද්විපාද මානවරූපී රොබෝවරුන්ගේ හැකියාව ලොවට පෙන්වූවා.

මානවයන් බඳු ව ම ඇතැම් රොබෝවරුන්ගේ පය පැකිළී ගිය අතර තවත් රොබෝවරු ආකර්ෂණීය හැකියා පෙන්නුම් කිරීමට සමත් වුණා. විශේෂයෙන් උස ම රොබෝවරයා වන 'ටියැන්ගොං අල්ට්‍රා', තරගය මැද ඇද වැටීමකින් පසුවත් පැය දෙකයි මිනිත්තු 40කින් තරගය අවසන් කළා.


මෙයට කණ්ඩායම් 20ක් පමණ සහභාගි වූ අතර සෙන්ටිමීටර 75 සිට 180 දක්වා උස සහ කිලෝග්‍රෑම් 88 දක්වා බරැති රොබෝවරු එක් ව සිටියා. ඇතැම් රොබෝවරු ස්වයංක්‍රීය ව ධාවනය වූ අතර අනෙක් රොබෝවරු පාලනය කර තිබුණේ දුරස්ථ ව. මේ ඓතිහාසික සිදුවීම මානවරූපී රොබෝවරුන්ගේ කල්පැවැත්ම සහ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමේදී සැලකිය යුතු පියවරක් සනිටුහන් කරන්නක්.



## ඔලිම්පික් යන ක්‍රිකට්

ඉතිහාසයේ පළමු වරට ඔලිම්පික් ක්‍රීඩාව සඳහා 'ක්‍රිකට්' ක්‍රීඩාව ඇතුළත් කිරීමට තීරණය කර තිබෙනවා. ඒ අනුව 2028 වසරේ ලොස් ඇන්ජලීස් නුවර පැවැත්වෙන ඔලිම්පික් උළෙලේදී T20 තරග මාලාවක් ලෙස ක්‍රිකට් ක්‍රීඩාව ද දක්නට ලැබෙනු ඇති.

දකුණු කැලිෆෝනියාවේ පොමොනාහි ෆෙයාග්‍රවුන්ඩ්ස්හි පැවැත්වීමට නියමිත මෙයට කාන්තා සහ පිරිමි කණ්ඩායම් 06ක් ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන බව ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව පවසා තිබෙනවා.




# මාධ්‍ය නිදහසේ ඩිජිටල් භූමිකාව

සෑම වසරක ම මැයි මස 03 දිනය ලෝක මාධ්‍ය නිදහස් දිනය ලෙස සැලකෙනවා. මෙවර ලෝක මාධ්‍ය නිදහස් දිනයේ තේමාව වන්නේ Reporting in the Brave New World; The Impact of Artificial Intelligence on Press Freedom and the Media යන්න. එනම් මාධ්‍ය හා ප්‍රකාශන නිදහසට කෘත්‍රිම බුද්ධිය සිදු කරන බලපෑම පිළිබඳ අවධානය යොමු කරමිනුයි ලෝක මාධ්‍ය නිදහස් දිනය මෙවර ලොව පුරා සමරන්නේ. ඒ පිළිබඳ විමසුමට ලක් කරමින් මැයි මස 'දෙසතිය' කවරයේ කතාබහ සිදු වනවා.

චන්දන මාරසිංහ

ලෝක මාධ්‍ය නිදහස් දිනය යනු මාධ්‍ය නිදහසේ මූලධර්ම සමරන දිනයක්. ලොව පුරා මාධ්‍ය නිදහස ඇගැයීමට, මාධ්‍ය නිදහසට එල්ලවන තර්ජනවලින් එය ආරක්ෂා කිරීමට සහ තම වෘත්තියේ නියැළෙන විට ජීවිත අහිමි වූ මාධ්‍යවේදීන්ට උපහාර දැක්වීමට මේ දිනය හඳුන්වා දී තිබෙනවා. 1991 මැයි මස 03 දින නැමීබියාවේ වින්ඩ්හෝක් නගරයේදී රැස් වූ අප්‍රිකා මාධ්‍යවේදීන්ගේ සංගමය සෑම වසරක ම මැයි 03 දින ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය ලෙස ප්‍රකාශයට පත්විය යුතු බවට යෝජනා කළා. එය හැඳින්වූයේ 'වින්ඩ්හෝක් ප්‍රකාශය' ලෙස. යුනෙස්කෝ (එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය) මහා සම්මේලනයේ 26 වැනි සැසිවාරයේදී එය සම්මත කිරීමෙන් අනතුරු ව එහි නිර්දේශ සහිත ව එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කිරීමෙන් පසු 1993 වසරේදී මහා මණ්ඩලය විසින් ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය ප්‍රකාශයට පත් කරනු ලැබුවා.

1997 වසරේදී නිර්මාණය කළ ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ ත්‍යාගය හිමිවන්නේ ලොව ඕනෑ ම ස්ථානයක මාධ්‍ය නිදහස වෙනුවෙන් කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන් මාධ්‍යවේදියකුට. නිදහස් මාධ්‍ය වෙනුවෙන් හඬනගා 1986 දෙසැම්බර් 17 දින කොලොම්බියාවේදී ඝාතනය වූ Guillermo Canoට ගෞරවයක් ලෙස මෙය ඔහු නමින් නම්කර තිබෙනවා.

යුනෙස්කෝ සංවිධානයට අනුව මාධ්‍යවේදියකු යනු මාධ්‍ය ක්‍රියාකාරකම්වල නිරත ව සිටින අයෙක්. අන්තර්ජාලයේ ක්‍රියාකාරී වන මාධ්‍යවේදීන් ද මේ අතරට අයත්. යුනෙස්කෝ මහා සම්මේලනයේ 29 වැනි සැසිවාරයේදී මාධ්‍යවේදීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හෙළා දැකීමේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එවැනි ප්‍රචණ්ඩක්‍රියා දක්වා තිබෙන්නේ සමාජයට එරෙහි අපරාධ ලෙස. සන්නිවේදන සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන මගින් ද 2024 වසරේදී යුනෙස්කෝවේ මේ ස්ථාවරය පිළිගෙන තිබෙනවා. සමීක්ෂණ වාර්තා පෙන්වාදෙන ආකාරයට 1993 වසරේ සිට ලොව පුරා ඝාතනය වී තිබෙනවා මාධ්‍යවේදීන් 1760ක්.

මාධ්‍ය නිදහස සඳහා වන ඓතිහාසික අරගලය සියවස් ගණනාවක ඉතිහාසයකට හිමිකම් කියන්නක්. කැටෝ යන අන්වර්ථ නාමයෙන් ලිපි සම්පාදනය කළ Jhon Trenchard සහ Thomas Gordon පූර්ව විප්ලවවාදී ඇමරිකා චින්තනයට බලපෑම් කර තිබෙනවා. ස්වීඩනය මාධ්‍ය නිදහස ව්‍යවස්ථානුකූල ව සහතික කර ඇත්තේ 1966 වසරේදී. වරින් වර ඇතිකරගත් එකඟතාව මත ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ ව ජාත්‍යන්තරයේ අවධානය යොමු වී තිබෙනවා. ඇමරිකා රාජ්‍ය දෙපාර්තමේන්තුව පෙන්වාදෙන ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ප්‍රධාන අංගයක් ලෙසට එය අර්ථකථනය කර තිබෙනවා. අදහස් හුවමාරුව යනු වගකිවයුතු පාලනයක පදනමක්. ලොව පුරා සිටින මාධ්‍යවේදීන්ගේ කාර්යභාරය අගය කරන බව ද ඇමරිකා රාජ්‍ය දෙපාර්තමේන්තුව පෙන්වා දී තිබෙනවා. ගෝලීය අන්තර්ජාල නිදහස් කාර්ය සාධක බලකාය හඳුන්වා දීමට ද 2006 වසරේදී ඇමරිකාව පියවර ගෙන තිබෙන්නේ මේ පිළිබඳ අවධානය යොමු කිරීමට.



## මාධ්‍ය හා කෘත්‍රිම බුද්ධිය භාවිතය

මෙවර ලෝක මාධ්‍ය නිදහස් දිනයේ තේමාව වන්නේ 'නිර්භීත නව ලෝකයේ වාර්තාකරණය; මාධ්‍ය නිදහස සහ මාධ්‍ය කෙරෙහි කෘත්‍රිම බුද්ධියේ බලපෑම' (Reporting in the Brave New World; The Impact of Artificial Intelligence on Press Freedom and the Media) යන්න. මේ තේමාවෙන් අවධානය යොමු වන්නේ පුවත්පත් කලාව, මාධ්‍ය සහ මානව හිමිකම් ක්ෂේත්‍රයේ කෘත්‍රිම බුද්ධියේ පරිවර්තනීය භූමිකාව ගවේෂණය කිරීමට. මේ වන විට කෘත්‍රිම බුද්ධිය ඉගෙනුම් පද්ධති අන්තර්ගත උත්පාදනය, තොරතුරු විශ්ලේෂණය සහ ඉදිරිපත් කිරීම වැනි කාර්ය සඳහා ද දායක වී තිබෙනවා. තොරතුරු රැස්කිරීම, ප්‍රවේශ වීම සහ තොරතුරු බෙදා හැරීමේ ක්ෂේත්‍රවල ආචාරධර්ම හා වගකීම වැනි අංශ පිළිබඳ යළිත් අවධානය යොමු කිරීමටයි මේ නිසා සිදු ව තිබෙන්නේ. කෘත්‍රිම බුද්ධිය මගින් නව ප්‍රවණතා මෙන් ම නව අභියෝග හඳුන්වාදීම ඊට හේතු වී තිබෙනවා. ගෝලීය ඩිජිටල් වේදිකා ඔස්සේ නිර්මාණශීලීත්වය පෝෂණය කිරීම, භාෂා පරිවර්තන මෘදුකාංග හා අන්තර්ගත නිර්මාණය වැනි පහසුකම් මගින් මාධ්‍යවේදීන්ට පුළුල් අවකාශයක් නිර්මාණය වීම මෙහි යහපත් ප්‍රවණතා. ගෝලීය වශයෙන් අදහස් හා තොරතුරු බෙදා හැරීම වේගවත් කර ඇති අතර එය හේතු වී තිබෙන්නේ ප්‍රකාශනයේ නිදහසට ද. කෙසේ වෙතත් ප්‍රකාශනයේ නිදහස ඇතැම් විට පුද්ගල ආතතිය වැඩි කිරීමට ද හේතුවිය හැකියි. එසේ වන්නේ කෘත්‍රිම බුද්ධිය මගින් විවිධ කරුණු නිර්මාණය කළ හැකි බැවින්. එහෙත් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතිවලට අනුකූල ව කෘත්‍රිම බුද්ධිය භාවිත කළ හැකි නම් ඉන් වඩාත් සාර්ථක ප්‍රතිඵල අත්කර ගත හැකියි. නව තාක්ෂණික අවස්ථා මෙන් ම අවදානම ළඟා කිරීම සහ මිනිසාට සමාන අන්තර්ගත ජනනය කිරීමට කෘත්‍රිම බුද්ධියට හැකියාව තිබෙනවා. එයින් බලපෑම් එල්ල විය හැක්කේ තොරතුරුවල ගුණාත්මකභාවයට සහ විවිධත්වයට.

මාධ්‍යවේදීන්ට නව අවස්ථා විවර කර ගැනීමට අවකාශ ලැබීම, අතිවිශාල තොරතුරු ප්‍රමාණයක් සමග කාර්යක්ෂම ව අන්තර් ක්‍රියාකාරකම්වල නිරත විය හැකි වීම, විවිධ මූලාශ්‍ර ගවේෂණය පහසුවීම හේතුවෙන් සෙවීමේ සහ වාර්තා කිරීමේ විෂය පථය පුළුල් වීම, ස්වයංක්‍රීය කරුණු පරීක්ෂා කිරීම සහ දත්ත පරීක්ෂාව, පරිවර්තනය සහ ප්‍රවෘත්ති ලිපි සාරාංශ කිරීම ඔස්සේ අන්තර්ගත නිර්මාණය වැඩිදියුණු කිරීම කෘත්‍රිම බුද්ධිය භාවිතයේ වාසිදායක තත්ත්ව. කෙසේ වෙතත් මෙහි සදාචාරාත්මක පාර්ශ්වය වෙනුවෙන් නීතිමය ප්‍රමිති ආරක්ෂා කළ යුතුයි. මාධ්‍යකරණයේදී මතුවිය හැකි බලපෑම් අවම කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය විසින් කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය සමග සහයෝගයෙන් කෘත්‍රිම බුද්ධියට සම්බන්ධ මෙවලම්වල මාර්ගගත ගබඩාවක් සංවර්ධනය කර තිබෙනවා.

මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව ඔස්සේ කෘත්‍රිම බුද්ධිය භාවිතයේ අවදානම සහ අයහපත් පාර්ශ්ව පාලනය කිරීමට හැකි වීම ඉතා වැදගත් කාරණයක්. මෙහිදී ඩිජිටල් වේදිකා පාලනය සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදීම මූලික අවශ්‍යතාවක්. යුනෙස්කෝ සංවිධානය හඳුන්වා දී ඇති එවැනි මාර්ගෝපදේශ මගින් කෘත්‍රිම බුද්ධියෙන් මතුවිය හැකි අපහසුතා පාලනය කළ හැකියි. 2025 ලෝක මාධ්‍ය නිදහස් දිනයේ තේමාව මේ වෙනුවෙන් වෙන් කිරීමෙන් පැහැදිලි වන්නේ කෘත්‍රිම බුද්ධියේ මෙවැනි යහපත් හා අයහපත් අංග මනා ලෙස කළමනාකරණය කළ යුතු බව.

ඩිජිටල් වේදිකා සඳහා මාර්ගෝපදේශ හඳුන්වා දීම, කෘත්‍රිම බුද්ධියේ හරය වන වේගයෙන් විකාශය වන ඩිජිටල් ව්‍යාප්තිය කළමනාකරණය සඳහා ශක්තිමත් ගෝලීය රාමුවක් සැකසිය යුතු

ඩිජිටල් වේදිකා සඳහා මාර්ගෝපදේශ හඳුන්වා දීම, කෘත්‍රිම බුද්ධියේ හරය වන වේගයෙන් විකාශය වන ඩිජිටල් ව්‍යාප්තිය කළමනාකරණය සඳහා ශක්තිමත් ගෝලීය රාමුවක් සැකසිය යුතු වනවා. මේ මාර්ගෝපදේශ යොදා ගත යුත්තේ මානව හිමිකම්වලට ගරු කරන සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ආරක්ෂා කරන ආකාරයෙන්. ලෝක මාධ්‍ය නිදහස් දිනය පිළිබඳ මෙවර සමුළුවේදී මේ උපායමාර්ගික මාර්ගෝපදේශ පිළිබඳ අවධානය යොමු කෙරෙනවා.

වනවා. මේ මාර්ගෝපදේශ යොදා ගත යුත්තේ මානව හිමිකම්වලට ගරු කරන සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ආරක්ෂා කරන ආකාරයෙන්. ලෝක මාධ්‍ය නිදහස් දිනය පිළිබඳ මෙවර සමුළුවේදී මේ උපායමාර්ගික මාර්ගෝපදේශ පිළිබඳ අවධානය යොමු කෙරෙනවා. සමුළුව මෙවර පැවැත්වෙන්නේ මැයි 05-07 දක්වා බ්‍රසල්ස්හිදී. එහිදී ගෝලීය ප්‍රජාවට මාධ්‍ය සහ මාධ්‍යය කෙරෙහි කෘත්‍රිම බුද්ධියේ බහුවිධ බලපෑම, ජනමාධ්‍ය විකාශ භූමිකාව සහ විශ්වාසදායක තොරතුරු හැඩගැස්වීමේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව අවධානය යොමු කෙරෙනු ඇති.

තාක්ෂණයේ පරිවර්තනය, මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සහ ඩිජිටල් යුගයේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම මෙන් ම කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ අපකීර්තිමත් සිදුවීම් නැතිකර දැමීම මෙවර සමුළුවේ සාකච්ඡාවට ගැනෙන ප්‍රධාන කාරණා. සමාජයේ පහළ ස්ථරවල සිටින කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කරමින් පුළුල් මෙහෙයුම් සඳහා කෘත්‍රිම බුද්ධියේ දායකත්වය සහිත ඒකාබද්ධ වැඩසටහන් ආරම්භ කළ හැකියි. වැරදි තොරතුරු ව්‍යාප්තිය පාලනය සඳහා මාධ්‍ය මෙන් ම ජනතාවගේ තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම ගැන ද අවධානය යොමු කෙරෙනු ඇති. මාධ්‍යවේදීන් සඳහා සුදුසු වැඩසටහන් පැවැත්වීම ගැන ද සාකච්ඡා කිරීමට නියමිත ව තිබෙනවා.

Freedom House ආයතනය පෙන්වාදෙන ආකාරයට ඔත්තු මෘදුකාංග ඇතුළු බාහිර නිරීක්ෂණ තාක්ෂණයේ ගෝලීය ව්‍යාප්තිය මානව හිමිකම් සහ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වී තිබෙනවා. ඔවුන්ගේ වාර්ෂික වාර්තාව මත Freedom on the Vet පෙන්වා දෙන ආකාරයට මොරොක්කෝව, උගණ්ඩාව, සවුදි අරාබිය, ඉන්දියාව හා මෙක්සිකෝව ද මෙවැනි මෘදුකාංග හෝ නවීන තාක්ෂණය භාවිත රටවල්. මෙවැනි වාණිජ මෘදුකාංග අයහපත් ලෙස භාවිත කිරීම වැළැක්වීමට අපොහොසත් වූ ආයතනවලට එරෙහි ව ඇමරිකාව පියවර ගෙන තිබෙනවා. මාධ්‍යවේදීන් පිළිබඳ නිරීක්ෂණය කිරීමටත් මේ තාක්ෂණය යොදාගත හැකි වීම ඉදිරිගාමී පියවරක්.

## ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකය

රටවල මාධ්‍ය නිදහස පිළිබඳ වාර්තා තක්සේරු මත දේශ සීමා නොමැති වාර්තාකරුවන් (Reporters Without Borders) 2002 වසරේ සිට වාර්ෂික ව ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකය හඳුන්වා දී තිබෙනවා. මෙමගින් එක් එක් රටවල මාධ්‍යවේදීන්, ප්‍රවෘත්ති සංවිධාන සහ ජාල පරිශීලකයන්ට ඇති නිදහස පිළිබඳ තක්සේරුවක් ලබා ගත හැකි වීම විශේෂත්වයක්. කාණ්ඩ පහක් අනුවයි එහි ඇගයීම් කෙරෙන්නේ. එනම් දේශපාලන සන්දර්භය, නීතිමය රාමුව, ආර්ථික සන්දර්භය, සමාජ සංස්කෘතික සන්දර්භය හා ආරක්ෂාව ආදී කාරණා ඊට අයත්. පසුකාලීන ව මාධ්‍ය ස්වාධීනත්වය, ස්වයංවාරණය, ව්‍යවස්ථාදායක රාමුව සහ මාධ්‍ය අවකාශයේ අදහස් නියෝජනය වැනි කරුණු ද මෙහිදී අවධානයට ලක් කර තිබෙනවා. මේ සඳහා දත්ත රැස් කර ගැනෙන්නේ ප්‍රශ්නාවලියකින්. එහිදී රාජ්‍ය නොවන සංවිධාන 18ක්, වාර්තාකරුවන් 180ක්, මාධ්‍යවේදීන්, පර්යේෂකයන් හා නීතිවේදීන් මීට සහය ලබා දෙනවා.

2024 වසරේ ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකය අනුව ලොව මාධ්‍ය නිදහස සහිත පළමු රට වන්නේ නෝර්වේ රාජ්‍යය. ඉන්පසු පිළිවෙළින් දෙවැනි හා තුන් වැනි ආදී ලෙස ඩෙන්මාර්කය, ස්වීඩනය, නෙදර්ලන්තය, ෆින්ලන්තය, එස්තෝනියාව සහ පෘතුගාලය රැඳී සිටිනවා. මේ දර්ශකය අනුව 2024 වසරේදී ශ්‍රී ලංකාවට හිමි ව තිබෙන්නේ 150 වැනි ස්ථානය. පාකිස්තානය 152 වැනි, ඉන්දියාව 159 වැනි ස්ථානවල රැඳී සිටිනවා. දර්ශකයේ මාධ්‍ය නිදහස පිළිබඳ අවම ලකුණු ලැබී ඇත්තේ ඉරානයට. දර්ශකයේ මාධ්‍ය නිදහස පිළිබඳ අවම ලකුණු ලැබී ඇති තවත් රටවල් කිහිපයක්

2024 වසරේ ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකය අනුව ලොව මාධ්‍ය නිදහස සහිත පළමු රට වන්නේ නෝර්වේ රාජ්‍යය. ඉන්පසු පිළිවෙළින් දෙවැනි හා තුන් වැනි ආදී ලෙස ඩෙන්මාර්කය, ස්වීඩනය, නෙදර්ලන්තය, ෆින්ලන්තය, එස්තෝනියාව සහ පෘතුගාලය රැඳී සිටිනවා. මේ දර්ශකය අනුව 2024 වසරේදී ශ්‍රී ලංකාවට හිමි ව තිබෙන්නේ 150 වැනි ස්ථානය.




තිබෙනවා. ඒ අනුව ඉරානයට 176 වැනි ස්ථානය, උතුරු කොරියාවට 177 වැනි ස්ථානය, ඇෆ්ඝනිස්තානයට 178 වැනි ස්ථානය, සිරියාවට 179 වැනි ස්ථානය හා එරිත්‍රියාවට 180 වැනි ස්ථානය හිමි ව තිබෙනවා.

මේ දර්ශකය සම්පාදනය කළ දේශ සීමා නොමැති වාර්තාකරුවන් පෙන්වා දෙන ආකාරයට මීට පදනම් වූ නිර්ණායක අතරින් වඩාත් පහත වැටී ඇත්තේ එක් එක් රටවල දේශපාලන සන්දර්භය. 2024 වසරේදී ලෝක ජනගහනයෙන් අඩකට වඩා සිය ඡන්දය ප්‍රකාශ කර තිබෙනවා. එම නිසා දේශපාලන සන්දර්භය නමැති නිර්ණායකය ඇතැම් රටවල දර්ශකයේ පහළ යාමට හේතුවක් වන්නට ඇති බවයි දේශ සීමා රහිත වාර්තාකරුවන්ගේ සංවිධානයේ අදහස. ඒ අනුව මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීමේදී දේශපාලන බලවේග ඉටු කරන්නේ අඩු කාර්යභාරයක්. 2023 වසරේ සිට ගසා තීරයේ ඇති වූ යුද්ධය සමග මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාවට ද තර්ජන එල්ල වුණා. පලස්තීන වාර්තාකරුවන් 100කට වැඩි පිරිසක් ඊශ්‍රායෙල හමුදාව විසින් ඝාතනය කරනු ලැබ ඇති බව ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා කර තිබෙනවා. 2024 ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකයේ අයහපත් ම ලක්ෂණ පවතින්නේ මැද පෙරදිග කලාපයට. ඉන් අනතුරු ව ආසියා පැසිපික් කලාපයේ රටවලට. අප්‍රිකාවට ද මාධ්‍ය නිදහස පිළිබඳ බලපෑම් එල්ල වී තිබෙනවා. දර්ශකයට අනුව යුරෝපය ලබා තිබෙන්නේ මාධ්‍ය නිදහස් දර්ශකයේ ප්‍රගතියක්. The New Indian E·press වාර්තා කරන ආකාරයට මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකයේ ඉන්දියාවට හිමි වී ඇති තත්ත්වය යළි සමාලෝචනය කළ යුතුයි. 2013 වසරේදී 152 වැනි ස්ථානයේ පසු වූ ඇෆ්ඝනිස්තානය 2024 වසරේදී දර්ශකයේ 178 වැනි ස්ථානය දක්වා පහත බැස තිබෙනවා. The New Indian E·press දක්වන ආකාරයට ඇෆ්ඝනිස්තානය 2023 වසරේදී දර්ශකයේ 153 වැනි වන ස්ථානයේ සිටීම පිළිගත නොහැකි තත්ත්වයක්. තලිබාන් පාලකයන් මාධ්‍ය දැඩි ලෙස මර්දනය කර තිබියදී එම ස්ථානය ලැබීම පිළිබඳ ගැටලු පවතින බව එම මාධ්‍ය වාර්තා සඳහන් කරනවා.

> ජනමාධ්‍ය නිදහස අර්ථපූර්ණ වීමට නම් වගකීම සහ ආචාරධර්ම තිබීම ඉතා වැදගත්. මාධ්‍ය ආචාධර්ම මගින් සෑම විට ම උත්සාහ කරන්නේ වගකීම් සහගත මාධ්‍ය කලාවක් බිහි කිරීමට. වාර්තාකරණයේදී වඩාත් නිවැරදි මෙන් ම අපක්ෂපාතී ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වනවා. දේශ සීමා නොමැති වාර්තාකරුවන්ගේ සංවිධානය පෙන්වාදෙන ආකාරයට බොහෝ රටවල මාධ්‍ය නිදහසට බලපෑම් එල්ල වී තිබෙන්නේ දේශපාලනික සාධක හේතුවෙන්.

මාධ්‍ය නිදහස පිළිබඳ නිරීක්ෂණය කිරීමට හා ආරක්ෂා කිරීමට යුරෝපා කවුසිලය, යුරෝපයේ ආරක්ෂාව හා සහයෝගිතාව සඳහා වන සංවිධානය සහ ජාත්‍යන්තර ප්‍රකාශන නිදහස හුවමාරුව වැනි ආයතන යුනෙස්කෝ සංවිධානය සමග එක් ව සිටිනවා. ඒ අනුව යුනෙස්කෝ සංවිධානය මාධ්‍ය නිදහස වෙනුවෙන් පෙනී සිටින්නේ ලොව පුරා රාජ්‍ය සමග එක් ව. යුනෙස්කෝ සංවිධානය 2021 දෙසැම්බර් මාසයේ පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේදී මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳ යෝජනාවක් සම්මත කර තිබෙනවා. එසේ ම 2021 ජූලි මාසයේදී මානව හිමිකම් කවුසිලය මගින් සම්මත කර තිබෙන්නේ අන්තර්ජාලයේ මානව හිමිකම් ප්‍රවර්ධනය ආරක්ෂාව හා භුක්ති විඳීම පිළිබඳ ව යෝජනාවක්. මීට පෙර 2011 වසරේ ඔක්තෝබර් මාසයේදී මානව හිමිකම් කවුන්සිලය මගින් ඩිජිටල් යුගයේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය



පිළිබඳ යෝජනාවක් ද සම්මත කර තිබෙනවා. එමගින් අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත්තේ මාධ්‍යවේදීන් මාර්ගගත ප්‍රහාර සහ නිරීක්ෂණවලින් ආරක්ෂා කිරීමට.

## ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස

මෙරට ඇති වූ සමාජ, ආර්ථික, දේශපාලන වෙනස්වීම් හමුවේ මාධ්‍යවේදීන්ට මුහුණදීමට සිදු වූ විවිධ තර්ජන, පැහැර ගැනීම්, ඝාතන පසුගිය කාලයේ අසන්නට, දකින්නට ලැබුණා. විශේෂයෙන් 2005-2014 කාලයේ මේ තත්ත්වය දරුණු ලෙස මාධ්‍යවේදීන්ට අත්විඳින්නට වූ බවයි 'සිළුමිණ' ප්‍රධාන කර්තෘ උදේනි සමන් කුමාර අවධාරණය කරන්නේ.

රිචඩ් ද සොයිසා ඝාතනය (1990), ධර්මරත්නම් සිවරාම් ඝාතනය (2005) සන්ඩේ ලීඩර් පුවත්පතේ එවක කතුවරයා ව සිටි මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය (2009), තාරකී හෙවත් සිවරාම් ඝාතනය (2005), ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කිරීම (2010), මයිල්වාහනම් නිමලරාජන් ඝාතනය (2000), රේලංගී සෙල්වරාජා මාධ්‍යවේදිනිය නාඳුනන තුවක්කුකරුවන් පිරිසක් විසින් ඝාතනය කරනු ලැබීම (2015), සුගීර්ධරාජන් නාඳුනන වෙඩික්කරුවන්ගේ ඉලක්කයක් වීම (2006) මෙන් ම 2009 ජුනි 01 දින ජෝෂ්ඨ මාධ්‍යවේදී පෝද්දල ජයන්තට පහර දීම, 2007 දෙසැම්බර් 27 දින රූපවාහිනී සංස්ථාවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා ව සිටි ටී.එම්.ජී චන්ද්‍රසේකර ඇතුළු කිහිපදෙනකුට පහර දීම, ද නේෂන් පුවත්පතේ නියෝජ්‍ය කර්තෘ ව සිටි කීත් නොයාර්ට (2008) හා රිවිර ප්‍රධාන කර්තෘ ව සිටි උපාලි තෙන්නකෝන්ට (2009) පහර දී වධ හිංසා පැමිණවීම මාධ්‍ය මර්දන සිදුවීම් කිහිපයක්.

මෙවැනි පසුබිමක 2012 වසරේ සිට සෑම වසරක ම ජනවාරි මාසයේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මූලිකත්වයෙන් කළු ජනවාරිය සැමරෙන්නේ 2006 වසරේ සිට 2011 දක්වා කාලයේ ජනවාරි මාසවල සිදු වූ ජනමාධ්‍යවේදීන් බියවැද්දීම, බලහත්කාරයෙන් අතුරුදන් කිරීම, ඝාතනය කිරීම වැනි අපරාධ සිහිපත් කිරීමට බවයි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය 'අනීතික දණ්ඩ මුක්තියෙන් වැසුණු අපරාධ; ශ්‍රී ලංකාවේ මාධ්‍ය මර්දන සිදුවීම් කිහිපයක වත්මන් තත්ත්වය' මැයෙන් පළ කළ ප්‍රකාශනයේ සඳහන් වන්නේ.

නිදහස් ජනමාධ්‍ය කර්මාන්තයක්-සමබර තොරතුරු සමාජයක් යන්න පෙරදැරි ව මාධ්‍ය නිදහස පිළිගනිමින් දැනට පවත්නා මාධ්‍ය නීති, අණ පනත්, සම්මුතීන්, ආචාරධර්ම සමාලෝචනය කර ප්‍රශස්ත මාධ්‍ය ප්‍රතිපත්තියක් සඳහා අවශ්‍ය සංශෝධන කිරීමටත් ජාත්‍යන්තර ප්‍රමිති අනුව සහ ලාංකේය සමාජයට ගැළපෙන නිර්ණායක අනුව

යුරෝපයේ ආරක්ෂාව හා සහයෝගිතාව සඳහා වන සංවිධානය සහ ජාත්‍යන්තර ප්‍රකාශන නිදහස හුවමාරුව වැනි ආයතන යුනෙස්කෝ සංවිධානය සමග එක් ව සිටිනවා. ඒ අනුව යුනෙස්කෝ සංවිධානය මාධ්‍ය නිදහස වෙනුවෙන් පෙනී සිටින්නේ ලොව පුරා රාජ්‍ය සමග එක් ව. යුනෙස්කෝ සංවිධානය 2021 දෙසැම්බර් මාසයේ පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේදී මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳ යෝජනාවක් සම්මත කර තිබෙනවා.

මාධ්‍ය ආයතනවල සහ මාධ්‍යවේදීන්ට ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීමටත් 'පොහොසත්-රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව රජයේ අවධානය යොමු ව තිබෙනවා.


ජනමාධ්‍ය නිදහස අර්ථපූර්ණ වීමට නම් වගකීම සහ ආචාරධර්ම තිබීම ඉතා වැදගත්. මාධ්‍ය ආචාධර්ම මගින් සෑම විට ම උත්සාහ කරන්නේ වගකීම් සහගත මාධ්‍ය කලාවක් බිහි කිරීමට. වාර්තාකරණයේදී වඩාත් නිවැරදි මෙන් ම අපක්ෂපාතී ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වනවා. දේශ සීමා නොමැති වාර්තාකරුවන්ගේ සංවිධානය පෙන්වාදෙන ආකාරයට බොහෝ රටවල මාධ්‍ය නිදහසට බලපෑම් එල්ල වී තිබෙන්නේ දේශපාලනික සාධක හේතුවෙන්. මේ නිසා එවැනි වාතාවරණයකදී නම්‍යශීලී ප්‍රතිපත්ති අනුගමනය කිරීම ද මූලික අවශ්‍යතාවක්. නිදහස යනු උපරිමය නොවෙයි. එය වඩාත් ආචාරශීලී ව භුක්ති විඳිය යුත්තක්. මේ තත්ත්වය ජනමාධ්‍යයට මෙන් ම සමාජ මාධ්‍යවලට ද පොදු තත්ත්වයක්.

මෙරට මාධ්‍ය ක්ෂේත්‍රයට නීතිගරුක මෙන් ම පරිපූර්ණ වෘත්තීය නිපුණත්වයකින් යුතු මාධ්‍යවේදීන් එක් කර ගැනීමත් මාධ්‍යවේදීන්ගේ වෘත්තීය මට්ටම මෙන් ම සුභ සාධනය ඉහළ නැංවීමත් වත්මන් රජයේ අරමුණක් බව ජනමාධ්‍ය අමාත්‍යවරයා ප්‍රකාශ කර තිබෙනවා. ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් ඇතිකිරීම, මාධ්‍ය ක්ෂේත්‍රයේ ස්වයං නියාමනයක් ඇති කිරීම ද එහිදී වැදගත්. මාධ්‍ය විෂය පිළිබඳ වෘත්තීය දැනුම වැඩිකර ගැනීමෙන් නිවැරදි ලෙස හා වගකීමෙන් යුතු ව තම මාධ්‍ය වෘත්තියේ නියැළීමට මාධ්‍යවේදියාට හැකියාව ලැබෙනවා. එය මාධ්‍ය නිදහස සුරක්ෂිත වීම සඳහා ඍජු ව බලපාන කාරණයක්. ඊට අදාළ ක්‍රියාමාර්ග ගන්නා අතර ම මාධ්‍ය ආයතන සඳහා යම් යම් ප්‍රමිතිකරණ හඳුන්වා දීමට ද රජයේ අවධානය යොමු ව තිබීම පැසසිය යුතු කරුණක්. මාධ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය මෙන් ම ලෝකයේ නව ක්‍රමවේද ශ්‍රී ලංකාවට හඳුන්වා දීම ද එහිදී වැදගත්. රූපවාහිනී හා ගුවන්විදුලි වැනි විද්‍යුත් මාධ්‍ය සඳහා ඇනලොග් සම්ප්‍රේෂණ තාක්ෂණය වෙනුවට ඩිජිටල් තාක්ෂණය හඳුන්වාදීම කළ යුතු අතර ඒ සඳහා ද යම් ප්‍රවේශයක් ගෙන ඇති බව දක්නට ලැබෙනවා.

මේ සියලු කාරණා හමුවේ අපට පැහැදිලි වන්නේ මාධ්‍ය නිදහස සුරක්ෂිත වීම කෙරෙහි එක් පාර්ශ්වයක් පමණක් වගකීම භාර ගත යුතු කරුණක් නොවන බව. පොදුවේ මාධ්‍යවේදීන්, මාධ්‍ය ආයතන, ආණ්ඩු, පර්යේෂණ ප්‍රජාව ආදී සියලු සමාජ කාණ්ඩ එහි ලා දායක විය යුතුයි.

# සාම්ප්‍රදායික අභියෝගවල

# අඩුවක් නැහැ



මහාචාර්ය
**ටියුඩර් වීරසිංහ**
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය

මාධ්‍ය නිදහස යන්න මාධ්‍යයේ ඓතිහාසික බිහිවීමත් සමග සම්බන්ධ වී තිබෙනවා. සංහතික මාධ්‍ය ඇරඹෙන්නේ ක්‍රිස්තු වර්ෂ 1600 පමණ පුවත්පත බිහිවීමත් සමග. ඉන්පසුව 19 වැනි සියවස අවසාන භාගයේ සහ 20 වැනි සියවස මුල් භාගයේ ගුවන්විදුලිය අරඹෙන අතර එම සියවසේ 30-40 දශකවල රූපවාහිනිය ලෝක මාධ්‍ය ක්‍රියාකාරිත්වයට එක් වනවා.

මේ මාධ්‍ය සුමට, පහසු, සරල මාවතක පැමිණියේ නැහැ. දේශපාලන, සමාජ, ආර්ථික, වාණිජ සංස්කෘතික දෘෂ්ටිවාදී හැලහැප්පිලි සහ ප්‍රතිවිරෝධතා මධ්‍යයේයි මාධ්‍ය නමැති සමාජ ආයතනය වර්තමනය දක්වා වර්ධනය වූයේ.

මෙවැනි පසුබිමක විශේෂයෙන් ලෝක මාධ්‍ය ක්‍රියාකාරිත්වය අද වන විට සමස්ත සමාජ ක්‍රියාවලියේ අවියෝජනීය පැතිකඩක් බවට පත් ව තිබෙනවා. සමාජයේ සෑම ක්ෂේත්‍රයකට ම මෙන් ම දෛනික ජීවිතයට ද මාධ්‍ය බලපාන තරමට ම එය වර්ධනය වී තිබෙනවා.

මාධ්‍ය කාර්යභාරය ඉටු කිරීමේදී මාධ්‍යවේදින්ට සිදු ව තිබෙන්නේ විවිධ තාඩන පීඩන, අභියෝගවලට මුහුණදීමට. බොහෝ රටවල මෙන් ම අපේ රටේ ද මාධ්‍යවේදින්ට තර්ජන එල්ල වීම්, ඝාතනය වීම්, මාධ්‍ය ආයතන විනාශ කිරීම් ආදී බලපෑම් සහ ක්‍රියා ඔස්සේ එය වර්ධනය වී තිබෙනවා. ඊට ප්‍රධාන හේතුව සමාජ පාලනය සකස් වී තිබෙන ආකාරය. රාජ්‍ය ක්‍රියාවලිය, ආර්ථික ක්‍රියාවලිය, සමාජ ක්‍රියාවලිය හසුරුවන ප්‍රධාන විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය එකතු වී රාජ්‍ය බලය ක්‍රියාත්මක කරන අතර මේ ක්‍රියාකාරිත්වය ජනතාවට විවිධාකාරයෙන් බලපානවා.

ඉතිහාසය පුරා ම ජනතා පරමාධිපත්‍යයෙන් පත් වන ආණ්ඩු ඔවුන් පත් කළ සමාජ පංති හා සමාජ බලවේගවල වුවමනා හා අවශ්‍යතා වෙනුවෙන් රාජ්‍ය යොදාගැනීම සාමාන්‍ය තත්ත්වයක් බවට පත් වුණා. එයින් විශාල හානියක්, අසාධාරණයක් මහජනතාවට සිදුවනවා. එවැනි තත්ත්ව, ආණ්ඩු බලය අයුතු ලෙස පාවිච්චි කිරීම, මත්ද්‍රව්‍ය අවභාවිතය, සමාජ අපගමන පිළිබඳ විමසීම හා ගවේෂණාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීමට ඓතිහාසික වශයෙන් සකස් වී ඇති ආයතනය වන්නේ මාධ්‍ය.

මාධ්‍ය හා ආණ්ඩුව අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියා කරන අතර එය සංකීර්ණ වී තිබෙනවා. 1800 ගණන්වල සිටි ප්‍රංශයේ හොනෙරෝ ද බැල්සක් නැමති රචකයා 'සිව් වැනි බලය', 'සිව් වැනි ආණ්ඩුව' ලෙස මාධ්‍ය සැලකුවා. මාධ්‍යයේ බලය පිළිබඳ ව ප්‍රංශයේ අධිරාජ්‍යයකු වන නැපෝලියන් බොනපාට් පැවසුවේ බයිනේත්තු ලක්ෂයකට වඩා මම පත්තර තුනකට බයයි යනුවෙන්. ඔහු එසේ ප්‍රකාශ කර ඇත්තේ එවකට ප්‍රංශයේ තිබූ පුවත්පත් තුනක් සම්බන්ධයෙන්. "ඔබ මාව ප්‍රංශයේ ස්වාමියා ලෙස දකින නමුත් නිදහස් මාධ්‍ය සමග මාස තුනක් ප්‍රංශය පාලනය කිරීමට මම භාර නොගනිමි." යනුවෙන් ඔහු පවසා ඇත්තේ ඒ තරමට මාධ්‍ය හොඳට සහ නරකට ආණ්ඩු පාලනයට ඍජු ව ම සම්බන්ධ වන හෙයින්.

මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක බල ත්‍රිත්වයේ සංවර්ධනයේ ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා දනට පවතින පාරදෘශ්‍ය සහ වඩාත් ම කාර්යක්ෂම ආයතනය විදියට පොදුවේ පිළිගන්නේ මාධ්‍ය. මේ සඳහා මාධ්‍යයට නිදහසක් තිබිය යුතුයි. එය නිරපේක්ෂ නොව සාපේක්ෂ නිදහසක් විය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ක්‍රියාත්මක වීම සඳහා පාලකයන් සහ පාලන ආයතන, ආණ්ඩු ජනතාව වෙනුවෙන් ක්‍රියාකරන විට එහි මැදිහත්කරුවා මාධ්‍ය. මාධ්‍ය යනු හුදු තොරතුරු සන්නිවේදනය කරන්නකු නොව සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික ක්‍රියාවලියකට මැදිහත්කරණය සිදු කරන ආයතනයක්. මෙය සිදු වන්නේ ජනතා වුවමනා, හැකියා ආරක්ෂා කිරීමට. ඒ සඳහා මාධ්‍ය ක්‍රියා කිරීම සමාජ අරගලයේ ම කොටසක් බවට පත් වනවා.

සමාජයේ විවිධ අකටයුතුකම්, බලය අයුතු ලෙස භාවිත කිරීම් පෙන්වා දීමට නිදහස් මාධ්‍යයක් තිබිය යුතුයි. ඒ සඳහා මාධ්‍ය ක්‍රියා කරන්නේ සමාජ වගකීම (Social Reponcibility) පාදක කරගෙන. එහිදී විශේෂයෙන් ම මාධ්‍යයට තිබෙන නිදහස සහතික විය යුතුයි.

නිදහස් මාධ්‍ය බිහිවීමට බලපෑවේ සිදුවීමක් වුවත් එවැනි සිදුවීම් සංවර්ධිත මෙන් ම සංවර්ධන වෙමින් පවතින ඕනෑ ම රටක සිදු වන්නට පුළුවන්. එහිදී මාධ්‍ය නිදහස් ක්‍රියාකාරිත්වය අවහිර කිරීම, සීමා කිරීම සිදුවිය හැකියි. මෙය පිටුදැකීමට, නිදහස් මාධ්‍ය ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී රටක බහුත්වවාදී මූලධර්ම සහ මාධ්‍යයේ ස්වාධීනත්වය නිසා ඉතිහාස පුරා ම අනෙකුත් ආයතනවලට වඩා මාධ්‍ය ආයතනවලට අවදානමක් දැරීමට සිදු වී තිබෙනවා.

මාධ්‍ය තොරතුරු වාර්තා කිරීම සමග ජනමතය ගොඩනැගෙනවා. මෙයයි සිවුවැනි ආණ්ඩුවේ බලය. මේ ජනමතය ගොඩනැගීමට මාධ්‍ය නිදහස් ක්‍රියාකාරිත්වය අත්‍යවශ්‍යයි. මෙහිදී විධායකය, ව්‍යවස්ථායකය හා අධිකරණය යන අනෙකුත් ආණ්ඩු තුනේ මැදිහත්වීම ජනතාවට යහපතක් වන ආකාරයට මාධ්‍ය තමන්ගේ ක්‍රියාකාරිත්වය කළමනාකරණය කර ගන්නවා.

වර්තමානයේ මාධ්‍ය නිදහස් ක්‍රියාකාරිත්වයට බලපාන විවිධ සාධක තිබෙනවා. ආණ්ඩුකරණයේ බලය සම්බන්ධ සාධක, ආර්ථික සාධක, වානිජ සාධක, තාක්ෂණික සාධක, ප්‍රාග්ධන ගැටලුව, මාධ්‍ය අධ්‍යාපනය හා සාක්ෂරතාව පිළිබඳ සාධක ඊට අයත්.

# මාධ්‍ය නිදහස ආරක්ෂා කර ගැනීම

# මාධ්‍යයේ වගකීමක්



**උදේනි සමන් කුමාර**
'සිළුමිණ' ප්‍රධාන කර්තෘ

'ලෝක මාධ්‍ය නිදහස් දිනය' නම් කෙරුණේ 1986 දෙසැම්බර් 17 දින සිය පුවත්පත් කාර්යාලය ඉදිරිපිටදී අමානුෂික ලෙස ඝාතනයට ලක්වූ කොලොම්බියානු මාධ්‍යවේදි Guillermo Cano අනුස්මරණය කරමින්. ජනමාධ්‍ය නිදහසේ මූලධර්ම ආරක්ෂා කිරීම, ලොව පුරා මාධ්‍ය නිදහස සඳහා පවතින වටපිටාව ඇගයීම මෙන් ම මාධ්‍යයේ ස්වාධීනත්වයට එල්ල වන ප්‍රහාරවලින් ජනමාධ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ ආණ්ඩුවල අවධානයට ලක්කිරීමත් මේ දිනයේදී සිදු වන්නක්.

අතීතයේ ලෝකයේ පැවතියේ රජවරුන්ගේ, රදළයන්ගේ සහ ප්‍රභූ පැළැන්තියේ සන්නිවේදනය සඳහා සකස් වූ මාධ්‍ය රටාවක්. 1789 ප්‍රංශ මහා විප්ලවයෙන් පසු රජවරුන්ගේ සහ රදළයන්ගේ පාලනය වෙනුවට පොදු ජනතාවගේ පාලනයක් ස්ථාපිත වනවා. එනම් පරපුරෙන් පරපුරට උරුම වූ රජකම වෙනුවට ජනතාව අතරින් තෝරාගත්

සමාජයේ දේශපාලන, ආර්ථික හෝ වානිජ ක්‍රියාවලින් මාධ්‍යයට එල්ලවන අභියෝගයට අමතර ව නව තාක්ෂණයේ අභියෝග එල්ල වී තිබෙනවා. මෙවර ලෝක මාධ්‍ය නිදහස් දිනයේ තේමාවෙන් කියවෙන මාධ්‍ය නිදහසට කෘත්‍රිම බුද්ධියේ බලපෑම පිළිබඳ අවධානය යොමු කරන විට එය මාධ්‍ය නිදහසට පමණක් නොව මානව මාධ්‍යකරුවාගේ පැවැත්මට ද අභියෝගයක් වී අවසන්. එහෙත් කෘත්‍රිම බුද්ධිය මාධ්‍ය ක්‍රියාකාරිත්වය කාර්යක්ෂම කර තිබෙනවා.

කෙසේ වෙතත් මාධ්‍ය ක්‍රියාවලියෙන් මාධ්‍යකරුවන් ඉවත් වී ස්වයංක්‍රීය යන්ත්‍ර ඊට එකතු වෙමින් තිබෙනවා. මාධ්‍ය හා ජනතාව අතර මෙන් ම මාධ්‍ය හා රාජ්‍ය අතර සම්බන්ධය වෙනස් වී තිබෙනවා. එසේ වන්නේ මාධ්‍ය යාන්ත්‍රික මෙවලමක් බවට පත්වෙමින් තිබෙන බැවින්. ඒ අනුව මාධ්‍ය නිදහස යන කරුණ මතු වන්නේ වෙනත් අර්ථයකින්. එය සමස්ත මනුෂ්‍යත්වයට හා මිනිස් වර්ගයාට මෙන් ම භාෂණය, නිදහස් චින්තනයට, නව උත්පාදනයට බලපානවා. මානවීය නිර්මාණයකරණයට වඩා තාක්ෂණික නිර්මාණකරණය ඉස්මතු වෙනවා. ජාල තන්ත්‍රකරණ ආකෘතිය තුළ මාධ්‍යවේදියාගේ භූමිකාව වෙනස් වෙමින් තිබෙනවා.

ලෝක මාධ්‍ය නිදහස සමරන අවස්ථාවේදී ද මාධ්‍යයට එල්ල වන සාම්ප්‍රදායික අභියෝගවල අඩුවක් නැහැ. ඉදිරියේදී ඒවා වර්ධනය වන්නට පුළුවන්. ලොව සිදුවන දේශපාලන, ආර්ථික වෙනස්වීම්වලින් බැහැර වන්නට මාධ්‍යයට බැහැ. අද ඒවා වඩාත් සංකීර්ණ වී තිබෙන්නේ ජාතික හා කලාපීය මට්ටම ඉක්මවා ගොස් ගෝලීය තත්ත්වයට පත් ව ඇති නිසා. ශ්‍රී ලංකාව වැනි රටවල ජාතික මාධ්‍ය හා මාධ්‍යකරුවන් රටේ ජනතාවගේ ලැදියාවන්ට අනුව ක්‍රියා කරනවාද යන්න ගැටලුවක්. ජාතික තොරතුරු අවකාශය හා එහි සුරක්ෂිත බව පිළිබඳ ගැටලු මතු ව තිබෙනවා.

රටක් ලෙස වර්තමාන මාධ්‍ය ක්‍රියාවලිය නියාමනය කළ යුතු යාන්ත්‍රණයක් අවශ්‍ය වෙනවා. එය නිසි ලෙස සකස් විය යුතුයි. අද බොහෝ විට මාධ්‍ය නියාමනය වන්නේ වෙළෙඳපොළ බලවේග, අන්තර්ජාල ක්‍රියාකාරිත්වය ආදියෙන්. එය කොතෙක්දුරට ජාතික අවශ්‍යතා හා ජනතාවට තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඇති නිදහස ආරක්ෂා කරන්නේද යන්න පිළිබඳ ව සිතා බැලිය යුතුයි. ජනතාවගේ සැබෑ ජන මතයට ඉන් බලපෑමක් එල්ල වෙනවා. ඒ අනුව මේ සමස්තය නියාමනය විය යුතුයි. ඊට අදාළ කතිකාවක් නිර්මාණය විය යුතුයි. එය ශ්‍රී ලංකාවට පමණක් කළ හැකි දෙයක් නොව ජාතික මෙන් ම ගෝලීය ආයතන මට්ටමින් සිදු විය යුත්තක්. —

රටක් ලෙස වර්තමාන මාධ්‍ය ක්‍රියාවලිය නියාමනය කළ යුතු යාන්ත්‍රණයක් අවශ්‍ය වෙනවා. එය නිසි ලෙස සකස් විය යුතුයි. අද බොහෝ විට මාධ්‍ය නියාමනය වන්නේ වෙළෙඳපොළ බලවේග, අන්තර්ජාල ක්‍රියාකාරිත්වය ආදියෙන්. එය කොතෙක්දුරට ජාතික අවශ්‍යතා හා ජනතාවට තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඇති නිදහස ආරක්ෂා කරන්නේද යන්න පිළිබඳ ව සිතා බැලිය යුතුයි.



නියෝජිතයන් වෙතින් පාලනය වන ලෝකයක් නිර්මාණය වුණා. රාජසභාවේ රදළයන් ඇසුරේ නිර්මාණය වූ ජනමාධ්‍ය සංස්කෘතිය ඉනික්බිති ව මාරු වුණේ පොදු ජනතාව අතරට. වර්තමානය වන විට ජනමාධ්‍ය යනු ජන සංහතියේ ම පැවැත්ම ගොනු කරන ප්‍රබල සාධකයක් වී තිබෙනවා.

අද ඕනෑ ම සිදුවීමක් පිළිබඳ ලෝකය ම දැනුවත් වන්නේ තත්පර කිහිපයකින්. විදුලි වේගයෙන් ගලා යන සන්නිවේදනය වෙනුවෙන් ලක්ෂ සංඛ්‍යාත මාධ්‍යවේදීන් සිය වෘත්තියේ නියැළෙනවා. ජීවිත අවදානම ද නොතකමින් එදිනෙදා ජීවිතයේ ප්‍රවෘත්ති මෙන් ම අසීරු අවස්ථා වාර්තා කරමින් ලොව ජනමාධ්‍යවේදීන් ඉටු කරන්නේ පුළුල් සමාජ වගකීමක්. විටෙක යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින ජනමාධ්‍යවේදියා යුක්තියට හා සාධාරණත්වයට එරෙහි දේශපාලකයන්ගේ තර්ජනයට ගොදුරු වන අවස්ථා තිබෙනවා. බොහෝවිට එම තර්ජන මාරාන්තිකයි. එසේ ම මාධ්‍යවේදියා ජනමාධ්‍ය ආචාරධර්මවලින් විලංගු ලා තිබෙනවා. ගෞරවනීය වෘත්තීයභාවයකින් මාධ්‍ය ක්ෂේත්‍රයේ නියැළීමට නම් මාධ්‍යවේදියාට සිදු වනවා මේ දෙපාර්ශ්වය ම ජය ගන්නට.

ආචාරධර්ම යනු මිනිසා විෂයෙහි නිර්මාණය වූ කාරණාවක්. සෑම ආගමක ම සංස්කෘතියක ම පාර්ශ්වකරුවන් අතර අනේකවිධ ආචාරධර්ම නිර්මාණය වී ඇත්තේ එබැවින්. මාධ්‍ය යනු බැලූ බැල්මට ආගමක්, ඇදහීමක් වැනි කාරණාවක් නොවූවත් මාධ්‍ය ආචාරධර්ම ද ආගමක් අදහන්නා සේ ක්‍රියාත්මක කරවීම වැදගත්.

මාධ්‍ය නිදහස පිළිබඳ කොමිසම-1947, මැක්බ්‍රයිඩ් වාර්තාව-1980 මෙන් ම ඇමරිකාව, දකුණු ආසියානු කලාපය, යුරෝපය ආදී රටවල ද විවිධ කොමිෂන් සභා පිහිටුවා ගනිමින් ආචාරධර්ම සංග්‍රහ හඳුන්වා දී තිබෙනවා. ශ්‍රී ලංකාව ගත් විට කාරණා 11ක් ඇතුළත් පුවත්පත් මණ්ඩල ආචාරධර්ම සංග්‍රහය 1981 වසරේ සිට ක්‍රියාත්මක වනවා. රූපවාහිනිය සහ ගුවන්විදුලිය මුල්කරගනිමින් පසුකාලීන ව සමාජගත වූ ආචාරධර්මීය කරුණු සහ නව ඩිජිටල් මාධ්‍ය බිහිවීමෙන් පසුව අන්තර්ජාල පිළිබඳ විවිධ අණපනත් ඔස්සේ ද ආචාරධර්මීය සාකච්ඡා සමාජයේ ඇති වුණා. 2011 වසරේදී සමාජ මාධ්‍ය ආචාරධර්ම සංග්‍රහයක් එළිදැක්වුණු අතර ස්වාධීන මාධ්‍යවේදින්ගේ සංගමය, පුවත්පත් කතුවරුන්ගේ සංසදය ආචාරධර්ම සංග්‍රහ එළිදක්වා තිබෙනවා. මේ ආකාරයට මාධ්‍ය ආචාරධර්ම සංග්‍රහ ගණනාවක් ම වර්තමානය වන විට ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එහෙත් වර්තමානයේ මාධ්‍ය ආචාරධර්ම බිඳවැටීම විෂයෙහි පාර්ශ්ව ත්‍රිත්වයක් අපට හඳුනා ගැනීමට පුළුවන්. ඒ, මාධ්‍ය හිමිකරුවන්, මාධ්‍යවේදින් හා පුරවැසියන් වශයෙන්.

අද ඕනෑ ම සිදුවීමක් පිළිබඳ ලෝකය ම දැනුවත් වන්නේ තත්පර කිහිපයකින්. විදුලි වේගයෙන් ගලා යන සන්නිවේදනය වෙනුවෙන් ලක්ෂ සංඛ්‍යාත මාධ්‍යවේදීන් සිය වෘත්තියේ නියැළෙනවා. ජීවිත අවදානම ද නොතකමින් එදිනෙදා ජීවිතයේ ප්‍රවෘත්ති මෙන් ම අසීරු අවස්ථා වාර්තා කරමින් ලොව ජනමාධ්‍යවේදීන් ඉටු කරන්නේ පුළුල් සමාජ වගකීමක්. විටෙක යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින ජනමාධ්‍යවේදියා යුක්තියට හා සාධාරණත්වයට එරෙහි දේශපාලකයන්ගේ තර්ජනයට ගොදුරු වන අවස්ථා තිබෙනවා.

මාධ්‍ය නිදහස යන්නෙහි අර්ථය වන්නේ පුරවැසියා වෙත තොරතුරු, ප්‍රවෘත්ති හා දැනුම ප්‍රක්ෂේපණය කිරීමට ඇති අයිතිය හා පුරවැසියාට එය ග්‍රහණය කර ගැනීමට තිබෙන නිදහස. ලංකාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තියට අනුව සෑම පුරවැසියකුගේ ම භාෂණයේ නිදහස, ප්‍රකාශනයේ නිදහස සහ අදහස් පළ කිරීමේ අයිතිය සහතික කර තිබෙනවා. එක්සත් ජාතීන්ගේ විශ්වීය මානව හිමිකම් ප්‍රකාශනයේ 19 වැනි වගන්තියට අනුව නිදහස් මත දැරීමේ සහ ස්වාධීන මත ප්‍රකාශ කිරීමේ අයිතිය සහතික කොට තිබෙනවා. 18 වැනි සියවසේ අගභාගයේ විසූ එඩ්මන්ඩ් බර්ග් සඳහන් කළේ ජනමාධ්‍ය වූ කලි සිව් වැනි රාජ්‍යය හැටියට ජනමාධ්‍යවල වගකීම වන්නේ ව්‍යවස්ථාදායකය, අධිකරණය, විධායකය යන කුලුනු තුන බලය අයුතු ලෙස පාවිච්චි කරන අවස්ථා ජනතාවට පෙන්වා දෙමින් ඊට එරෙහි ව ක්‍රියාත්මක වීමට ජනතාව බල ගැන්වීම.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස බරපතළ ලෙස පරිහානියට පත්වූයේ 2005-2014 පාලන සමයේ අනුගමනය කළ ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපත්ති හේතුවෙන්. රාජපක්ෂ දශකය මෙරට ඉතිහාසයේ මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් අඳුරු කාල පරිච්ඡේදයක්. එම කාලයේ ශ්‍රී ලංකාවේ උතුරේත් දකුණේත් ඝාතනය කරන ලද මාධ්‍යවේදීන්ගේ සංඛ්‍යාව 43ක්. මාධ්‍යවේදීන් අතුරුදන් කිරීම, පැහැරගෙන යාම, වධ හිංසා පැමිණවීම, මාධ්‍ය ආයතනවලට ගිනි තැබීම පිළිබඳ අපකීර්තිමත් වාර්තාවලින් ලංකා ඉතිහාසය කිලිටි වී තිබෙනවා. 2024 පෙබරවාරි මාසයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත් 'මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත' ඉතා බරපතළ ලෙස මාධ්‍ය හිමිකම සීමා කෙරෙන පනතක්.

2024 අවසානයේ බලයට පැමිණි ජාතික ජන බලවේග ආණ්ඩුව ජනමාධ්‍ය සඳහා පූර්ණ නිදහස සහතික වන පරිදි මාධ්‍ය කෙරෙහි නව සම්ප්‍රදාය අනුගමනය කරන බවට ප්‍රතිඥා දී එය භාවිතාවට නගා තිබෙනවා. නව ආණ්ඩුවේ එම ප්‍රවණතා දරා ගැනීම සඳහා අවශ්‍ය ශික්ෂණය සහ මාධ්‍ය සදාචාරය ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂේත්‍රයෙහි නිරූපණය වී නැති බව කනගාටුවෙන් සඳහන් කළ යුතුයි. නව ආණ්ඩුව බලයට ගෙනාවේ ශ්‍රී ලංකාවේ බත් කන හරක් යැයි ප්‍රසිද්ධියේ ඡන්දදායකයන්ට එරෙහි ප්‍රකාශයක් කරන්නට බාල ගණයේ දේශපාලකයකුට නිදහස ලැබීමත් එම අදහස උත්කර්ෂයට නංවමින් ප්‍රචාරය කිරීමට මාධ්‍යවලට නිදහස ලැබීමත් වර්තමාන ආණ්ඩුවේ මාධ්‍ය සම්බන්ධ ප්‍රතිපත්තියේ විනිවිදභාවය සහතික කරන්නක්.

මාධ්‍ය නිදහසට වැට බැන්දා යැයි කිසිදු චෝදනාවක් වර්තමාන ආණ්ඩුවට ගෙවුණු හය මාසයේ එල්ල වී නැහැ. ශ්‍රී ලංකාව ගමන් කළ යුත්තේ අපකීර්තිමත් පසුපසට නොවෙයි. තම සීමාවේ උපරිම ලෙස මාධ්‍ය නිදහස ආරක්ෂා කර ගැනීම රාජ්‍යයේ නොව මාධ්‍යයේ වගකීමක්.



# කෘත්‍රිම බුද්ධිය
# නියාමනය ගැටලුවක්


ආචාර්ය
**රුචිර විජේසේන**
තාක්ෂණික ආයතනය
මොරටුව විශ්වවිද්‍යාලය


මෙවර ලෝක මාධ්‍ය නිදහස් දිනයේ තේමාවෙන් මාධ්‍ය නිදහස හා මාධ්‍ය කෙරෙහි කෘත්‍රිම බුද්ධියේ (Artificial Inteligence-AI) බලපෑම පිළිබඳ අවධානය යොමු කර තිබීම ඉතා කාලෝචිත කතාබහක් නිර්මාණය කරනවා. අප කෘත්‍රිම බුද්ධිය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ප්‍රධාන කරුණු තුනක් ගැන සැලකිලිමත් විය යුතුයි. ඒ, පුද්ගලයාගේ ඉගෙනීමට ඇති හැකියාව, විග්‍රහ කිරීමේ හැකියාව හා තේරුම් ගැනීමට ඇති හැකියාව ලෙස. මේ කාර්ය තුන කෘත්‍රිම ව ගොඩනැගීම කෘත්‍රිම බුද්ධියෙන් සිදුවනවා. 1980න් පසු මෙය විශාල ක්ෂේත්‍රයක් ලෙස ගොඩනැගුණා. ඕනෑ ම අයෙකුට භාවිත කළ හැකි පරිදි කෘත්‍රිම බුද්ධිය මේ වන විට සංවර්ධනය වී තිබෙනවා.

මාධ්‍ය යනු ප්‍රධාන වශයෙන් සමාජය සමග තොරතුරු බෙදා ගන්නා උපකරණයක්. විවිධ ආකාරයෙන් තොරතුරු සකසා, සමාජය සමග බෙදා ගැනීම මෙහිදී සිදු කෙරෙනවා. තොරතුරු සමාජගත කිරීම, සමාජයේ විවිධ අධිකාරි සහතික කිරීම, සමාජයේ පවතින ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීම, සංස්කෘතික කාර්ය ආදී මාධ්‍යවල ප්‍රධාන කාර්යවලට තිබෙනවා කෘත්‍රිම බුද්ධියේ සෘජු බලපෑමක්. උදාහරණ ලෙස සමාජයට තොරතුරු වේගයෙන් එකතු කිරීමට කෘත්‍රිම බුද්ධිය දායක වී තිබීම, මාධ්‍යවේදියකු නොමැති ව වුවත් තොරතුරු ලබා දීමට කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීම සඳහන් කරන්නට පුළුවන්. සමාජයේ ඇති අධිකාරි ප්‍රශ්න කර ජනතාවට තොරතුරු හෙළි කිරීමට, ජනතාවට කැමති ආකාරයේ අන්තර්ගතයක් සකස් කිරීමට මෙහි පහසුකම් පවතිනවා. සාමාන්‍යයෙන් මාධ්‍ය සිදු කරන්නේ මාධ්‍යවේදීන් එකතු කර සකස් කරගත් ප්‍රවෘත්ති, විශේෂාංග ජනතාවට ලබාදීම. එය ඒක පාර්ශ්වික වූවක්. එහෙත් කෘත්‍රිම බුද්ධිය භාවිතයේදී සිදු වන්නේ තොරතුරු විශ්ලේෂණය කර, අදාළ පුද්ගලයන්ට පමණක් ඒවා ලබාදීම. මාධ්‍යවල අධ්‍යාපනික අරමුණු ඉටු කිරීමටත් එය භාවිත කළ හැකියි. මේ ආකාරයට මාධ්‍යයෙහි ඇති ප්‍රධාන වගකීම් සියල්ලට ම කෘත්‍රිම බුද්ධිය බලපෑම් කර තිබෙනවා.

කෘත්‍රිම බුද්ධිය භාවිතයේ ඇත්තේ වාසි ගණනාවක්. වේගයෙන් තොරතුරු රැස්කිරීම, විග්‍රහ කිරීම සහ බෙදා හැරීම කෘත්‍රිම බුද්ධිය භාවිතයෙන් කළ හැකි නිසා එයට ගත වන්නේ අඩු කාලයක්. එක් එක් අයට කැමති ලෙස අඩු වියදමකින් ප්‍රවෘත්ති ලබා ගැනීමේ හැකියාව මෙහිදී ලැබෙනවා. දවස පුරා ප්‍රවෘත්ති ආයතන ක්‍රියාත්මක කිරීමට හැකි වීමත් කෘත්‍රිම බුද්ධියේ සුවිශේෂ බලපෑමක්.

මෙහි අවාසිදායක තත්ත්ව ද තිබෙනවා. කෘත්‍රිම බුද්ධිය යොදාගෙන අසත්‍ය සමාජගත කළ හැකි වීම එහි ප්‍රමුඛ තත්ත්වයක්. මෙහිදී වන්නේ කෘත්‍රිම බුද්ධිය යොදාගෙන සංස්කරණය කරන ලද හෝ ජනනය කරන ලද හෝ රූප, වීඩියෝ, ශ්‍රව්‍ය (Deepfakes) භාවිතයෙන් අසත්‍ය ප්‍රචාර පතුරුවාලීම. එය වේගයෙන් සමාජගත කළ හැකියි. විවිධ ආකාරයේ නැඹුරුතා ගොඩනැගීමේ හැකියාව ද ඊට පවතිනවා. එනම් යම් පාර්ශ්වයකට පක්ෂපාත ලෙස තොරතුරු නිර්මාණය කිරීමේ හැකියාව කෘත්‍රිම බුද්ධියට තිබෙනවා. ආචාරධර්ම සම්බන්ධයෙන් ද මෙහිදී ප්‍රශ්න මතුවිය හැකියි. මාධ්‍යවේදීන්ගේ රැකියා සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලු මතු වීම මෙන් ම අසත්‍ය ප්‍රවෘත්ති ලබා දීම හේතු වන්නේ ගැටුම්වලටත්.

ආයතනයකින් ප්‍රවෘත්තියක් ලබාදීමේදී වගකීමක් තිබෙනවා. එහෙත් කෘත්‍රිම බුද්ධියෙන් එය නිර්මාණය කළ හැකි වීම හේතුවෙන් වගකීම පිළිබඳ මතු වන්නේ ගැටලු. අන් අයගේ නිර්මාණ සොරකම් කිරීමට ද කෘත්‍රිම බුද්ධියට හැකියාව තිබෙනවා. බුද්ධිමය දේපළ පනත යටතේ සිදුවන වැරදි එමඟින් සිදුවිය හැකියි. දත්තවල පුද්ගලිකත්වය බිඳ දැමිය හැකියි. කෘත්‍රිම බුද්ධිය නියාමනය කිරීමත් ගැටලුවක්.


කෘත්‍රිම බුද්ධිය භාවිතයේදී යොදගත යුතු ආචාරධර්ම නිර්මාණය කිරීමට කතාබහක් පවතිනවා. යුරෝපා සංගමය මෙන් ම ඇමරිකාව ඒ සම්බන්ධයෙන් මේ වන විට අවධානය යොමු කර අවසන්. ලබාගත හැකි දත්ත හා සංවේදී දත්ත පිළිබඳ එහිදී සාකච්ඡාවට ලක් ව තිබෙනවා. එසේ ම කෘත්‍රිම බුද්ධියෙන් යමක් ජනනය කිරීමේදී මතුවිය හැකි පක්ෂපාතිත්වය වැළැක්වීමට ආචාරධර්ම පද්ධතියක් ගොඩනගා තිබෙනවා. එහෙත් ලෝකය ම පිළිගන්නා නියාමනයක් බවට එය පත් ව නැහැ. විනිවිදභාවය අවම වීම ඊට හේතුවක්.

අද ඒක මාර්ගික මාධ්‍ය වෙනුවට බහුමාධ්‍ය නිර්මාණය වී තිබෙනවා. නාළිකාවකින් පෙන්වන වැඩසටහන පමණක් නැරඹීමටයි අතීතයේ සිදු වුණේ. කැමති වුවත් අකමැති වුවත් එය නැරඹිය යුතුයි. එහෙත් මේ වන විට එය වෙනස් වී තිබෙනවා කෘත්‍රිම බුද්ධිය නිසා. වර්තමානයේ පවතින්නේ ග්‍රාහකයාට අවශ්‍ය නාළිකාව හෝ අවශ්‍ය වැඩසටහන (Media on demand) නැරඹිය හැකි තත්ත්වයක්. එනම් ජනතාවගේ කැමැත්ත අනුව එය තෝරා ගැනීම කළ හැකියි. සමාජ මාධ්‍ය සෑම විට ම ග්‍රාහකයාට අවශ්‍ය පරිදි පරිශීලනය කළ හැකි මාධ්‍යයක්. දැන් ජනමාධ්‍ය ලබා දෙන්නේ ද ග්‍රාහකයාට අවශ්‍ය ආකාරයේ අන්තර්ගත.

කෘත්‍රිම බුද්ධියේ විශාලතම බලපෑම වන්නේ අනාගතයේ මාධ්‍ය තුළ ජීවත්වීමට ග්‍රාහකයාට පදනම සැකසීම. එනම් ග්‍රාහකයා කැමති ආකාරයෙන් නිර්මාණය කරන වැඩසටහන් නැරඹීමට අවස්ථාව ලබාදීම. මෙහිදී ග්‍රාහකයාගේ මානසිකත්වය අනුව මාධ්‍ය මගින් නිර්මාණයක් සකස් කර එම මානසිකත්වයට ගැළපෙන ලෙස ග්‍රාහකයාට ප්‍රදර්ශනය කරනවා. එනම් ග්‍රාහක මානසිකත්වයට ගැළපෙන අන්තර්ගත මාධ්‍ය විසින් නිර්මාණය කරනු ලැබීමයි මෙහිදී සිදු වන්නේ. විවිධ ක්‍රීඩා (Game) ආදිය ඒ සඳහා උදාහරණ. එය Immesive media ලෙස හැඳින්වෙනවා. ඒ අනුව ග්‍රාහකයා රේඛීය මාධ්‍ය (Linear media) සිට ඉල්ලුම මත මාධ්‍ය (Media on demand) වෙත යොමු වී මේ වන විට Immesive media වෙත යොමු වීමේ තත්ත්වයක් දැක ගත හැකියි. ශ්‍රී ලංකාවේ ද මෙය අඩු වැඩි වශයෙන් තිබෙනවා.

# තේ පිරියෙසුමට 100යි

**නිරෝෂි දොඹගහගේ**




ශ්‍රී ලංකා තෙ' පර්යෙ'ෂණ ආයතනයේ සියවස් සැමරුම (1925-2025) යෙදී තිබෙන්නේ 2025 වර්ෂයට. එසේ ම ලෝක තේ දිනය (**World Tea Day**) ද මැයි මස 21 දිනට යෙදී තිබෙනවා. මෙවර 'අතීත සැරිසර' විශේෂාංගය ලියැවෙන්නේ විශේෂයෙන් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ සියවස් සැමරුම නිමිතතෙන්.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණය - 2024 අනුව මෙරට අපනයන සංයුතිය සලකා බැලීමේදී කෘෂිකාර්මික අපනයන අතර ප්‍රධානතම අපනයන බෝගය වන්නේ තේ. 2020 සිට 2024 වර්ෂය දක්වා මෙරටින් අපනයනය කර ඇති තේ වටිනාකම පිළිවෙළින් එක්සත් ජනපද ඩොලර් මිලියන 1240.9ක්, 1324.4ක්, 1258.8ක්, 1309.9ක් හා 1435.9ක්. 2024 වර්ෂයේදී මෙරට සමස්ත අපනයනවලින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය 21.7%ක් වූ අතර ඉන් 11.2%ක් ම තේ අපනයන. මෙරට අපනයන ආදායම කෙරෙහි තේ වගාවේ දායකත්වය කැපී පෙනෙන බව මෙයින් පැහැදිලි වනවා.

මෙවැනි පසුබිමක 'තේ පර්යේෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටතමයා වෙමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නංවාලීම සඳහා අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම ලබාදෙමින් ලොව ප්‍රමුඛතම තේ නිෂ්පාදකයා බවට පත්වීම' යන්න දැක්ම කර ගත් තලවකැලේ පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සිය සියවස් සැමරුම (1925-2025) සඳහා සූදානම්. ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය විසින් සංවිධානය කරනු ලබන තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමේ සම්මේලනයට (FAO-Intergovernmental on Group of Tea-iGG) සමගාමී ව 'inTSym100' ලෙසින් අන්තර්ජාතික තේ විද්‍යා සම්මන්ත්‍රණය (International Tea Symposium) 2025 නොවැම්බර් 10, 11 දිනවල කොළඹදී පැවැත්වීමට තීරණය කර ඇත්තේ ද මීට සමගාමී ව.

සියවස් සැමරුම නිමිති කරගත් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට තේ පර්යේෂණ ආයතනය 'සියවස් සැමරුම් ලේකම් කාර්යාලය' (TRI Centenary Secretariat) ස්ථාපිත කර තිබෙනවා. ඒ අනුව, සියවස් සැමරුම් නිල ලාංඡනය සහ Brewing Innovation යන තේමා පාඨය එළි දැක්වීම, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ නිල යූ ටියුබ් නාලිකාව එළි දැක්වීම යනාදිය මේ වන විට සිදු කර අවසන්.

ශ්‍රී ලංකාවේ තේ වගා කිරීමට අවශ්‍ය මුල් බීජ කල්කටා උද්භිද උද්‍යානයෙන් ලංකාවට ගෙන එන ලද්දේ 1839 වර්ෂයේදී. වර්තමානයේ නුවරඑළිය පීඩ්රු වතුයාය ලෙසින් හඳුන්වන භූමියේ මුලින් ම තේ පැළ වගා කිරීම ආරම්භ කෙරුණා. මෙරට තේ වගාව වානිජමය වශයෙන් ආරම්භ කිරීමේ ගෞරවය හිමිවන්නේ ජේම්ස් ටේලර්ට. ඔහු 1867 වර්ෂයේදී ලූල්කඳුර වතුයායේ (හේවාහැට) තේ වගා කළ බවයි වාර්තා වන්නේ. පසුකාලීන ව ලෝකයේ සන්නාමයක් බවට පත්වූ 'සිලෝන් තේ'(Ceylon Tea)හි උපත ඒ සමග සනිටුහන් වූ බව සැලකෙනවා. මෙරට නිෂ්පාදිත Ceylon Tea මුල් වරට ලන්ඩන් තේ වෙන්දේසියේදී විකුණන ලද්දේ 1873 වර්ෂයේදී.

'ලංකා තේ පර්යේෂණ ආයතනය' එවකට නුවරඑළිය නගරයට ආසන්න ලින්ඩ්ෆීල්ඩ් (Lindfield) වතුයායේදී 1925 ජූලි 01 දින ලංකා වැවිලිකරුවන්ගේ සංගමයේ ශාඛාවක් ලෙස ආරම්භ කෙරුණේ තේ වගාවට සම්බන්ධ වැවිලිකරුවන්ගේ සහ තේ කර්මාන්තශාලා හිමිකරුවන්ට මුහුණපෑමට සිදු වූ ප්‍රධානම අභියෝගය වූ රෝග, දිලීර සහ කෘමි හානි ආශ්‍රිත ගැටලු සඳහා විසඳුම් සොයා ගැනීමට අවශ්‍ය පර්යේෂණ කිරීමේ අරමුණ පෙරදැරි ව. මෙය ලොව තේ වගා කරන රටවල ස්ථාපිත කරන ලද පර්යේෂණ ආයතන අතර දෙවැනියට ස්ථාපිත වූ තේ පර්යේෂණ ආයතනය. එම ආයතනය තලවාකැලේ ශාන්ත කූම්බ්ස් වතුයායේ ස්ථාපිත කරන ලද නව පර්යේෂණාගාරය සහ කාර්යාල සංකීර්ණය වෙත රැගෙන එන ලද්දේ 1929 වර්ෂයේදී. තේ ක්ෂේත්‍රයට අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරන සහ පර්යේෂණ සහ සංවර්ධන කාර්ය වෙනුවෙන් දැනට මෙරට ස්ථාපිත ව ඇති එක ම ආයතනය ලෙසයි මෙය සැලකෙන්නේ. තේ වගා කළ ඉංග්‍රීසි යටත්විජිතයක් වූ රටවල ස්ථාපිත කරන ලද පර්යේෂණ ආයතන සතු පුස්තකාල

අතර තේ ක්ෂේත්‍රයට පමණක් ම විශේෂිත වූ පැරණි ම පුස්තකාලයක හිමිකාරිත්වය ද මෙරට තේ පර්යේෂණ ආයතනය සතුවීම විශේෂත්වයක්.

සිදු කරන පර්යේෂණ රෝග හා පලිබෝධ මර්දනයට පමණක් සීමා නොවී ලංකා තේ පර්යේෂණ ආයතනය පසුකාලීන ව පස හා ශාක පෝෂණය, ශාක කායික විද්‍යාව, ශෂ්‍ය විද්‍යාව සහ කර්මාන්තශාලා මෙහෙයුම් ආදී අංශ ඔස්සේ ද පෘථුල ලෙස ව්‍යාප්තවීම ඇරඹුණේ තේ වගාවේ ක්‍රමික ව්‍යාප්තිය, තේ විද්‍යාවේ විකාශය වැනි සාධක පදනම් ව.

නිදහසින් පසු මෙරට සිදු වූ සමාජ, ආර්ථික සහ දේශපාලනික වෙනස්කම් සමග විදෙස් ජාතිකයන්ගෙන් සමන්විත ව තිබූ වැවිලිකරුවන්ගේ සංගමය හා මණ්ඩලයක් යටතේ පරිපාලනය කරන ලද ලංකා තේ පර්යේෂණ ආයතනය 1957 වර්ෂයේදී රාජ්‍ය ආයතනයක් බවට පරිවර්තනය වූ අතර 1975 වර්ෂයේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ ස්ථාපිත ආයතනයක් බවට පත්වුණා. 1993 වර්ෂයේදී ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් වූ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය රජයේ ව්‍යවස්ථාපිත සංස්ථාවක් ලෙස ස්ථාපිත වූයේ 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත ප්‍රකාර ව. ඒ අනුව වර්තමානය වන විට ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කළමනාකාරිත්වය සිදු කෙරෙන්නේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය යටතේ. තේ පර්යේෂණ මණ්ඩලයේ මූලික කාර්යභාරය වන්නේ තේ වගාව සහ පිරිසැකසුම් ආශ්‍රිත පර්යේෂණවල නියැළීම සහ දිරිමත් කිරීම, ඒ සඳහා පහසුකම් සැපයීම සහ සහයෝගය ලබා දීම.

ඒ අනුව තේ වගාවේ රෝග සහ පළිබෝධ වැළැක්වීම සහ මර්දනය, නිමි තේවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, නිෂ්පාදන විවිධාංගීකරණය ආදී තේ වගාව සහ නිෂ්පාදනය සඳහා බලපාන සියලු ගැටලු සහ කරුණු පිළිබඳ ව පර්යේෂණ මෙහෙයවීම, සහයෝගය ලබා දීම සහ දිරිමත් කිරීම හා තොරතුරු සන්නිවේදනය, තේ කර්මාන්තයේ ආර්ථික ශක්‍යතා සහ ගැටලු සම්බන්ධයෙන් මෙන් ම අනාගත ප්‍රවණතා පිළිබඳ පර්යේෂණ මෙහෙයවීම, දේශීය විදේශීය පර්යේෂණායතන සමග සබඳතා පවත්වාගෙන යාම, සහයෝගී අධ්‍යයන වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ සමුළු ආදිය පැවැත්වීම යනාදිය තේ පර්යේෂණ මණ්ඩලයේ විශේෂ කාර්යභාරය ලෙස හඳුනා ගන්නට පුළුවන්.

අදහස් දක්වන ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ (රාජකාරී ඉටුකරන) ආචාර්ය ඒ.බී. මහසෙන් රණතුංග; “දැනට තේ කර්මාන්තය මුහුණපාමින් සිටින ප්‍රධාන අභියෝග හඳුනාගැනීමත් එම අභියෝග ජය ගැනීමට සුදුසු තාක්ෂණික/විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමෙන් අවශ්‍ය තාක්ෂණය ජනනය කිරීමත් අපගේ සුවිශේෂ කාර්යයක්. එසේ ම 'සිලෝන් තේ' සන්නාමය දේශීය සහ ගෝලීය වෙළෙඳපොළේ රැකගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීමට අවශ්‍ය පර්යේෂණ සහ තාක්ෂණික දායකත්වය අප ලබා දෙනවා. ඉදිරි වෙළෙඳපොළ අවශ්‍යතා සහ ගෝලීය වශයෙන් ඇති වන ප්‍රවණතා ඔස්සේ තේ නිපදවන අනෙකුත් රටවල් සමග තරගකාරී ව ක්‍රියා කිරීමට අවශ්‍ය පසුබිම සකසා ගැනීමට අවශ්‍ය පර්යේෂණ සහ සංවර්ධන කාර්ය සඳහා අවධානය යොමු කිරීම අනෙකුත් කාර්ය අතරට අයත්. ඒ අනුව බෝග වැඩිදියුණු කිරීම, පාංශු සහ භූමි ඵලදායිතාව වැඩිදියුණු කිරීම, යාන්ත්‍රීකරණය, තේ සැකසීම, අගය එකතු කිරීම, දේශගුණික විපර්යාස අවම කිරීම, සම්පත් සැලසුම් කිරීම, තේවල සෞඛ්‍යමය ප්‍රතිලාභ, උපදෙස් සහ තාක්ෂණ ව්‍යාප්ති සේවා යනාදී තේමා 09ක් යටතේ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් අප ක්‍රියාත්මක කරනවා.”

සිදු කරන පර්යේෂණ රෝග හා පලිබෝධ මර්දනයට පමණක් සීමා නොවී ලංකා තේ පර්යේෂණ ආයතනය පසුකාලීන ව පස හා ශාක පෝෂණය, ශාක කායික විද්‍යාව, ශෂ්‍ය විද්‍යාව සහ කර්මාන්තශාලා මෙහෙයුම් ආදී අංශ ඔස්සේ ද පෘථුල ලෙස ව්‍යාප්තවීම ඇරඹුණේ තේ වගාවේ ක්‍රමික ව්‍යාප්තිය, තේ විද්‍යාවේ විකාශය වැනි සාධක පදනම් ව.

මෙරට තේ කර්මාන්තය මුහුණදෙන අභියෝග අතර වර්තමානය වන විට තේ වගාවේ පිරිවැය කළමනාකරණය ඉතා අසීරු කාර්යයක්. මේ නිසා තේ අගය දාම ක්‍රියාවලිය සම්බන්ධ පිරිවැය ඇස්තමේන්තුගත කිරීම සහ කළමනාකරණය ඔවුන්ගේ ප්‍රමුඛ කාර්යයක්. රසායනික පොහොරවලට දැරීමට සිදුවන අධික පිරිවැය අවම කර ගැනීමට සහ ඒකාබද්ධ පෝෂක කළමනාකරණ ප්‍රවේශය තහවුරු කිරීමට පරිසර හිතකාමී කෘෂි යෙදවුම් භාවිතය, දිගුකාලීන ව සෙමින් පෝෂක නිකුත් වන නැනෝ යූරියා නිෂ්පාදනය වැනි පර්යේෂණ සිදු කිරීම ඊට උදාහරණයක්.

තේ දලුවල ප්‍රමිතිය පවත්වා ගැනීම, ගුණාත්මකභාවය තහවුරු කිරීම සහ සහතිකකරණය මගින් උසස් තේ නිෂ්පාදනය කිරීම අභියෝගාත්මක කාර්යයක්. ඒ වෙනුවෙන් තේ දලු නෙළීමේ සිට තේ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය දක්වා සිදු කෙරෙන කාර්යයන් සඳහා අවශ්‍ය සියලු ම තාක්ෂණික මඟ පෙන්වීම ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය ලබා දෙනවා. මෙහිදී තේවල ගුණාත්මකභාවය සහතිකකරණය සම්බන්ධ දේශීය සහ ජාත්‍යන්තර මට්ටමේ සහතිකකරණයට අවශ්‍ය සුදුසුකම් තේ වගාකරුවන්ට, තේ නිෂ්පාදකයන්ට මෙන් ම තේ අපනයනකරුවන්ට ලබා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමත් තේ පර්යේෂණ ආයතනයේ විශේෂිත කාර්යයක්.

දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව ඇති තේ ප්‍රභේද වැඩිදියුණු කිරීමට තේ පර්යේෂණ ආයතනය උත්සාහ කරන්නේ තේ කර්මාන්තයට එල්ලවන දේශගුණික සහ කාලගුණික විපර්යාස සම්බන්ධ අවදානම පුරෝකථනය කරමින්. තේ වතු කම්කරුවන් වතුයාය ආශ්‍රිත රැකියාවෙන් පිටවී යෑම සහ නව ශ්‍රම බලකායේ ඇති අස්ථාවරභාවය මෙරට තේ කර්මාන්තය මුහුණදෙන තවත් අභියෝග යක්. උචිත කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය, ශ්‍රම බලකායේ හිඟය සඳහා විකල්ප සේවකයන් යෙදවීම, තේ වගා බිම් යාන්ත්‍රිකරණයට සුදුසු ලෙස සකසා ගැනීම, එවැනි යන්ත්‍රසූත්‍ර නිපදවීමට අවශ්‍ය පර්යේෂණ තේ පර්යේෂණ

ආයතනය විසින් සිදු කරනු ලබන්නේ ඊට පිළියමක් ලෙස.

ජාත්‍යන්තර තරගකාරීත්වය, පැරණි තේ වගා ප්‍රතිස්ථාපනය නොවීම, නව වෙළෙඳපොළට යොමු වීම අවම වීම යනාදී අභියෝග සඳහා විසඳුම් ලෙස ද ක්‍රියාමාර්ග රාශියක් ගෙන තිබෙනවා. නවෝත්පාදන වානිජකරණය සඳහා 2020 වසරේදී තාක්ෂණික හුවමාරු කාර්යාලයක් (Technology Transfer Office) පිහිටුවීම, තේ ආශ්‍රිත නිෂ්පාදන සඳහා අගය එකතු කරමින් නව තේ ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීම, එම නිෂ්පාදන වෙනුවෙන් අවශ්‍ය පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සහ ඒවා වානිජ මට්ටමින් නිෂ්පාදනයට අවශ්‍ය පියවර සකස් කිරීම යනාදිය එම ක්‍රියාමාර්ග කිහිපයක්. එසේ ම අගය එකතු කළ නිෂ්පාදනයක් වන තේ වයින් වානිජ මට්ටමින් නිපදවමින් වෙළෙඳපොළට නිකුත් කිරීමට තෝරාගත් සමාගමක් සමග ගිවිසුම්ගත වී තිබෙනවා.

මෙරට තේ කර්මාන්තය නගා සිටුවීම කෙරෙහි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සියවසක් මුළුල්ලේ ලබා දී ඇති මේ අනගි දායකත්වය ඉදිරියේදීත් සාර්ථක ව ලබා ගැනීමෙන් මෙරට තේ කර්මාන්තය තවදුරටත් නගා සිටුවීමට හැකියාව ලැබෙනු ඇති බව සපථ කළ හැකි කාරණයක්.



# කම්කරු පංතියේ

**වසන්ත දිසානායක**

උදවන 2025 මැයි 01 දිනය කම්කරු පංතියේ පංති සටනේ කාහළ නාදය පතුරුවන ලෝක කම්කරු දිනයේ 136 වැනි සංවත්සරය සටහන් කරන දිනය. ලෝක පරිමාණ ඓතිහාසික හා ප්‍රායෝගික දේශපාලන වැදගත්කමක් අඩංගු කර ගන්නා දිනයක් වශයෙන් සංලක්ෂිත එම දිනයේ ආරම්භය සටහන් වන්නේ 1889 මැයි 01 දින. කම්කරු පංතියට කම්කරු දිනය හා මැයි දිනය එක ම දිනයක් වශයෙන් අනන්‍ය වී තිබෙනවා. බොහෝ රටවලත් රාජ්‍ය මට්ටමින් ද මැයි දිනය හා ලෝක කම්කරු දිනය යනු එක ම දිනයක්. එහෙත් ඇමරිකා එක්සත් ජනපදයේ හා කැනඩාවේ රාජ්‍ය 'කම්කරු දිනය' වශයෙන් සලකන්නේ සෑම වසරක ම සැප්තැම්බර් මාසයේ පළමු වැනි සඳුදා.

මැයි දිනය හෙවත් ලෝක කම්කරු දිනය උපත ලබන්නේ පැය 08ක වැඩ කරන දිනයක් උදෙසා වූ ඉල්ලීම පදනම් කරගෙන. මේ ඉල්ලීම පැන නගින විට කම්කරුවන්ට දිනකට පැය 10-16 දක්වා අතර කාලයක් ඉතා දුක්ඛිත තත්ත්වයක් යටතේ වැඩ කිරීමට සිදු ව තිබුණා. පැය 08ක වැඩ දිනයක් සඳහා වූ ඉල්ලීම පෙරට දැමුවේ මුල්කාලීන සමාජවාදියකු වූ රොබට් ඕවන්. ඒ, 1817දී ඉදිරිපත් කළ ඔහුගේ සුප්‍රසිද්ධ සටන් පාඨය වන "පැය 08ක ශ්‍රමය, පැය 08ක විනෝදායනය, පැය 08ක විවේකය" (Eight hours labour, eight hours recreation, eight hours rest) යන සටන් පාඨයෙන්.

පැය 08 වැඩ දිනය ගැන කතා කළ මාක්ස් එය කම්කරුවන්ගේ සෞඛ්‍යයට තීරණාත්මක වැදගත්කමක් ගන්නා බව කියා සිටියා. මාක්ස් තවදුරටත් සිය 'ප්‍රාග්ධනය' කෘතියෙහි පෙන්වා දුන්නේ ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය විසින් වැඩ දිනය දීර්ඝ කිරීමෙන් මානව ශ්‍රම



# විප්ලවීය අරගලය

ශක්තියේ සාමාන්‍ය සදාචාරාත්මක හා භෞතික සංවර්ධනය හා ක්‍රියාකාරිත්වය කොල්ලකනු ලබන බවත් එමගින් එහි පරිහානියක් ඇති කරනු ලබන බවත් ඉන් නොනැවතී එහි ම අකල් ක්ෂයවීම හා මරණය ඇති කරනු ලබන බවත්.

පැය 08 වැඩ දිනය ප්‍රවර්ධනය කිරීමේ වැදගත් ඓතිහාසික අවස්ථාවක් වන්නේ ඇමරිකාවේ කැනඩාවේ සංවිධිත වෘත්තීය හා කම්කරු සමිති සම්මේලනය 1886 මැයි 01 දින සිට පැය 08ක වැඩ දිනයක් සංස්ථාපනය කළ යුතු බවට 1884දී යෝජනාවක් සම්මත කිරීම හා ඒ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයට පිවිසීම. යෝජිත දිනය වූ 1886 මැයි 01 දින ඇමරිකාවේ චිකාගෝ කේන්ද්‍රය කරගෙන 50,000කට අධික කම්කරුවන් පැය 08ක වැඩ දිනයක් ඉල්ලා ආරම්භ කළ මහා වැඩ වර්ජනය පැය 08 වැඩ දිනයක් සඳහා වූ අරගලයේ තීරණාත්මක අවස්ථාවක්. වර්ජිතයන්ට පොලිසිය පහර දීමත් පොලිස් ප්‍රහාරයෙන් එක් කම්කරුවකු මරුමුවට පත් වීමත් අරගලය තවත් තීව්‍ර කිරීමට හේතු වුණා. පොලිස් පහර දීමට හා කම්කරුවකු මරා දැමීමට එරෙහි ව විරෝධය පෑම් වස් 1886 මැයි 04 දින කැඳ වූ චිකාගෝවේ හේමාකට් චතුරශ්‍රයේ පැවැත් වූ සාමකාමී විරෝධතා රැළිය මැඩලීමට පොලිසිය ගත් උත්සාහයත් සමග ඇති වූ ප්‍රචණ්ඩකාරී තත්ත්වය පැය 08 වැඩ දිනයක් සඳහා වූ අරගලයේ උච්චතම අවස්ථාවක් ලෙස නම් කළ හැකියි. මේ අරගලයේ ඊළඟ වැදගත් අවස්ථාව වන්නේ අන්තර්ජාතික වැඩකරන මිනිසුන්ගේ සංවිධානය හෙවත් පළමු වැනි ජාත්‍යන්තරය 1886 සැප්තැම්බර් ජිනීවා සම්මේලනයේදී පැය 08 වැඩ දිනය නීත්‍යානුකූල වැඩ දිනය ලෙස ගත යුතු යැයි සම්මත කිරීමෙන් එම ඉල්ලීමට නව ජීවයක් එක් කිරීම. එහෙත් නිශ්චිත ලෙස තවමත් ලෝක කම්කරු දිනයක් පිළිබඳ අදහසක් මතු ව තිබුණා යැයි කිව නොහැකියි. මේ පිළිබඳ නිශ්චිත ව අදහසක් පිළිසිඳ ගන්නේ 1889 මැයි 01 දින ප්‍රධාන වශයෙන් ලන්ඩනයේදීත් ඇමරිකාව ආදී රටවල් ගණනාවකදීත් 1886 මැයි 01 හා මැයි 04 යන දිනවල චිකාගෝවේ හේමාකට් චතුරශ්‍රයේ ඇති වූ සිදුවීම් අනුස්මරණය කරමින් පැවැත් වූ කම්කරු රැළි පාදක කරගෙන.

නිශ්චිත ලෙස ලෝක කම්කරු දිනයක් ප්‍රකාශයට පත් කෙරෙන්නේ 1889 ජූලි 14 දින පැරිසියේ පැවති දෙවැනි ජාත්‍යන්තරයේ ප්‍රථම රැස්වීමේදී. එහිදී මැයි 01 දින

> නිශ්චිත ලෙස ලෝක කම්කරු දිනයක් ප්‍රකාශයට පත් කෙරෙන්නේ 1889 ජූලි 14 දින පැරිසියේ පැවති දෙවැනි ජාත්‍යන්තරයේ ප්‍රථම රැස්වීමේදී . එහිදී මැයි 01 දින ජාත්‍යන්තර කම්කරු දිනය වශයෙන් ප්‍රකාශයට පත් කිරීමත් සමග අතිනත ගෙනයි මැයි 01 දින ලෝක කම්කරු දිනය වශයෙන් කම්කරු පංතියේ අනුස්මරණීය දිනයක් බවට පත් වන්නේ.

ජාත්‍යන්තර කම්කරු දිනය වශයෙන් ප්‍රකාශයට පත් කිරීමත් සමග අතිනත ගෙනයි මැයි 01 දින ලෝක කම්කරු දිනය වශයෙන් කම්කරු පංතියේ අනුස්මරණීය දිනයක් බවට පත් වන්නේ.

මැයි දිනය හෙවත් ලෝක කම්කරු දිනය යනු කම්කරු පංතියේ ඉල්ලීම් ඉදිරිපත් කරන හා ප්‍රකාශයට පත් කරන නිශ්චිත දිනයක් පමණක් නොව එය සිය සාධාරණ ඉල්ලීම් දිනා ගැනීම සඳහා ද සූරාකෑමට හා සියලු පීඩනයට එරෙහි ව ද අරගල කරන්නට එහි ඇති සූදානම, අරගලයෙහිලා අවශ්‍ය කරන කම්කරු පංතියේ එක්සත්කම, අධිෂ්ඨානය හා කැපවීම ප්‍රකාශයට පත් කරන සුවිශේෂ දිනයක්.

එහෙත් අද වන විට ලෝකයේ ම මැයි දිනය සමරන්නේ ඒ අර්ථයෙන් නොවෙයි. දේශපාලන පක්ෂ ද වෘත්තීය සමිති ද සාම්ප්‍රදායික උත්සවයක් වශයෙන් මැයි දිනය සමරන බව ඇත්තක්. නිදසුන් ලෙස අද ශ්‍රී ලංකාවේ කම්කරු පංතිය විසින් පවත්වනු ලබන එක් මැයි දින උත්සවයක් නැහැ. පැවැත්වෙන්නේ එක් එක් වෘත්තීය සමිති හෝ වෘත්තීය සමිති එකතු ලෙස වෙන් වෙන් ව පවත්වන මැයි දින රැළි. දේශපාලන පක්ෂ විසින් වෙන් වෙන් ව පවත්වනු ලබන මැයි රැළි. අරුමය වන්නේ කම්කරු පංතියේ ප්‍රති පක්ෂය වන ධනපති පංතියේ දේශපාලන පක්ෂ හා කණ්ඩායම් ද මැයි දිනය උත්සවාකාරයෙන් පැවැත්වීම.

ලෝක කම්කරු දිනයේ අර්ථය හා අභිමානය ශ්‍රී ලංකාවේ මෙන් ම බොහෝ රටවල ද කම්කරු පංතියෙන් උදුරා ගනු ලැබ තිබෙනවා. එය කම්කරු පංතියේ නොව සුළු ධනපති පංතිවල පටන් ධනේශ්වර පංති දක්වා වන කම්කරු පංති නොවන බලවේගවල ඵලප්‍රයෝජන විදහා දක්වන සැණකෙළියක් බවට පත් කර තිබෙනවා. කම්කරු පංතියේ සටන්කාමිත්වය සුළු ධනේශ්වර හා ධනේශ්වර පංතිවල උවමනා එපාකම්වල ගිල්වා දමා තිබෙනවා. බොහෝ 'කම්කරු' රැළිවල නැගෙන්නේ කම්කරු පංතියේ පංති සටනේ කාහළ නාදය නංවන සටන් පාඨ නොව සුළු ධනේශ්වර හා ධනේශ්වර පංති බලවේගවල පුරාජේරුව කියාපාන සටන් පාඨ. කම්කරු පංතියේ අභිමානවත් ජාත්‍යන්තර ගීය නොව ධනේශ්වර පංතිවල අවශ්‍යතා කියාපාන ස්තෝත්‍ර ගී.

මේ වන විට කම්කරු පංතිය, කම්කරු පංතිමය දේශපාලන බලවේග ලෙස ක්‍රියා කිරීම නැවතී තිබෙනවා. නැතහොත් කම්කරු පංති ධනේශ්වර ලුතිනන්ලා විසින් එය එසේ ක්‍රියා කිරීම නවතා දමනු ලැබ තිබෙනවා. කම්කරු පංතියමත් කම්කරු පංති දේශපාලන

සේනාංකයක සිට සුළු ධනේශ්වර නැතහොත් ධනේශ්වර දේශපාලන සේනාංකයක් බවට පිරිහවා තිබෙනවා.

ශ්‍රී ලංකාවේ මෙන් ම අන් බොහෝ රටවලදී ද කම්කරු පංති හා වාමාංශික නායකයන්ගේ කාර්යය වී ඇත්තේ කම්කරු පංතිය සුළු ධනේශ්වර දේශපාලනයක එනයින් අවසානයේ ධනේශ්වර දේශපාලනයක ගාල් කිරීම. මෙමගින් අද කම්කරු පංතිය ඓතිහාසික පරාජයකට පත් කිරීම. අද කම්කරු පංතියේ නායකයන් බවට පත් ව සිටින සියලු දෙනා ම පාහේ කම්කරු පංතිය මෙහෙය වන්නේ, කම්කරු පංතියට නායකත්වය දෙන්නේ ධනේශ්වර පාලන පෙරළා දමා කම්කරු පංතිය ප්‍රමුඛ පීඩිත බලවේගවල ඵලප්‍රයෝජන ඉටු කරන පංති පාලනයක් බිහිකර ගැනීම සඳහා නොව හුදෙක් පවතින ක්‍රමයේ ම අයිතිවාසිකම් යම් ප්‍රමාණයක් දිනා ගැනීමට, ආරක්ෂා කර ගැනීමට පමණයි. ඉන් ඔබ්බට කම්කරු පංතිය මෙහෙයවීමක් ගැන සිතීමක් ඇත්තේ ම නැහැ.

අද වන විට කම්කරු පංතියේ කම්කරු පංති දේශපාලනය පමණක් නොව කම්කරු පංතියේ ධනේශ්වර දේශපාලනය හුදෙක් ප්‍රතිසංස්කරණවලට පමණක් කම්කරු පංතිය කොටු කර දමන ප්‍රතිසංස්කරණවාදී දේශපාලනයේ ගිල්වා දමා ඇති තත්ත්වයකට පත් කර තිබෙනවා. මෙහි අවසන් තාර්කික ප්‍රතිඵලය විය හැක්කේ බොහෝ විට අරාජකවාදී ප්‍රචණ්ඩකාරී දේශපාලන ක්‍රියාකාරිත්ව පැන නැගීම.

ධනපති ක්‍රමය පෙරළා දැමීමේ විප්ලවීය අරගලයට නායකත්වය දිය හැක්කේ කම්කරු පංති දේශපාලනයෙන් පන්නරගත වන හා සෙසු පීඩිත බලවේග තමන් වටා පෙළ ගස්වා ගන්නා කම්කරු පංතියට පමණයි. එසේ වුවත් කම්කරු පංතියේ ස්වාභාවික ව පැන නගින්නේ ප්‍රතිසංස්කරණ සඳහා වන අරගලය. නිදසුන් ලෙස ලෝක කම්කරු දිනයට පාදක වූ පැය 08 වැඩ දිනයක් සඳහා වූ අරගලය එවැන්නක්. ධනේශ්වර ක්‍රමයේ එවැනි අරගල රාශියක් නිරායාසයෙන් ම පැන නගින අතර කම්කරු පංතිය එම අරගල තිරසර ව ඉදිරියට ගෙන යා යුතුමයි. එයින් තොර ව කම්කරු පංතියට සිය විමුක්තිය මෙන් ම සමස්ත මනුෂ්‍ය වර්ගයාගේ විමුක්තිය සඳහා වන අරගලයට සැබෑ දායකත්වයක්, සැබෑ නායකත්වයක් දිය නොහැකියි. එහෙත් එකී අරගලයට පමණක් කම්කරු පංතියේ හා සමස්ත මනුෂ්‍ය වර්ගයාගේ විමුක්තිය සඳහා වන අරගලය සාධනය කර ගත නොහැකියි. ඒ සඳහා එම අරගලය කම්කරු පංතියේ විප්ලවීය පංති අරගලය, විප්ලවීය දේශපාලන අරගලය සමග වෙන් කළ නොහැකි සේ ඒකාබද්ධ කළ යුතුමයි.

පැය 08 වැඩ දිනයක් සඳහා වූ ප්‍රතිසංස්කරණමය ඉල්ලීම පාදක කරගෙන පැවැත්මට ආ ලෝක කම්කරු දිනය සැබෑ කම්කරු දිනයක් බවට පරිවර්තනය වූයේ එය කම්කරු පංතියේ විප්ලවීය පංති අරගලය සමග සමස්ත කිරීමෙන්. කාලයක් මුළුල්ලේ ලෝක කම්කරු දිනයේදී ප්‍රකාශයට පත් වූයේ හා මුළු දුන්නේ ප්‍රධානකොට ම එම කම්කරු පංති විප්ලවීය දේශපාලනයේ



කාහළ නාදය. පවතින ක්‍රමය එහි පදනමින් ම වෙනස් කිරීම සඳහා වූ අධිෂ්ඨානය. ඒ සඳහා කම්කරු පංතියේ ඇති සූදානම.

ලෝක කම්කරු දිනය එහි නියම අරුත ප්‍රකාශයට පත් කිරීමට නම් එය යළිත් කම්කරු පංතියේ විමුක්තිය සඳහා වන දේශපාලන අරගලය එනම් සමාජවාදයේ ජයග්‍රහණය පතා වන අරගලය සංකේතවත් කරන්නක් ද කම්කරු පංතියේ සැබෑ සමගිය, සහෝදරත්වය, සටන්කාමීත්වය, අධිෂ්ඨානය ප්‍රකාශයට පත් කරන්නක් ද අවසානයේ කම්කරු පංතියේ පමණක් නොව සමස්ත පීඩිත ජනයාගේ ම විමුක්තිය සඳහා වන අරගලය මූර්තිමත් කරන්නක් ද බවට නගාලීම අවශ්‍ය වනවා.

කම්කරු පංතියට විශේෂයෙන් අද දවසේ මේ කාර්යය සපුරා ගන්නට බැහැ. ඒ, සුළු ධනේශ්වර හා ධනේශ්වර පංති විසින් කම්කරු පංතිය සිය ග්‍රහණයට ගනු ලැබ ඇති නිසා. ආර්ථික, දේශපාලන හා සංවිධානමය වශයෙන් පමණක් නොව දෘෂ්ටිමය වශයෙන් ද කම්කරු පංතිය අද මේ පංතිවල පක්ෂ හා කණ්ඩායම්වල ආධිපත්‍යයට හසු ව ඇති නිසා.

මේ සඳහා කම්කරු පංතිය මේ ආධිපත්‍යයෙන් නිදහස් විය යුතුමයි. මේ සඳහා මග පෙන්විය හැක්කේ සැබෑ සමාජවාදීන්ට පමණයි. ඔවුන් කම්කරු පංති දේශපාලනයට නැවත පිවිසීම සඳහා කම්කරු පංතියට සහය විය යුතුයි. මග පෙන්විය යුතුයි. නායකත්වය දිය යුතුයි. එහෙත් මෙහි දී ද විශාල ගැටලුවක් තිබෙනවා. ඒ, අද දවසේ අප හමුවේ ඊට නායකත්වය දිය හැකි සැබෑ සමාජවාදී ව්‍යාපාරයක් තිබේ ද යන්න.

පවතින තත්ත්ව යටතේ ලෝක කම්කරු දිනය සැබෑ කම්කරු දිනයක් බවට පත් කිරීමට නම් කම්කරු පංති දේශපාලනයක් නගා සිටුවීමට නම් සැබෑ සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැගීමට සටන් වැදීම දවසේ කාර්යයක් බවට පත් ව තිබෙනවා. එය මැයි දින ප්‍රමුඛ අධිෂ්ඨානය බවට පත් කර ගැනීම සමාජවාදයේ වුවමනාවෙන් ක්‍රියා කරන මිනිසුන්ගේ හා ගැහැනුන්ගේ කාර්යයක් විය යුතුයි.



# ධන නොසරි ලිව්සැරි

නුවන් කුමාර කටුගම්පල



අමාත්‍ය මහාචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි, රුසියානු ලේඛක දිමිත්‍රි ලිහනොව්, රුසියානු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂිකා මරියා පොපෝවා සමග තෝල්ස්තෝයි රන් පදක්කම සහ සහතික පත්‍රය අතැති ව මහින්ද සෙනරත් ගමගේ

කොළඹ රුසියානු මන්දිරය අනුබද්ධිත රුසියානු සාහිත්‍ය කවය, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික අමාත්‍යාංශයේ ළමා සාහිත්‍ය ප්‍රවර්ධන වැඩසටහන සහ ශ්‍රී ලංකා ළමා සාහිත්‍ය සංසදය ඒකාබද්ධ ව සංවිධාන කළ සම්මානනීය රුසියානු ලේඛක ඇල්බට් ලිහනොව් 90 වැනි ජන්ම සංවත්සර සාහිත්‍ය කතිකාව මාර්තු 20 දින පැවැත්වුණේ කොළඹ රුසියානු මන්දිරයේදී. ඇල්බට් ලිහනොව්ගේ සාහිත්‍ය ජීවිතය අළලා නිෂ්පාදිත 'ලේඛකයකු ගොඩනැගෙන්නේ කෙසේද?' වාර්තා චිත්‍රපටය එහිදී ප්‍රදර්ශනය කළ අතර ප්‍රවීණ රුසියානු සාහිත්‍යවේදිනියක වන ඉරීනා පුලයා 'රුසියානු ළමා සාහිත්‍ය සහ එහි නව ප්‍රවණතා' මැයෙන් විශේෂ දේශනයක් සහ සංවාදයක් ද මාර්ගගත ව පැවැත්වූවා. ලිහනොව් ලේඛකයාගේ පුතු වන දිමිත්‍රි ඇල්බර්තෝවිච් ලිහනොව් මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා.



ඔහු රචනා කළ '**BIANCA**' කෘතිය සම්මානලාභී පරිවර්තක මහින්ද සෙනරත් ගමගේ විසින් 'බියන්කා' නමින් සිංහල භාෂාවට පරිවර්තනය කරන ලදු ව එය ද එහිදී ජනගත කෙරුණා. සිදුවූ සුවිශේෂතම සිදුවීම වූයේ පොත දොරට වැඩුම අවසානයේදී පූර්ව ප්‍රචාරයකින් හෝ ලේඛකයා දැනුවත් කිරීමකින් හෝ තොර ව මූල්‍යමය ප්‍රතිලාභ අපේක්ෂාවක් නොමැති ව අඛණ්ඩ ව ජීවිත කාලය පුරා යම් යම් ක්ෂේත්‍ර ඔස්සේ ළමයින් වෙනුවෙන් කැපවන ලෝක ප්‍රජාව වෙත රුසියාවේ ළමා අරමුදල් මණ්ඩලය විසින් වාර්ෂික ව පිරිනමනු ලබන 'ලියෝ තොල්ස්තෝයි ජාත්‍යන්තර රන් පදක්කම' ළමා සාහිත්‍ය විෂයට






අදාළ ව 2025 වර්ෂය සඳහා මහින්ද සෙනරත් ගමගේ වෙත පිරිනැමීම. සුවිශේෂත්වය වන්නේ දකුණු ආසියාතික සාහිත්‍යකරුවකු වෙත ප්‍රථම වරට මේ සම්මානය හිමිවීම.

ඔහු රචිත ස්වතන්ත්‍ර සහ පරිවර්ථන සාහිත්‍ය කෘති සංඛ්‍යාව 88ක්. රුසියානු සාහිත්‍ය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ඉටු කළ සේවාව සඳහා රුසියානු සාහිත්‍ය කමිටුව ප්‍රදානය කළ ලියෝ තෝල්ස්තෝයි සම්මානය (2023), රුසියාවේ මොස්කව් නුවර පැවති ප්‍රබන්ධ පරිවර්තකයින්ගේ 8 වැනි ජාත්‍යතයන්තර සම්මේලනය වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය (2024), බස්නාහිර පළාත් විශ්වාභිමානී සම්මානය (2023), රයිගම් මිකෝරළ අභිමානී සම්මානය (2007) යනාදී ඇගයීම්වලට මීට ප්‍රථම ඔහු පාත්‍ර වී තිබෙනවා. ඔහු සිය කේවල සාහිත්‍ය කාර්යභාරය අඛණ්ඩ ව ඉටු කරගෙන ගියා මිස එය රටට ප්‍රචාරණය කළ බවක් පෙනෙන්නට නැහැ. මේ කතාබහ සිදු වන්නේ එම රික්තය පිරවීමට.

ප්‍රශ්නය; ඔබ පොත් ලියා හෝ පරිවර්තනය කර හෝ අලෙවි කළා. එය කර්මාන්තයක් වගේ ම ව්‍යාපාරයක්. මේ නිසා එයින් ලාභ නොලැබුවා හෝ ලාභ ලැබීමේ අපේක්ෂාවක් නොතිබුණා හෝ යැයි ඔබ පවසන්නේ කෙසේ ද?

පිළිතුර; පොත් ප්‍රකාශනයේ ලාභාපේක්ෂාවක් තිබුණත් ලාභ නැතැයි කියා මා මගේ සාහිත්‍ය මෙහෙවර නැවැත්වූයේ හෝ වෙනත් අරමුණු උදෙසා යොමු වූයේ හෝ නැහැ. සියලු දේපළ උකස් කර, ලක්ෂ ගණන් ණය




වී සාහිත්‍යයේ නියැළී කෙතරම් පාඩු ලැබුවත් සාහිත්‍යයෙන් ඉවත් නොවී දිගින් දිගට ම සාහිත්‍යකරණයේ නියැළුණෙක් මම. එසේ කළ හැකි වුණේ හුදෙක් ආත්ම තෘප්තිය ම පමණක් ලාභය ලෙස සලකා සාහිත්‍යකරණයේ නියැළුණු නිසා. මා 'ලාභය' කියා අර්ථ දක්වන්නේ 'ආත්ම තෘප්තිය'. ඔබ 'ලාභය' කියා අර්ථ දක්වන්නේ 'මූල්‍යමය ආදායම'. එයයි වෙනස.

ප්‍රශ්නය; ආදායමක්, ලාභයක්, ජීවිකා වෘත්තියක් නැති ව පවුලක් නඩත්තු කරමින්, සාමාන්‍ය ලෙස ජීවත් වෙමින් සාහිත්‍යකරණයේ නියැළෙන්නේ හෝ පොත් සඳහා අර්ථපතිත්වයක් දරන්නේ හෝ කෙසේ ද?

පිළිතුර; මා සාහිත්‍යය සඳහා යොදන කාලය වෙනත් කාර්යයකට යෙදවුවහොත් මීට වඩා සිය දහස් ගුණයකින් ලාභ ලැබිය හැකියි. මගේ හැකියාවේ සීමා බැලුවත් මීට වඩා පහසුවෙන් කළ හැකි රැකියා, ව්‍යාපාරික ක්ෂේත්‍ර පුළුල්. මා වගේ ම මගේ පවුලේ අරමුණත් සාහිත්‍ය නිර්මාණකරණය ම නිසා ඔවුන් දේපළ උකස් කර මගේ පොත් පළ කළා. කුලී ගෙවල්වල ජීවත් වෙමින්, විදේශගත සහ මෙරට බොහෝ යහළුවන් මගේ පොත් පළ කරන්නට බරපැන දරමින් කොන්දේසි විරහිත ව සාහිත්‍ය උදෙසා මා දිරිමත් කළා. ඒ 'මානව ලාභය' මට හොඳට ම ප්‍රමාණවත්. ආදායමත් ලාභයත් වන්නේ පොතපත ඔස්සේ මනුෂ්‍යත්වය සමාජගත කර ලැබෙන ආත්ම තෘප්තිය. මේ ලැබුණු පදක්කමත් මගේ විතරක් නොවෙයි මා අසළ සිටින ඒ සෙවනැලිවලත්.

ප්‍රශ්නය; ස්වතන්ත්‍ර නිර්මාණකරණය ඉක්මවා ඔබේ ප්‍රධාන නිර්මාණ ධාරාව ලෙස පරිවර්තන සාහිත්‍යය තෝරා ගත්තේ ඇයි?

පිළිතුර; එය අහම්බයක්. තෝරා ගැනීමක් ම නෙවෙයි. රොබට් ඇග්ලිෂ් 'Quite Flows the Don' නමින් ඉංග්‍රීසි බසට පරිවර්තනය කළ නොබෙල් සාහිත්‍ය සම්මානලාභී රුසියානු ලේඛක මිහයිල් ෂෝලහොව්ගේ 'තීහි දොන්' නවකතාව කියවා ලද රසය නිසා මගේ මුල් ම පරිවර්තන ග්‍රන්ථය ලෙස 'දොං නදිය නිසල ව ගලා බසී' (හොඳම ප්‍රකාශිත පරිවර්තන කෘතිය - යෞවන සම්මාන - 2001) එළිදැක්වූවා. එය කියවන අවස්ථාවේ තේරුම් ගැනීමේ පහසුව තකා මා සිංහල භාෂාවට පරිවර්තනය කර ගත්තා. එහිදී මට පරිවර්තනය කිරීමේ හැකියාවක් ඇති බව තේරුණා. එය වෘත්තීය මට්ටමක පවතින බව සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් පැවසූ නිසා යළි දෙවරක් නොසිතා මා පරිවර්තන ක්ෂේත්‍රයට අවතීර්ණ වුණා.

ප්‍රශ්නය; පරිවර්තන කාර්යය අඛණ්ඩ ව ගලා ඒමට ඔබට තවත් යම් සුවිශේෂ උත්තේජක පැවතියා ද?


පිළිතුර; ඔව්. ඒ සඳහා ප්‍රබල උත්තේජකය වුණේ මගේ දේශපාලන දෘෂ්ටිය. සාධාරණය, සමානාත්මතාව, සහජීවනය සහ මනුෂ්‍යත්වය අගයන, උස් පහත් භේද නැති උසස් මිනිස් සමාජයක සිහිනය සැබෑ කර ගන්නට උත්සාහ දැරූ ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණකාලීන ක්‍රියාකරුවකු ලෙස සමාජවාදය හැදෑරීමෙන් ලද චින්තනමය පන්නරය ඊට බලපෑවා. 1987, 88, 89 කාලයේ රටේ ඝාතනය වූ, අතුරුදන් වූ 60,000ක් පමණ සහෝදර සහෝදරියන් අතර මා සමග ම සිටි නිෂ්මි සහෝදරයා ප්‍රමුඛ සහෝදර සහෝදරියන් 60-70ක් පමණ මරා දැමුණා. ඒ අවස්ථාවේ ඔවුන් සිය ජීවිත පරිත්‍යාග කර මා පාවා දුන්නේ නැහැ. ඒ, සමාජය යහපත් කිරීම වෙනුවෙන් මගෙන් ඉටු විය යුත්තක් ඉතිරි ව තිබෙන නිසා කියා මා විශ්වාස කරනවා. මා ඒ ජීවිතවලට සාධාරණය ඉටු කළ යුතුයි. ඔවුන්ගේ ජීවිත පරිත්‍යාගය අත්දුටු මට පරිත්‍යාග කරන්න බැරි තරම් වටිනා ඊට වැඩි යමක් සිතා ගන්නට බැහැ. ඒ නිසා 'පොත්වලින් ආර්ථික ලාභ ඉපයීම' යන්න 'පොත් ලියා සමාජගත කිරීම' යන්නට වඩා දෙවැනියි.

ප්‍රශ්නය; ඒ අදහස් සාහිත්‍යවේදියකු සහ ප්‍රකාශකයකු ලෙස ඔබේ පැවැත්මට සහ දියුණුවට තර්ජනයක් නොවෙයි ද?

පිළිතුර; මගේ අපේක්ෂාව 'අවංකවත් සුපිරිසිදුවත් මනුෂ්‍යත්වය මූලිකවත් පවතින සාධාරණය සහ සමානාත්මය සපිරි සමාජයක්.' මගේ සියලු අදහස්වල පොදු සාධකය වන්නේ "මනුෂ්‍යත්වයෙන් තෘප්තිමත් මිනිසා" යන්න. ඒ අර්ථයෙනුත් මා විජයග්‍රාහී, දියුණු සහ පැවැත්ම තහවුරු කරගත් පුද්ගලයෙක්. ඒ, පුද්ගලික ව. මීට වඩා යහපත් පොදු අරමුණු සහිත තැනක 'මනුෂ්‍යත්වය' විකසිත වන දවසක මේ අර්ථය තවදුරටත් තහවුරු වේවි. මා මේ තරම් කාලයක් ක්ෂේත්‍රයේ රැඳී සිටියේත් පොත් 100කට අසන්න සංඛ්‍යාවක් ලිව්වේ සහ ප්‍රකාශනය කළේත් බලාපොරොත්තු විරහිත ව සම්මාන, පදක්කම්, ඇගයීම්, ප්‍රණාම සුළු වශයෙන් හෝ ලැබුවේත් මේ අදහස්වල පිහිටා ක්‍රියා කරමිනුයි. මියෙන තුරු ම ඉදිරියටත් මේ මාර්ගයේ ගමන් කිරීමයි මගේ අරමුණ.

ප්‍රශ්නය; ඔබ රුසියානු මහා ලේඛක ලියෝ තෝල්ස්තෝයිගේ ගමට යන්නට වාසනාව ලද සාහිත්‍යකරුවෙක් ?

පිළිතුර; ඔව්. ඔහුගේ ගමේ වතුයාය 'යස්නායා පොල්යානා'. 'තුලා' නගරයේ සිට කිලෝමීටර් 20ක් පමණ දුරිනුයි එය පිහිටා තිබෙන්නේ. එහි ජීවත් වූ ඔහු විශාල වතුපිටි දේපළ හිමිකාරිත්වයක් තිබුණු සිටුවරයෙක්. ඒ බිම් පෙදෙසේ ඇවිදීමටත්




**අතුරුදන් වූ 60,000ක් පමණ සහෝදර සහෝදරියන් අතර මා සමග ම සිටි නිෂ්මි සහෝදරයා ප්‍රමුඛ සහෝදර සහෝදරියන් 60-70ක් පමණ මරා දැමුණා. ඒ අවස්ථාවේ ඔවුන් සිය ජීවිත පරිත්‍යාග කර මා පාවා දුන්නේ නැහැ. ඒ, සමාජය යහපත් කිරීම වෙනුවෙන් මගෙන් ඉටු විය යුත්තක් ඉතිරි ව තිබෙන නිසා කියා මා විශ්වාස කරනවා. මා ඒ ජීවිතවලට සාධාරණය ඉටු කළ යුතුයි. ඔවුන්ගේ ජීවිත පරිත්‍යාගය අත්දුටු මට පරිත්‍යාග කරන්න බැරි තරම් වටිනා ඊට වැඩි යමක් සිතා ගන්නට බැහැ.**

ඔහු ජීවත් වූ මන්දිරය නැරඹීමටත් ඔහු මිහිදන් කළ තැනට ගොස් ගෞරව දැක්වීමටත් මට අවස්ථාව ලැබුණා. එය පහසුවෙන් විදේශීය සාහිත්‍යකරුවකුට හිමිවන අවස්ථාවක් නොවෙයි. රුසියානු සාහිත්‍ය කවයේ රංජන, චූලානන්ද ඇතුළු සහෝදරත්වයේ සහ බලධාරින්ගේත් දිමිත්‍රි ලිහනොව් මහත්මයාගේත් දායකත්වයෙන් සහ අනුග්‍රහයෙනුයි මට ඒ අවස්ථාව ලැබුණේ.

**ප්‍රශ්නය; ඔබ පරිවර්තනය සඳහා කෘතියක් තෝරා ගන්නේ කෙසේ ද?**

**පිළිතුර;** 'කිසිවකු සිටින තැනින් මඳක් හෝ ඉහළට ඔසවා තබන, මනුෂ්‍යත්වය වෙනුවෙන් යම් ක්‍රියාශීලී සටන්කරුවකු බවට පත් කරවන කෘතියක් විය යුතුයි' යන නිර්ණායකයට යටත් ව ඕනෑ ම ශානරයක පොතක් පරිවර්තනය කරන්නට මා පැකිළෙන්නේ නැහැ. නමුත් කෘතිය අන්තර්ගතයේ තිබෙන මනුෂ්‍යත්වය මුල් ලේඛකයාට තිබීමත් පරිවර්තකයා වශයෙන් මා තුළ පවතින මනුෂ්‍යත්වයේ පරිමාව ඉක්මවා යන ගුණයක් හෝ ඊට සමාන මනුෂ්‍යත්වයක් කෘතිය සහ මුල් ලේඛකයා සතු ව තිබීමත් අමතර වටිනාකම්. භාෂාව උපයෝගි කරගෙන පුද්ගලයාත් සමාජයත් පවත්නා තැනට වඩා උස් තැනකට රැගෙන යන සාහිත්‍යයේ කාර්යභාරය ඉටු කරවන එවැනි කෘතිවලට මා කැමතියි.

**ප්‍රශ්නය; ඔබ පොත් ප්‍රකාශකයෙක්?**

**පිළිතුර;** ඔව්. මගේ පළමු පොතත් කර්තෘ ප්‍රකාශනයක්. මගේ මිත්‍ර ජපානයේ ජීවත් වන සමන් ප්‍රියංකරගේ මූලධන දායකත්වය ඇති ව 'සයුරි ප්‍රකාශන ආයතනය' පවත්වාගෙන යනවා.

**ප්‍රශ්නය; ලේඛකයන්ට සහ සාහිත්‍යකරුවන්ට කිව යුතු යමක් තිබෙනවා ද?**

**පිළිතුර;** ලේඛකයකු වීමට පමණක් සිතා ලේඛනයට පිවිසෙන්න එපා. තමා තුළ යම් දෙයක් නැති ව පාඨකයාට දෙන්න දෙයක් නැති බව දැනගෙන ලේඛනයට පිවිසෙන්න. වැටුපක් හෝ ලාබයක් හෝ වරප්‍රසාදයක් හෝ අපේක්ෂාවෙන් ලේඛනය තෝරා නොගන්න. අප විසින් අත්පත් කරගත් දැනුම් සම්භාරයක්, වර්ධනය කරගත් ආකල්ප සමුදායක්, උකහාගත් පරිචයක් සහ අත්දැකීම් එකතුවක්, සුපිරිසිදු හදවතක්, ගොඩනගාගත් අවංක මානුෂික හැඟීමක් නැති ව කුමක් ලිව්වත් වැඩක් නැහැ. කෙතරම් සම්මාන ලැබුණත් ජනාදරයට පත්වුණත් ධනවතකු වුණත් වැඩක් නැහැ. එතැන හොඳ සාහිත්‍යකරුවකු නැහැ.

**ප්‍රශ්නය; රටේ සාහිත්‍යය ඉදිරියේදී ගමන් කළ යුතු දිශානතිය පිළිබඳ ඔබට යම් අදහසක් තිබෙනවා ද?**

**පිළිතුර;** ක්ෂේත්‍ර ගණනාවක් එකතු ව යන ගමනක අවශ්‍යතාවක් පවතිනවා. සංස්කෘතික, අධ්‍යාපන, ජනමාධ්‍ය, ඩිජිටල් තාක්ෂණය වැනි අංශ භාර රාජ්‍ය ආයතන සාමූහික ව සාහිත්‍යයේ ඉදිරි ගමන සැලසුම් කළ යුතුයි. රුසියාවේ සාහිත්‍ය විෂය ක්‍රියාත්මක කරවන්නට වර්තමානයේ ඩිජිටල් අමාත්‍යාංශය මූලික වගකීම දරනවා. ඒ නිසා ඩිජිටල්කරණයත් සමග සමගාමී ව සාහිත්‍යයත් ගැළපිය යුතුයි. අප ලේඛකයන් සහ ප්‍රකාශකයන් වශයෙන් ඊට කොතරම් එකඟ ද? නැද්ද? යන්න එහිදී අදාළ කර නොගත යුතුයි. තනි තනි පුද්ගලයන් ලෙස අපට යම් යම් සුබවාදී ජයග්‍රහණ ලැබුණත් එසේ ගමන් කළ හැකි දුර සීමා සහිතයි. එකතු විය යුත්තේ ඒ නිසයි. සාහිත්‍යවේදීන් වැනි පුරෝගාමී මිනිසුන්ට එකතු විය හැකි තැනක්, පෙර අපර දෙදිග භාෂා ඥානය හුවමාරු වන කේන්ද්‍රස්ථානයක් තිබිය යුතුයි. සාහිත්‍ය ක්ෂේත්‍රයේ පමණක් නොව රටේ සෑම ක්ෂේත්‍රයක ම ඉදිරි ප්‍රගමනීය දිශානතිය තීරණය වන්නේ ඒ ආකාරයට අන්තර් සම්බන්ධතා ගොඩනැංවීමෙන්. ඒ සඳහා යම් තරමක දේශපාලනමය එළඹුමක් දක්නට ලැබෙනවා. එහි සාර්ථක අසාර්ථකභාවය මැනීමට තව ම කාලය ප්‍රමාණවත් නැහැ. එහෙත් ඉක්මනින් සාර්ථකත්වය අපේක්ෂා කරනවා.


ලියෝ තෝල්ස්තෝයි මිහිදන් කළ ස්ථානය

# මාධ්‍යකරුවා සිනෙ ඇසින්

**තුසිත ජයසුන්දර**

මේ චිලී දේශයේ කුප්‍රකට හමුදා කුමන්ත්‍රණය ජය ගත් 1973 වසරයි. පොදුජන මනාපයෙන් 1970 වසරේදී බලයට පත්වූ සැල්වදෝර් ඇලන්ඩේගේ නායකත්වයෙන් යුතු සමාජවාදී ලකුණු සහිත ප්‍රජාතන්ත්‍රවාදයට නැඹුරු පාලනය නොඉවසූ දෙස් විදෙස් බලවේග නව නායක ඔගස්ටෝ පිනෝචෙට් වෙත සිය සහය හා අනුග්‍රහය දක්වන්නට වූයේ රට පුරා පැතිරෙන්නට වූ ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ. ඇලන්ඩේ වෙත හා ඔහුගේ දැක්ම වෙත සහය පළ කරන චිලී පුරවැසියන් වැඩි දෙනකුට සිදුවූයේ සියල්ල අහිමි කර ගන්නට. දෙස් විදෙස් මාධ්‍යවේදීන් ද මෙතැන සිටියා.

ලෝ ප්‍රකට සිනමාකරු කොස්තා ගව්රාස් සිය අට වැනි වෘත්තාන්ත සිනමාපටය වන 'මිසිං' සඳහා මෙසමය පාදකකොට ගන්නේ ලොව පුරා මාධ්‍යවේදින් මුහුණදෙමින් සිටින අනතුරු පිළිබඳ කතිකාව පොහොසත් කරලීමේ අරමුණ ද සහිත ව. චිලී දේශයේ වෙසෙමින් සිය වගකීම අකුරට ම ඉටු කරමින් සිටි තරුණ ඇමරිකානු මාධ්‍යවේදියකු වූ චාලි හොර්මන් මෙසමයේදී අතුරුදන් වන්නේ චිලීහි නව පාලනයට සහය දක්වමින් සිටි ඇමරිකානු බලධාරින් ද අපහසුතාවට පත් කරමින්. නව පාලනය විසින් මුදා හරින ලද ඝාතක කණ්ඩායමකට හසුව ඔහු ව මරා දැමෙන බවයි සිනමාපටය පවසන්නේ.

චාලිගේ සැබෑ ඉරණම දැක ගැනීම පිණිස පියා එඩ් හොර්මන් චිලී දේශය බලා පැමිණෙන්නේ සිනමාකරු ගව්රාස්ගේ පිවිසුම වඩා නිරවුල් කරලන සාධක සහිත ව. ඔහු හා චාලිගේ බිරිඳ-බෙත් අත්දකින ප්‍රචණ්ඩත්වය ඔස්සේ චිලී නව පාලනයට අකමැති අයවලුන්ගේ දිවි සුරැකුම පිළිබඳ බලාපොරොත්තු බිඳ වැටීම ඇරඹෙනවා. චාලි, සිනමාපටයේ ප්‍රමුඛ චරිතය වනුයේ අදිසි මිනිසකු ලෙසින්. ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය සැමරෙන හැම විටෙකදී ම මෙවැනි සිනමා චරිත අමතක කරන්නට බැහැ. චාලි යනු ජනමාධ්‍යවේදින්ගේ වගකීම් සහගත අසීරු වෘත්තිය වෙත ඉහළ වටිනාකමක් සිනමාව වෙතින් ලබා දෙන්නකු ය යන්න පැහැදිලි වන කරුණක්.

'මිසිං' මුල්වරට ප්‍රදර්ශිත සමයේදී ම සිරිලක සිනමාශාලා කරා ද පැමිණියා. එනමුදු 'මිසිං' රසික ප්‍රතිචාර ඉහළින් ම ලබන්නට සමත් වූයේ නැහැ. ඊට එක් හේතුවක් විය හැක්කේ ඒ වන විට සිරිලක කලාපයේ මාධ්‍යවේදින් එබඳු අත්දැකීම් ලබන පසුබිමක් දක්නට නොලැබුණු නිසා. කීර්තිමත් මුල් පෙළේ මාධ්‍යවේදින් ඇතුළු මාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ පිරිස් ඝාතනයට, වධ හිංසා පැමිණවීමට හා බිය ගැන්වීමට ලක් වන්නේ 1980 දශකයේ අගභාගයට පැමිණීමත් සමග. එහි පුරෝගාමී අවස්ථාවක් වනුයේ රිචඩ් ද සොයිසාගේ ඝාතනය. අශෝක හඳගම සිය නවතම සිනමාපටය වන 'රාණි' ඔස්සේ රිචඩ් පිළිබඳ පශ්චාත් කියැවීමකට ලබා දෙන ඉඩ හසර අතිශයින් ම වැදගත්.

රිචඩ් තරුණ ඡායාරූප මාධ්‍යවේදියකුගේ චරිතය නිරූපණය කළ 'සත්‍යග්‍රහණය' සිනමාපටය ද මෙතැනදී සිහිපත් වනවා. ඩී.බී. වර්ණසිරි නිමවූ 'සත්‍යග්‍රහණය'ට පාදකකොට ගැනුණේ පුවත්පත් බලය මැඩ පැවැත්වීම සඳහා දේශපාලන අධිකාරිය 1970 දශකයේදී ගත් අත්තනෝමතික පියවර සමුච්චය.

මේ හැරුණු විට නොයෙකුත් උපද්‍රව ආදියට ලක්වන මාධ්‍යවේදින් පළමු වැනි පෙළ හා දෙවැනි පෙළ චරිත සේ සනිටුහන් කළ සිනමාපට ගණනාවක් ම සිරිලක සිනමා ඉතිහාසය පිරික්සීමේදී හමුවනවා. එනමුදු සිනමා අනු ශානරයක් බවට මේ සිනමාපට පත් නොවූ බව සඳහන් කළ යුත්තක්.



ලෝක ජනමාධ්‍ය නිදහස් දිනයේදී මතයක නැඟෙන කොලොම්බියානු මාධ්‍යවේදී Guillermo Cano Isaza ඉසාසා එක් අතෙකින් ගව්රාස්ගේ 'මිසිං'හි එන මාධ්‍යවේදී චාලිගේ ම පිළිබිඹුවක්. 1986 වසරේ දෙසැම්බර් මස 16 දින තමා සේවය කළ බොගෝටාහි එල් එස්පෙක්ටඩර් පුවත්පත් කාර්යාලයෙන් නික්ම යන අතරතුර cano ඝාතනයට ලක් වන්නේ මාධ්‍ය ලොව ම තැති ගන්වමින්. කානෝ දිගින් දිගට ම කොලොම්බියාවේ මත්ද්‍රව්‍ය ජාවාරම් පිළිබඳ ගැඹුරු හා සහේතුක හෙළිදරව් කිරීම් සිදු කරමින් මාධ්‍යවේදියකුගේ සමාජ වගකීමට ප්‍රශස්ත වටිනාකමක් ලබා දුන් බව සැබෑවක්. මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාලයක් canoගේ ඝාතනයේ වගකිවයුත්තා ලෙසිනුයි සැලකෙන්නේ.

Guillermo Cano Isaza හා ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය කෙරෙහි සිරිලක කලාපය සැලකිය යුතු අවධානයක් යොමු කරලීමේ වර්ධනීය අවස්ථාවක් සලකුණු කරන්නේ ගවේෂණාත්මක මාධ්‍යකරණයට නව වටිනාකමක් සපයා දෙමින් සිටියදී ඝාතනයට ලක්වන ලසන්ත වික්‍රමතුංග නිසා. වසර 2017දී යුනෙස්කෝව විසින් Guillermo Cano Isaza ලෝක මාධ්‍ය නිදහස් ත්‍යාගය පිරිනමන්නේ ලසන්ත වික්‍රමතුංග වෙත. සැබැවින් ම මේ ත්‍යාගය ඔහුට පමණක් ම අයත් නොවන බව සඳහන් කරලීම වැදගත්. සමකාලීන ව ඝාතනයට, අතුරුදන් කිරීමට හා වධහිංසා පැමිණවීමට ලක්වූ සෙසු මාධ්‍යවේදීන් ද මෙහි උරුමකරුවන් වනවා.

සිනමාව පොහොසත් කරලීම සඳහා සමාජ, දේශපාලන කියැවීම් භාවිතයට ගැනෙන්නේ කලක පටන්. මෙහිලා මාධ්‍යවේදීන්ගේ අත්දැකීම් අතිශය වැදගත් තෝරා ගැනීමක්. සිරිලක සිනමාකරුවන් හෝ සිනමා නිපැයුම්කරුවන් නා නා විධ අත්දැකීම් ලබන මාධ්‍යවේදීන්ගේ චරිත පෙරටු කර ගත් සිනමාපට නිර්මාණය සඳහා දක්වන්නේ තරමක අඩු උනන්දුවක්.

ලෝක සිනමාව මාධ්‍යවේදීන්ගේ බිහිසුණු අත්දැකීම් නිරූපණය කෙරෙහි අවධානය යොමු කළ අවස්ථා නොඇගැයූ සිනමා සම්මාන උළෙලක් නොමැති තරම්. විචාරක හා විද්වත් රසික පාර්ශ්ව මෙතැනදී සිදු කළ මැදහත්වීම් අවතක්සේරු කරන්නට බැහැ. වැදගත් වන්නේ කාලානුරූප ව හා අවස්ථාවෝචිත ව මේ ප්‍රවණතාව සවිබල ගැන්වීම. තවදුරටත් මාධ්‍ය මර්දනය යන්න ලෝක පරිමාණ යථාර්ථයක්. මෙය ද මේ සිනමා මාදිලියේ පැවැත්ම සුරකින සාධකයක් වනවා.

1970 දශකයේ කාම්බෝජ දේශපාලන ප්‍රචණ්ඩත්වය වාර්තා කරන්නට පැමිණි ඇමරිකානු හා කාම්බෝජ මාධ්‍යවේදීන් දෙදෙනකුගේ සැබෑ අත්දැකීම් අළලා බ්‍රිතාන්‍ය සිනමාකරු රෝලන්ඩ් ජොෆෙ විසින් නිර්මාණය කරන ලද 'ද කිලිං ෆීල්ඩ්ස්', විදෙස් සිනමාපට ප්‍රිය කරන සිරිලක සිනමා රසිකයන්ගේ වැඩි ප්‍රතිචාර ලද බව ද මෙහිලා සඳහන් කළ යුත්තක්. සිරිලක සිනමාශාලා ප්‍රදර්ශනයට 'ද කිලිං ෆීල්ඩ්ස්' එක් කළේ උතුරුකරයේ යුද වාතාවරණය උත්සන්න වෙමින් පැවති පසුබිමක. දෙස් විදෙස් මාධ්‍යවේදීන් එය වාර්තා කරන්නට උත්සුක වන පසුබිමක. සිනමාපටය ලද රසික ප්‍රතිචාර කෙරෙහි මෙය බලපාන්නට ඇතැයි හැඟී යනවා.


ලොව මෙතෙක් නිර්මිත විශිෂ්ටතම සිනමාපටයක් සේ සැලකෙන ඕර්සන් වෙල්ස්ගේ 'සිටිසන් කේන්', ස්ටීවන් ස්පීල්බර්ග්ගේ 'ද පෝස්ට්' ඇතුළු සිනමාපට ගණනාවක් ද මේ සිනමාපට මාදිලිය පොහොසත් කරලන බවයි විචාරක අදහස වන්නේ. මේ හැම සිනමාපටයක් ම සිනමාශාලාවකදී හෝ විකල්ප මං ඔස්සේ නැරඹීම රසික ප්‍රජාවට පහසු නැහැ. කෙසේ වෙතත් විචක්ෂණශීලී දැක්මකින් යුතු ව ලොව පුරා පැතිරුණු සිනමා කලාප ඇසුරු කරන රසිකයකුට අන් මාදිලි යටතට ගැනෙන සිනමාපට සේ ම මේ මාදිලියේ සිනමාපට ද මූලික වශයෙන් හෝ දැක ගත හැකි වනවා.

සිනමාව මතු නොව සියලු නිර්මාණ කාර්ය සඳහා සැබෑ ලොව හා සැබෑ දිවිය කවර ආකාරයකින් හෝ විෂය වන බව නොරහසක්. මෙය සැබෑ ලොව හා සැබෑ දිවිය විෂයානුබද්ධ ව හා විෂයාසක්ත ව ප්‍රතිනිර්මාණයක් ද වනවා. මාධ්‍යවේදීන්ගේ අත්දැකීම් ද සිනමාව විෂයෙහි ගොනු වන්නේ මෙසේමයි. කෙසේ වෙතත් අතිශයෝක්තියෙන් හා ආධානග්‍රාහී ව කරුණු දක්වන අවස්ථා මෙහිලා හඳුනා ගැනීම අපහසු නැහැ.

ලොව මාධ්‍යවේදීන් මුහුණදෙන බිහිසුණු අනතුරු පසුපස ඇති දේශපාලනය විවාදාත්මක කියැවීමකට අනගි නිමිත්තක්. මෙය සෘජු ව ම බලපාන්නේ විද්වත් රසික පාර්ශ්වය වෙත. ඊට තුඩුදෙන නිශ්චිත හේතුවක් වන්නේ මෙබඳු සිනමාපට සරල රසාලිප්ත ලකුණු රහිත ව හෝ ඒවා අවම කරමින් නිර්මාණය කිරීම. සැබැවින් ම දේශපාලනික ෂානර යටතට ගැනෙන බොහෝ සිනමාපට පළ කරන්නේ ම මේ පිළිවෙතය යන්නයි නිරතුරු ව ම කියැවෙන්නේ.

සිනමාව පොහොසත් කරලීම සඳහා සමාජ, දේශපාලන කියැවීම් භාවිතයට ගැනෙන්නේ කලක පටන්. මෙහිලා මාධ්‍යවේදීන්ගේ අත්දැකීම් අතිශය වැදගත් තෝරා ගැනීමක්. සිරිලක සිනමාකරුවන් හෝ සිනමා නිපැයුම්කරුවන් නා නා විධ අත්දැකීම් ලබන මාධ්‍යවේදීන්ගේ චරිත පෙරටු කර ගත් සිනමාපට නිර්මාණය සඳහා දක්වන්නේ තරමක අඩු උනන්දුවක්.

මාධ්‍යවේදීන්ගේ දිවි සුරැකුම, අනන්‍යතාව හා වෘත්තීය ගරුත්වය වෙනුවෙන් සිනමාව යම් පමණකින් හෝ පෙනී සිටිය ද ඉන් විපුල ඵල ඒ ඒ පාර්ශ්ව විසින් නෙළා ගනු ලබන්නේ ද යන්න ප්‍රශ්නයක්. සිනමාව සත්තකින් ම ලොව වඩාත් ම බලපෑම් සහගත මාධ්‍යය වන බවයි නිතර සඳහන් කෙරෙන්නේ. කෙසේ වෙතත් මේ වෙසෙසින් දත හැකි ක්ෂේත්‍ර සමුච්චයකට අදාළ ව පමණයි. මාධ්‍යකරණයේ සක්‍රිය පෙදෙස් නිරූපිත වෘත්තාන්ත සිනමාපට නව වටයකින් ප්‍රතිවිමසුමකට ලක් කිරීමේ අවශ්‍යතාවයි මෙයින් කියැවෙන්නේ.



# සමාජ සංවේදී පත්තරකාරයා

## සුනිල් මාධව ප්‍රේමතිලක

**කපිල එම්. ගමගේ**

පුද්ගල චරිතවල පෞරුෂය ගොඩ නැගෙන්නේ කාලයට සාපේක්ෂ ව. ඒ ඒ යුග විසින් එන්නත් කරනු ලබන අත්දැකීම් එම පෞරුෂයේ නිරෝගී බවට හේතු වනවා සේ ම ඔහු හෝ ඇය හෝ අතින් පෙරළා සමාජ දේහයට ද එක් කරන්නේ නිරෝගී දේ පමණක් ම. මෙය අතිශය දේශපාලනික, ආර්ථික, අධ්‍යාපනික හා සමාජ විද්‍යාත්මක කාරණයක්. වහල් යුගයට සාපේක්ෂ ව 'ස්පාටකස්' බිහි වන්නේත් ඔහු වීරයකු ලෙස වරනැගෙන්නේත් ඒ අර්ථයෙන්. එහෙත් ඔහු වහල් බැම්මෙන් නිදහස් කරගන්නා වහලුන් ඊළඟ සමාජ අවධියේදී ඉඩමට බැඳ තබන ප්‍රවේණිදාසයන් වන්නේ ඔහු යුගයට සාපේක්ෂ වීරයකු පමණක් වන නිසා.

1988/89 වීරයන් ඝාතනයට ලක්වූ යුගයක් ලෙස ඉතිහාසයට එක්වන්නේ දැවැන්ත ලේ පැල්ලම් ශ්‍රී ලාංකික පොත්පිටු අතරට එකතු කරමින්. දකුණේ තරුණයන් පසුපස නාඳුනන තුවක්කුකරුවන් හඹායන්නේ හුදෙක් තරුණකම ම මරණය සඳහා කොන්දේසියක් ලෙස ගනිමින්. තැන තැන ඇවිළෙන තරුණ සිරුරු මතින් නැගි පුළුටු දුමාරය මැකී යමින් පැවැති මොහොතක සුනිල් මාධව ප්‍රේමතිලක නම් පත්තරකාරයා මතුවන්නේ ඒ අසීමිත ව සිදුවුණු තරුණ ඝාතන ප්‍රශ්න කරමින් එයට එරෙහි වන්නෙක් ලෙසින්. ඔහු සිය විරෝධය පෑම සඳහා භාවිත කළේ තුවක්කු පතරොම් නොව ඩිමයි කොළ සහ අකුරු. ඔහුගේ ලියවිලි සපුරා ඝාතනයට විරුද්ධ වන විට අනෙක් පසින් එය තරුණ දේශපාලනයට පක්ෂ වුණා. මේ නිසා ම ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය හා එක් ව සිට එහෙත් දැඩි මර්දනයට හසුනොවූ පිරිස් රහසිගත ව සුනිල් මාධව නම් වූ පත්තරකරුවා වටා එක් රොක්වන්නට පටන්ගත්තා. දිනපතා දිවයින පුවත්පතේ '08 වැනි පිටුව' වෙනත් නිර්මාණ පිටුවලට වඩා සාකල්‍යයෙන් ම වෙනස්, තරුණ නිර්මාණකරුවන් සඳහා ඇරුණු ඉඩ අවකාශයක් ලෙසට ඔහු නිර්මාණය කළා. මෙහි ලියූ බොහෝ දෙනෙක් ජවිපෙ දේශපාලනය හා සෘජු ව ම බැඳුණු හෝ එයට ආශිර්වාද කළ වූවන්. '08 වැනි පිටුවෙන්' සමාජය වෙත සිදු වූ සන්නිවේදනයට අනුව බාහිර සමාජයේ බොහෝ පාඨකයන් සිතුවේ සුනිල් මාධව ප්‍රේමතිලක හොඳ ජේවීපීකාරයකු ලෙසින්. එහෙත් ඔහු කිසිලෙසකින් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු හෝ ක්‍රියාකාරිකයකු හෝ වුණේ නැහැ. '08 වැනි පිටුවෙන්' එකල ආවේගශීලී ලියන්නන් ලද ආස්වාදය ප්‍රවීන නිර්මාණ ශිල්පියකු වන හෙන්රි වර්ණකුලසූරිය සිය 'නොකී කතා' තීරුලිපි සංග්‍රහයේ පවසන්නේ මෙලෙසින්. "මේ කවර පුවත්පතක නිර්මාණ පළ වුවත් සුනිල් මාධව ප්‍රේමතිලක සංස්කරණය කළ දිනපතා දිවයිනේ 08 වැනි පිටුවේ නම පළ වී තිබෙනු දකින්නට ලැබීම තරම් තවත් ජයග්‍රහණයක් අප එකල භුක්ති වින්දේ නැහැ. ජවාධික පෑන් තුඩගින් ගලා එන වෙඩි උණ්ඩ වගේ අකුරු පේළිවලට 08 වැනි පිටුව ඉඩ සලසා දුන්නා. මේ නිර්මාණවල කිසියම් ආවේගශීලීත්වයක් තැවරී තිබුණා. හරියට සුනිල් මාධවගේ මාධ්‍ය භාවිතය වගේ." (නොකී කතා - පිටුව 43)

සුනිල් මාධව යනු ඖපපාතික පත්තරකරුවකු නොව ලිවීම උපතින් රැගෙන ආ පත්තරකරුවෙක්. මීමන ප්‍රේමතිලක නම්වූ කවියාගේ හා පත්තරකරුවාගේ පුතකු ලෙස සමාජ

> මේ කවර පුවත්පතක නිර්මාණ පළ වුවත් සුනිල් මාධව ප්‍රේමතිලක සංස්කරණය කළ දිනපතා දිවයිනේ 08 වැනි පිටුවේ නම පළ වී තිබෙනු දකින්නට ලැබීම තරම් තවත් ජයග්‍රහණයක් අප එකල භුක්ති වින්දේ නැහැ. ජවාධික පෑන් තුඩගින් ගලා එන වෙඩි උණ්ඩ වගේ අකුරු පේළිවලට 08 වැනි පිටුව ඉඩ සලසා දුන්නා. මේ නිර්මාණවල කිසියම් ආවේග ශීලීත්වයක් තැවරී තිබුණා. හරියට සුනිල් මාධවගේ මාධ්‍ය භාවිතය වගේ.

පිළිගැනීම ද ඒ හා සමපාත වුණා. එහෙත් ඔහු එය සිවිල් බලයක් ලෙස භාවිත කළ බවක් දක්නට ලැබුණේ නැහැ. සමාජය විසින් ඔහු වෙන්කොට හඳුනා ගැනීමට එය භාවිත කරනු ලැබුවා. මේ නිසා ඔහුට සමාජයේ 'ආරෝපිත සිවිල් බලයක්' නොතිබුණායැයි සම්පූර්ණයෙන් බැහැර කළ නොහැකියි. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඔහුට තිබූ ප්‍රාමාණික දැනුම නිසා ඔහු පුවත්පත් ලෝකයේ තීරණාත්මක විදෙස් පුවත්පත් ලේඛකයන් පිළිබඳ ව හොඳින් කියවා තිබුණා. ඔහුගේ ආවේගකාරී පුවත්පත් ලේඛනයට අවශ්‍ය ඉන්ධන සැපයුණේ ජූලියස් ෆූචික්, ඩොනල්ඩ් වුඩ්ස් වැනි පත්‍රකලාකරුවන්ගේ ජීවන වෘත්තාන්තයෙන් බව ඔහු බොහෝ තැන්වලදී පවසන්නේ එබැවින්.

මාධ්‍යකරුවකු සැමවිට ම සමාජය දෙසට හැරුණු පුද්ගලයකු ලෙස සිටිය යුතුයි. ඒ, අනෙකක් නිසා නොව ඔහු හෝ ඇය හෝ වග කියන්නේ තමන් නියෝජනය කරන ජන සමාජයට. කිසියම් මොහොතක ජනමාධ්‍යකරුවකු ඊට ප්‍රතිපක්ෂ ව පාලකයන්ට පක්ෂපාතිත්වයක් පෙන්වන්නේ නම් හෝ එයින් පෞද්ගලික සුභ සාධනය සිදුකර ගන්නේ නම් ඔහු හෝ ඇය සැබෑ යන ජනමාධ්‍යකරුවකු වන්නේ නැහැ. ඒ ගැන සුනිල් මාධව දැරූ අදහස වන්නේ "පුවත්පත් කලාවේදියා යනු පුවත්පතකට ම සිරවූ, සෑම මොහොතක ම පුවත්පත ගැන සිතමින් සිටින පුද්ගලයකු නොවේ. ඔහු ලෝකයට ම ප්‍රේම කරන්නකු විය යුතු ය. මනුෂ්‍යත්වය හා පරිසරයට ආදරය කරන මිනිසකු විය යුතු ය. ඔහුට ඍජු කොන්දක් තිබිය යුතු ය. එඩිතර මිනිසකු විය යුතු ය. ඔහු සුන්දර මිනිසෙකි. මේ ගුණාංගය නැතිනම් ඔහු පුවත්පත් කලාවේදියකු යැයි මම නොසිතමි." (නොනිමි ජීවිත කතාව - පිටුව 01)

සුනිල් මාධව අනෙක් පුවත්පත් කලාවේදීන්ට වඩා වෙනස් වූයේ ඔහුට තිබූ අයුක්තිය නොඉවසන ගති ලක්ෂණ නිසා. එබැවින් ඔහුට රැකියාව අහිමිවීම් ගණනාවක් ද සිදුවුණා. ඔහු නිතර ම සිටගත්තේ ද පීඩිතයාගේ පාර්ශ්වයේ. මුල් යුගයේදී ඔහු සියලු සමාජ භේදවලට විරුද්ධ වුව ද අවසාන කාලයේදී ජනවාර්ගික ගැටලුව ගැන දැරූ මතය විවාදයට තුඩුදෙන දෙන්නක්. වාමාංශිකයකු ලෙස සිටිමින් ම සිංහල ජාතිවාදයට හා යුද ජයග්‍රහණයට අනුග්‍රහය දැක්වීම විවාදපන්නයි. එයින් විද්‍යමාන වන්නේ ඔහු සමාජ සංවේදී පුද්ගලයකු වුව ද නිවැරදි දේශපාලන දෘෂ්ටිවාදයක පිහිටා නොසිටි බව. සමාජය ද ඔහු උත්කර්ෂයට නැංවූයේ ඔහුට තිබූ සමාජ සංවේදී බව නිසා.

සුනිල් මාධව නම් මිනිසා ස්වකීය ජීවිතකාලයෙන් වැඩි කාලයක් යෙදවූයේ පීඩිතයා වෙනුවෙන් හඬ නගන්නට ය. පීඩිතයන්ට විමුක්තිය අත්පත් කරදෙන දේශපාලන ව්‍යාපාරයක් පැන නැගිය යුතු බවත් එය සමස්ත ජනයාගේ ජයග්‍රාහී අවසානයක් කරා එනම් විප්ලවයක් කරා යායුතු බවත් සුනිල් අයියා අවංක ව විශ්වාස කළේ ය. ඒ වෙනුවෙන් ලියුවේ ය. කතා පැවැත්වී ය.




එය ම ඔහුගේ චංචල දේශපාලන දෘෂ්ටිවාදයට හේතු වුණා. ඔහු කාලයට සාපේක්ෂ ව යම් සමාජ දේශපාලන කාර්යභාරයක් සිය වෘත්තියෙන් ඉටු කිරීමට උත්සාහ කළ බව අමතක කරන්නට බැහැ. ඔහු ඉතා හොඳ පරිවර්තකයෙක්. ඔහු කළ පරිවර්තනයක් ලංකා සමාජයේ දේශපාලන විඥානයට කළ බලපෑම අතිමහත්. 'හඬනු මැන නිදහස', 'ඇමරිකා ඇමරිකා', 'කැරොලිනාගේ දිනපොත' වැනි කෘති මෙන් ම ස්වතන්ත්‍ර තීරුලිපි සටහන් එකතුවක් වූ 'සත්‍යවාදියාගේ දිනපොත' අදත් පාඨක ගරුබුහුමනට ලක්වනවා.

සුනිල් මාධව වෙනුවෙන් පැවති උපහාර උත්සවයක් සම්බන්ධයෙන් පුවත්පත් කලාවේදී චන්දන සිරිමල්වත්ත සහෝදරයා ලියා තිබූ මේ සටහන ඔහු සිය ජීවිතයේ අවසාන භාගයේදී මුහුණපෑ අර්බුදයේ ස්වරූපය කියාපාන්නක්. "සුනිල් මාධව නම් මිනිසා ස්වකීය ජීවිතකාලයෙන් වැඩි කාලයක් යෙදවූයේ පීඩිතයා වෙනුවෙන් හඬ නගන්නට ය. පීඩිතයන්ට විමුක්තිය අත්පත් කරදෙන දේශපාලන ව්‍යාපාරයක් පැන නැගිය යුතු බවත් එය සමස්ත ජනයාගේ ජයග්‍රාහී අවසානයක් කරා එනම් විප්ලවයක් කරා යායුතු බවත් සුනිල් අයියා අවංක ව විශ්වාස කළේ ය. ඒ වෙනුවෙන් ලියුවේ ය. කතා පැවැත්වී ය. සාහිත්‍යකරණයේ යෙදුණේ ය. ඔහු තවදුරටත් එවැනි කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කළ නොහැකි ය. ඔහු ශාරීරිකවත් ආධ්‍යාත්මිකවත් දුර්වල වී හමාර ය. එය අප වටහාගත යුතු ව ඇත. එහෙත් සුනිල් මාධව ප්‍රේමතිලක අමරණීය කාර්යභාරයක ජීවමාන හිමිකරුවෙකි. ඔහුගේ භූමිකාව මින් ඉදිරියට ප්‍රාණවත් කර සජීවී කළ හැක්කේ එම කාර්යභාරය ඉදිරියට ගෙන යාමෙනි." (චන්දන සිරිමල්වත්ත)

කිනම් තත්ත්ව යටතේ වුව ද සුනිල් මාධව ප්‍රේමතිලක නම් පුවත්පත් කලාවේදියා කාලයට සාපේක්ෂ ව සිය පැන මෙහෙයවමින් ඉටුකළ කාර්යභාරය ලංකා ඉතිහාසයේ මාධ්‍ය කලාවේ වෙන ම පරිච්ඡේදයක් බෙදා වෙන් කරදෙන බව අවසාන වශයෙන් සටහන් කළ යුත්තක්.



# රාජ්‍ය සේවා තරග විභාග අත්වැල

# වැටුප් ගැන ටිකක් - 02

ඉදිරිපත් කිරීම
**නාලක දිසානායක**
ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු)
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හා
අධ්‍යක්ෂ (පාලන) වැ.බ
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**පසුගිය කලාපයෙන්.....**

රාජ්‍ය/පළාත් රාජ්‍ය මෙන් ම අර්ධ රාජ්‍ය නිලධරයන් සඳහා දශකයකට ආසන්න කාලයකට පසුව කළ මූලික වැටුපේ සංශෝධනය සමග 'වැටුප්' පිළිබඳ කතාබහක් තිබුණු නිසා ඒ සම්බන්ධ ප්‍රශ්නෝත්තර සංග්‍රහයක් පසුගිය කලාපයේ සිට ඇරඹුවා. මේ පළ වන්නේ එහි දෙවැනි කොටස.

09. උසස් වීමකදී වැටුප් පරිවර්තනය කිරීමේ විධිවිධාන කෙසේ ද?

- උසස්වීම ලබන අවස්ථාවේදී නිලධරයා අවසාන වශයෙන් ලබාගත් වැටුප නව පරිමාණයේ වැටුප් වර්ධක පියවර අතරේ ගැනේ නම්, ඔහු නව වැටුප් පරිමාණයේ ආසන්න ඉහළ පියවරේ තබනු ලබන අතර ඔහුට අතිරේක වැටුප් වර්ධකයක් ගෙවිය යුතු ය.

- උසස්වීම ලබන අවස්ථාවේදී නිලධරයකු අවසාන වශයෙන් ලබාගත් වැටුප නව වැටුප් පරිමාණයේ වැටුප් පියවරකට අනුරූප වේ නම් ඔහු ආසන්න ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබිය යුතු ය.

- උසස්වීම ලබන අවස්ථාවේදී නිලධාරියකු අවසාන වශයෙන් ලැබූ වැටුප නව පරිමාණයේ ආරම්භක වැටුපට එක් වැටුප් වර්ධකයකින් (උසස්වූ තනතුරේ වැටුප් වර්ධක අගය) හෝ ඊට වැඩි වර්ධක ගණනකින් අඩු වන්නේ නම් ඔහු වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපෙහි තබනු ඇත.

- උසස්වීම ලබන අවස්ථාවේදී නිලධාරියකු අවසාන වශයෙන් ලැබූ වැටුප නව පරිමාණයේ ආරම්භක වැටුපට වඩා අඩුවන්නේ එක් වැටුප් වර්ධකයක අගයට (උසස්වූ තනතුරේ වැටුප් වර්ධක අගය) අඩු ප්‍රමාණයකින් නම් ඔහු වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපෙහි තබා අතිරේක වැටුප් වර්ධකයක් ගෙවිය යුතු ය.

10. යම් නිලධරයකු වැටුප් වර්ධක දිනයේදී ම උසස්වීම ලබන්නේ නම් එහිදී පළමු ව සිදු කළ යුත්තේ කුමක් ද?

- වෙනත් ආකාරයක බාධාවක් නොමැති නම් පළමු ව පූර්ව තනතුරේ/ ශ්‍රේණියේ/ පන්තියේ වැටුප් වර්ධකය ලබා දී ඉන්පසුව උසස්වීමේ වැටුප පරිවර්තනය කළ යුතු ය.

11. උසස්වීමකදී ඉදිරි වැටුප් වර්ධක දිනය වන්නේ කුමක් ද?

උසස්වීම ක්‍රියාත්මක වන දිනය

12. වැටුප් වර්ධක වාසි ( Incrimental Credit) යනු මොනවාද?

රජය යටතේ ස්ථිර හෝ තාවකාලික පදනමක් යටතේ කලින් සේවය කර ඇති නිලධරයකු රජය යටතේ ම අලුත් තනතුරකට පත් වූ විට තම පූර්ව සේවය වෙනුවෙන් ඔහුට ලබා දෙන වැටුප් වර්ධක වාසි වේ.

13. වැටුප් වර්ධකය අර්ථ දක්වන්න.

රාජ්‍ය නිලධරයකුට සාමාන්‍යයෙන් වර්ෂයකට වරක් වැටුපට සිදුවන වැඩිවීම වැටුප් වර්ධකය ලෙස හැඳින්වේ. වැටුප් වර්ධකය යනු ආයතන සංග්‍රහයෙහි අර්ථ දක්වා ඇති ආකාරය විභාගාදියෙහිදී එවැනි ප්‍රශ්නකදී පිළිතුර ලෙස අපේක්ෂා කෙරේ. ඒ අනුව වැටුප් වර්ධකය යනු, නිලධරයකුට වැටුප් වර්ධකයක් අයිතිවාසිකමක් වශයෙන් ලබාගැනීමට හිමිකමක් නැත. සිය රාජකාරි කාර්යක්ෂමවත් අනලස්වත් ඉටු කිරීමෙන් හා වැටුප් වර්ධක කාල පරිච්ඡේදය තුළ මුළුමනින් ම සේවය කිරීමෙන් ඔහු එම වැටුප් වර්ධක උපයාගත යුතු ය.

14. වැටුප් වර්ධක අනුමත කරන බලධාරියා හා ප්‍රතික්ෂේප කරන බලධාරියා හඳුන්වන්න.

වැටුප් වර්ධක ප්‍රදානය කිරීමේ නිසි බලධරයන් පහත දැක්වෙන පරිදි ය.

(අ) යම් අමාත්‍යාංශයක සේවය කරන සියලු ම රාජ්‍ය නිලධරයන් සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ බලය පවරන ලද නිලධාරියා

(ආ) පළාත් සභාවක සේවය සඳහා මුදාහරින ලද සියලු ම රාජ්‍ය නිලධරයන් සඳහා පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා හෝ බලය පවරන ලද නිලධාරියා

(ඇ) රාජ්‍ය සංස්ථාවක්, මණ්ඩලයක් ආදියෙහි සේවය සඳහා ද්විතීයන කරන ලද සියලු ම රාජ්‍ය නිලධරයන් සඳහා අදාළ රාජ්‍ය සංස්ථාව, මණ්ඩලය ආදිය අයත්වන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ බලය පවරන ලද නිලධාරියා

(ඈ) යම් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරන සියලු ම රාජ්‍ය නිලධරයන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරන ලද නිලධරයා

(ඉ) දෙපාර්තමේන්තු ප්‍රධානියා සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම් වැටුප් වර්ධකයන් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම සඳහා නිසි බලධරයන් පහත සඳහන් පරිදි වේ.

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය යන යම් සේවයක නිලධරයකු සඳහා රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්

(ආ) අනෙකුත් දීපව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධරයන් සඳහා අදාළ සේවය භාර අමාත්‍යාංශයේ ලේකම් (උදා; ශ්‍රී ලංකා වෛද්‍ය සේවය - සෞඛ්‍ය විෂය භාර ලේකම්)

(ඇ) මාණ්ඩලික ශ්‍රේණියේ වෙනත් රාජ්‍ය නිලධරයකු සඳහා අදාළ අමාත්‍යාංශයේ ලේකම්

(ඈ) දෙපාර්තමේන්තුවක සේවය කරන අනෙකුත් සියලු ම රාජ්‍ය නිලධරයන් සඳහා අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා

(ඉ) අමාත්‍යාංශයක සේවය කරන අනෙකුත් සියලු ම රාජ්‍ය නිලධරයන් සඳහා අමාත්‍යාංශයේ ලේකම්

15. වැටුප් වර්ධක ප්‍රතික්ෂේප කරන ක්‍රම කීය ද? ඒ මොනවා ද?

ක්‍රම 04කි.

1. වැටුප් වර්ධකය තාවකාලික ව අත්හිටුවීම
2. වැටුප් වර්ධකය නතර කිරීම
3. වැටුප් වර්ධකය අඩු කිරීම
4. වැටුප් වර්ධකය විලම්භනය කිරීම

16. රජයේ නිලධරයකු වැඩ තහනම් කළ විටක වැටුප් ගෙවීම (Salary on ¸nterdiction) හා සම්බන්ධ විධිවිධාන කෙටියෙන් පහදන්න.

- මෙවැනි අවස්ථාවක ගෙවිය යුතු වැටුප සම්බන්ධයෙන් ii කාණ්ඩයේ xlviii වැනි පරිච්ඡේදයේ 31:11 දක්වා වගන්ති අදාළ වේ.
- යම් නිලධරයකු පිළිබඳ විශේෂ කරුණු ගැන සලකා බලා පඩිනඩිවලින් භාගයකට වඩා වැඩි අනුපාතයක් ඔහුට ගෙවන ලෙස නියෝග කිරීමට විනය බලධරයාට පුළුවනි.
- වැඩ තහනම් කරනු ලැබ ඇති නිලධරයකුට විරුද්ධ ව නගා ඇති චෝදනාවලට වගඋත්තර සැපයීම සඳහා ඉඩදී ඇති කාලය තුළදී එම වගඋත්තර සැපයීමට ඔහු අපොහොසත් වුවහොත් හෝ සෑහෙන හේතුවක් නොමැති ව නියමිත දිනයේදී පරීක්ෂණය සඳහා පෙනී සිටීමට ඔහු අපොහොසත් වුවහොත් හෝ ඉහත උප වගන්ති යටතේ ඔහුට අනුමත කර ඇති පඩිනඩි ප්‍රමාණය ගෙවීම, ඔහු එකී චෝදනාවලට වගඋත්තර සපයන තෙක් හෝ පරීක්ෂණයට පෙනී සිටින තෙක් හෝ නැවැත්වීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා ක්‍රියා කළ යුතු ය.
- වැඩ තහනම් කරනු ලැබූ නිලධරයකුට විරුද්ධ ව කෙරෙන පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහු සේවයෙන් පහකරනු ලැබුවහොත් නොගෙවා අත්හිටුවන ලද කිසිදු පඩිනඩියක් ඔහුට නොගෙවිය යුතු ය.
- පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් නියම කරන දඬුවම සේවයෙන් පහකිරීමට වඩා අඩු තත්ත්වයේ දඬුවමක් නම්, නොගෙවන ලද පඩිනඩි ප්‍රමාණය හෝ ඉන් කොටසක් හෝ ගෙවීම ගැන දඬුවම නියෝග කරන විනය බලධරයා විසින් තීරණය කොට එම තීරණය ද එම නියෝගයෙහි සඳහන් කළ යුතු ය.
- නිලධරයාට විරුද්ධ ව නගා ඇති චෝදනාවලින් එම නිලධරයා නිර්දෝෂී බව පරීක්ෂණයේදී තීරණය වුවහොත් නොගෙවා රඳවා ගන්නා ලද පඩිනඩි ඔහුට ගෙවිය යුතු ය.

# යොවුන් ක්‍රීඩා ශූරයෝ

අනිල් වීරසිංහ

නොබෝද (අප්‍රේල් 15 සිට 18 දක්වා) සෞදි අරාබියේදී අවසන් වූ 2025 ආසියානු වයස 18න් පහළ මලල ක්‍රීඩා ශූරතා තරගාවලියේදී ශ්‍රී ලංකාව රන් පදක්කමක්, රිදී පදක්කම් 3ක්, ලෝකඩ පදක්කම් 4ක් සමගින් සමස්ත පදක්කම් 8ක් දිනාගැනීමට සමත් වුණා. මේ අනුව පදක්කම් දිනූ රටවල් අතරින් ශ්‍රී ලංකාවට හිමි වූයේ 09 වැනි ස්ථානය. මෙය ආසියානු යොවුන් ශූරතා තරගාවලි ඉතිහාසයේ ශ්‍රී ලංකාව වැඩි ම පදක්කම් ගණනක් ජයගත් අවස්ථාව ලෙස ද හඳුන්වන්නට පුළුවන්. ශ්‍රී ලංකාව මෙහි 09 වැනි ස්ථානය දිනා ගන්නා විට ප්‍රබල ඉන්දියාවට අත්වුණේ 08 වැනි ස්ථානය. මීට පෙර 2015 ආසියානු යොවුන් ශූරතා තරගාවලියේදී ශ්‍රී ලංකාව රන් පදක්කමක් හා රිදී පදක්කම් තුනක් සමග පදක්කම් හතරක් දිනා තිබූ අතර 2022 තරගාවලියේදී රිදී පදක්කම් තුනක් හා ලෝකඩ පදක්කම් දෙකක් සමග පදක්කම් පහක් ජයගෙන තිබුණා.

> 17 හැවිරිදි තරුණි අභිෂේකා මලල ක්‍රීඩාවට දැක්වූ දස්කම් හේතුවෙන් දඹුල්ල ජාතික පාසලේ සිට ගම්පොල වික්‍රමබාහු ජාතික පාසලට ඇතුළත්වීමට අවස්ථාව උදාකර ගත්තා. මීටර් 800 ඉසව්වට අමතර ව මීටර් 400 හා 1500 ඉසව් ද නියෝජනය කරන ඇය 2024 වසරේ කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේ පැවති සමස්ත ලංකා පාසල් මලල ක්‍රීඩා තරගාවලියේ කාන්තා මීටර 1500 ඉසව්ව වෙනුවෙන් විශේෂ වාර්තාවක් පිහිටුවමින් දස්කම් දැක්වූයේ මෙරට සිටි තවත් දක්ෂතම ක්‍රීඩිකාවක වූ ධම්මිකා මැණිකේ 1985 වසරේ පිහිටුවා තිබූ වසර 39ක් පැරණි වාර්තාවක් යළි අලුත් කරමින්




මුලදී ආසියාතික යොවුන් මලල ක්‍රීඩා තරගාවලිය ලෙස හැඳින්වූ මේ තරගාවලිය වර්තමානයේ ආසියා වයස 18න් පහළ මලල ක්‍රීඩා ශූරතාව ලෙස හැඳින්වෙන අතර මෙහි ආරම්භය 2015 වසර දක්වා දිව යනවා. මෙහි මුල් ම තරගාවලිය පැවැත්වූයේ කටාර්හිදී. වසර දෙකකට වරක් පැවැත්වෙන මෙය මීට පෙර පැවැත්වුණේ 2015, 2017, 2019, 2022 හා 2023 වසරවල. වැඩි ම අවස්ථා ගණනක් චීන ආධිපත්‍යයට යටවී ඇති තරගාවලියක් ලෙස හැඳින්විය හැකි මෙය

තරගාවලියේ පළමු ස්ථානය අවස්ථා පහකදී ම ජයගැනීමට චීනය සමත් වී ඇති අතර 2022 තරගාවලිය පමණක් ඉන්දියාව මුල් ස්ථානය දිනා ඇත්තේ එවර චීනය සහභාගි නොවීම හේතුවෙන්.

හය වැනි වරට පැවැත් වූ මෙවර තරගාවලියේ ශ්‍රී ලංකාව වෙනුවෙන් රන් පදක්කම දිනා ගැනීමට සමත් වූයේ මීටර 800 බාලිකා ඉසව්වට සහභාගි වූ තරුෂි අභිෂේකා. ඇය මේ ජයග්‍රහණය අත්කර ගත්තේ ප්‍රබල චීන ක්‍රීඩිකා මෙයිලින්යි දෙවැනි ස්ථානයට ඇද දමමින් වීම අමතක කළ නොහැක්කක්. කාන්තා මෙඩ්ලි සහාය දිවීමේ ඉසව්වට සහභාගි වී ධනංජනා ප්‍රනාන්දු, තරුෂි අභිෂේකා,



තරුෂි අභිෂේකා

හිමාෂනී සංසලා සහ දිල්කි නිහාරා මෙහි රිදී පදක්කම ශ්‍රී ලංකාවට දිනා දීමට සමත් වීම ද කැපී පෙනෙනවා. එහි රන් පදක්කම දිනා ගත්තේ චීනය. දිල්කි නිහාරා බාලිකා තුන් පිම්ම ඉසව්වට සහභාගි වී එහි ලෝකඩ පදක්කම දිනා ගැනීමට සමත් වූ අතර ධනංජනා ප්‍රනාන්දු කාන්තා මීටර් 100, ජනිත් ලක්ෂාන් තුන්පිම්ම පිරිමි රිදී පදක්කම් ජයගත් සෙසු ක්‍රීඩක ක්‍රීඩිකාවන් වුණා. මීටර් 1,500 බාලක ඉසව්වට සහභාගි වූ ළහිරු අචින්ත, මීටර් 800 බාලක ඉසව්ව සඳහා සහභාගි වූ සවිඳු අවිශ්ක, උස පැනීම පිරිමි ඉසව්ව සඳහා පවන් නිත්‍ය ලෝකඩ පදක්කම්ලාභී සෙසු ක්‍රීඩකයන්.

තරුෂි අභිෂේකා දිනූ රන් පදක්කම මේ තරගමාලා ඉතිහාසයේ ශ්‍රී ලංකාව දිනූ දෙවැනි රන් පදක්කම වනවා. මීට පෙර 2015 කාන්තා මීටර් 400 බාධක දිවීමේ ඉසව්වෙන් යමානි දුලාංජලී රන් පදක්කමක් දිනා ගැනීමට සමත් වුණා.

17 හැවිරිදි තරුෂි අභිෂේකා මලල ක්‍රීඩාවට දැක්වූ දස්කම් හේතුවෙන් දඹුල්ල ජාතික පාසලේ සිට ගම්පොල වික්‍රමබාහු ජාතික පාසලට ඇතුළත්වීමට අවස්ථාව උදාකර ගත්තා. මීටර් 800 ඉසව්වට අමතර ව මීටර් 400 හා 1500 ඉසව් ද නියෝජනය කරන ඇය 2024 වසරේ කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේ පැවති සමස්ත ලංකා පාසල් මලල ක්‍රීඩා තරගාවලියේ කාන්තා මීටර 1500 ඉසව්ව වෙනුවෙන් විශේෂ වාර්තාවක් පිහිටුවමින් දස්කම් දැක්වූයේ මෙරට සිටි තවත් දක්ෂතම ක්‍රීඩිකාවක වූ ධම්මිකා මැණිකේ 1985 වසරේ පිහිටුවා තිබූ වසර 39ක් පැරණි වාර්තාවක් යළි අලුත් කරමින්.

තමාගේ ඉදිරි බලාපොරොත්තුව එළඹෙන ආසියා යොවුන් මලල ක්‍රීඩා තරගාවලියේදී රන් පදක්කමක් දිනා ගැනීම බව තරුෂි මාධ්‍යයට පවසා තිබුණා. තරගාවලි ඉතිහාසයේ ශ්‍රී ලංකාව වැඩි ම පදක්කම් ගණනක් ජයගත් මේ අවස්ථාව ගැන අදහස් දක්වන මලල ක්‍රීඩා සංගමයේ ලේකම් සමන් කුමාර ගුණවර්ධන; "2015 වසරේ ආරම්භ වන ආසියානු යොවුන් මලල ක්‍රීඩා උළෙලේ ශ්‍රී ලංකාව වැඩි ම පදක්කම් සංඛ්‍යාවක් දිනාගත් අවස්ථාව ලෙස මෙවර තරගාවලිය නම් කරන්නට පුළුවන්, අවුරුදු 10කට පසු මෙවර අපේ ක්‍රීඩිකාවක් රන් පදක්කමක් ජයග්‍රහණය කළා. සම්පූර්ණ පදක්කම් සංඛ්‍යාවේ එකතුව ගත් විට අප සිටින්නේ සිව්වැනි ස්ථානයේ. එනම් පදක්කම් සටහනේ දෙවැනි ස්ථානයේ සිටින ජපානයටත් වඩා ඉදිරියෙන්, ඔවුන් රන් පදක්කම් තුනක් ජයගෙන සවුදි අරාබිය සමග වැඩි ම රන් පදක්කම් ජයගත් දෙවැනි රට බවට පත් වුණත් දිනාගෙන ඇති සම්පූර්ණ පදක්කම් ගණන හතයි. ස්ථාන තෝරන විට රන් පදක්කම් සංඛ්‍යාවට මූලිකත්වය ලැබීම නිසයි ඔවුන් දෙවැනි ස්ථානයට පත්වුණේ. සම්පූර්ණ පදක්කම් සංඛ්‍යාව ගත්විට චීනය පදක්කම් 36 (රන් 19, රිදී 12, ලෝකඩ 05)ක්, උස්බෙකිස්තානය පදක්කම් 12 (රන් 03, රිදී 05, ලෝකඩ 04)ක්, ඉන්දියාව පදක්කම් 11 (රන් 01, රිදී 05, ලෝකඩ 05)ක්, ශ්‍රී ලංකාව පදක්කම් 08 (රන් 01, රිදී 03, ලෝකඩ 04)ක් දිනා ගත්තා."

අවුරුදු 10කට පසු මෙවර අපේ ක්‍රීඩිකාවක් රන් පදක්කමක් ජයග්‍රහණය කළා. සම්පූර්ණ පදක්කම් සංඛ්‍යාවේ එකතුව ගත් විට අප සිටින්නේ සිව්වැනි ස්ථානයේ. එනම් පදක්කම් සටහනේ දෙවැනි ස්ථානයේ සිටින ජපානයටත් වඩා ඉදිරියෙන්, ඔවුන් රන් පදක්කම් තුනක් ජයගෙන සවුදි අරාබිය සමග වැඩි ම රන් පදක්කම් ජයගත් දෙවැනි රට බවට පත් වුණත් දිනාගෙන ඇති සම්පූර්ණ පදක්කම් ගණන හතයි. ස්ථාන තෝරන විට රන් පදක්කම් සංඛ්‍යාවට මූලිකත්වය ලැබීම නිසයි ඔවුන් දෙවැනි ස්ථානයට පත්වුණේ.

ඔහු පවසන ආකාරයට තරගාවලිය පැවති සවුදි අරාබියේ කාලගුණික තත්ත්වය, අධික දූවිලි ස්වභාවය, සුළං තත්ත්වය, අධික උෂ්ණත්වය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අභියෝගයක් වී තිබෙනවා. මීට පෙර ආසියාතික මට්ටමේ තරගාවලියක් එම රටේ පැවත් වී නොතිබීම නිසා තාක්ෂණික වශයෙන් සිදුවූ නොයෙකුත් අඩු පාඩු මධ්‍යයේයි ඔවුන්ට තරග වදින්නට සිදු ව තිබුණේ.

මේ තරගාවලියෙන් අනතුරු ව ආසියාතික මලල ක්‍රීඩා ශූරතාව මැයි මාසයේ කොරියාවේදී, ආසියාතික ක්‍රීඩා උළෙල 2026 වසරේ ජපානයේදී, දකුණු ආසියාතික ක්‍රීඩා උළෙල 2026 වසරේ පාකිස්තානයේදී පැවැත්වෙනු ඇති. මේ තරගමාලා සඳහා ද ශ්‍රී ලංකාව සහභාගි වීමට නියමිත අතර මේ වනවිට ක්‍රීඩක ක්‍රීඩිකාවන් 65 දෙනකුගෙන් සමන්විත සංචිත දෙකක් නම් කර අවසන්.







# සිරි දළදා වන්දනාවට ජන ගඟ ගැලූ වගයි....

2025 අප්‍රේල් 18-27
ඓතිහාසික ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රය










**දෙසතිය** පුවත් සඟරාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්

www.dgi.gov.lk www.news.lk

පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

**Rs. 100/-**